# ඇස

දෙස නගන ඇස

සරලා
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන
92, විජේරාම පාර, උඩහමුල්ල, නුගේගොඩ.
076 365 0891

වෂී 2022ක් වූ ඔක්තෝබර් මස 09 වැනිදා ඉරිදා | 01 කාණ්ඩය | 01 වෙළුම | මිළ රු. 100 යි





## මේ රට ගොඩගැනීමට හැකි දර්ශනය සහ සැලැස්ම අපේ පක්ෂයට තිබෙනවා



03 පිටුවට

# මහජන පක්ෂයෙන් ඓතිහාසික තීන්දුවක්!

පවතින දේශපාලන ගැටලු මෙන්ම පක්ෂයේ ඉදිරි තීරණාත්මක පියවර සලකා බැලීමෙන් පසු ඉදිරි මැතිවරණවලදී තනි පක්ෂයක් ලෙස වෙන්ව තරග කිරීමට ශ්‍රී ලංකා මහජන පක්ෂය තීරණය කර ඇත. පක්ෂයේ ප්‍රධාන ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී අසංක නවරත්න මැතිතුමන් සමඟ පැවැති සාකච්ඡාවක දී ඔහු සඳහන් කළේ තවදුරටත් දේශපාලනික රැවටීම් සහ කඩාවැටීම්වලට යට නොවී තනි පක්ෂ යක්, තනි බලයක් යන අරමුණින් යුතුව ඉදිරි මැතිවරණවලදී කටයුතු කිරීමට පක්ෂයේ නායකත්වය විධායක සභාව සමඟ එක්ව තීරණය කර ඇති බවය.

ඒ අනුව ඉදිරියේ දී පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණයේ දී රට පුරා සියලුම පළාත් පාලන ආයතන වෙනුවෙන් ශ්‍රී ලංකා මහජන පක්ෂය "ඇස" ලකුණින් තරග කරනු ඇත. එසේම මේ වනවිටත් පක්ෂයේ ක්‍රියාකාරීන් ඒ සම්බන්ධයෙන් දැනුවත් කරමින් පවතින බවත්, තීරණය සම්බන්ධයෙන් ඉතා ධනාත්මක ප්‍රතිචාර ලැබෙමින් පවතින බවත් ශ්‍රී ලංකා මහජන පක්ෂයේ ප්‍රධාන ලේකම්තුමන් වැඩි දුරටත් සඳහන් කරයි.

ශ්‍රී ලංකා මහජන පක්ෂය තනි පක්ෂයක් ලෙස ජාතික මට්ටමින් මැතිවරණයකට අවසාන වරට ඉදිරිපත් වූයේ 1991 පළාත් පාලන මැතිවරණය වෙනුවෙන්ය. 1994 සිට 2020 මහ මැතිවරණය දක්වාම මහජන පක්ෂය විවිධ සන්ධාන සමඟින් එක්ව මැතිවරණ සඳහා තරග වැදුණි. එවැනි සන්ධානගතවීම්වල ප්‍රතිඵලයන් ලෙස පක්ෂයට සහ පාක්ෂිකයන්ට සිදු වූ හානි සහ අසාධාරණකම් සලකා බලමින් මෙකී ඓතිහාසික තීන්දුවට එළඹී බව පක්ෂයේ අභ්‍යන්තර වාර්තා හෙළිදරව් කරයි.

## විජයගේ දර්ශනය ජනතාව අතරට ගෙන යන්න




06 පිටුවට

## ශ්‍රී ලංකා මහජන පක්ෂයේ සදා අමරණීය නායකයෝ











## මට හමු වූ පාරිශුද්ධම දේශපාලනඥයා විජයයි



10 පිටුවට

## විජය නව පරපුරට ආමන්ත්‍රණය කළ නායකයෙක්



06 පිටුවට

# විජය 77 වෙනි ජන්ම දිනය අදයි

ශ්‍රී ලාංකේය සිනමාවේ ධවල අරවින්ද පුෂ්පය ලෙස ප්‍රේක්ෂකාභිමානයට පත්වූ සහ ජනතාවාදී දේශපාලන ගමන් මගකට නවමු ප්‍රවේශයක් ලබාදෙමින් ශ්‍රී ලංකා මහජන පක්ෂය පිහිටුවීමේ නියමුවාණන් වූ විජය කුමාරතුංග ශ්‍රීමතාණන්ගේ 77 වෙනි ජන්ම දිනය අද (ඔක් 09) දිනට යෙදී තිබේ.

1945 වර්ෂයේ උපත ලද විජය, කුඩා කළ සිටම අනෙකුත් සමකාලීන දරුවන්ට වඩා වෙනස් චරිතයක් විය. වැඩිහිටියන්ට සැලකීම, සමාජයේ අන්‍යයන්ට සමානව සැලකීම, අයුක්තිය, අසාධාරණය හමුවේ පෙනී සිටීම කැපී පෙනුනි.

කොටහේනේ ශාන්ත බෙනඩික්ට් විදුහලට ඇතුළත්වූ විජය දක්ෂ කථිකයෙකු, ගායකයකු ලෙස අනිත් අය ඉක්මවා යන දක්ෂතාවන්ගෙන් සමන්විත විය. සුගතපාල සෙනරත් යාපා අධ්‍යක්ෂණය කළ "හන්තානේ කතාව" චිත්‍රපටයෙන් සිංහල සිනමාවට අවතීර්ණ වන විජය කුමාරතුංග සිය පෙරලිකාර නළු ජීවිතය එතැනින් ආරම්භ කළේය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කෙරෙහි ඇතිවූ කලකිරීමත් එවකට බලයේ සිටි එක්සත් ජාතික පක්ෂයේ පාලනය තුළින් ජනතාව පීඩාවට පත්වීමත් දරාගත නොහැකි වූ තැන 1984 ජනවාරි මස 22 දින "ඇස" ලකුණින් දම් පැහැති වර්ණයෙන් පුන්කළස, වී කරල් දෙක මැද ශ්‍රී ලංකා සිතියම මධ්‍යයේ දැල්වෙන පහනක ලාංඡනය සහිතව ශ්‍රී ලංකා මහජන පක්ෂය බිහිවේ.

සම්මානනීය නළුවකු, ගායකයකු සේම ජනතාවාදී දේශපාලනඥයකු වූ විජය කුමාරතුංගයන් ම්ලේච්ඡ වෙඩික්කරුවකුගේ ඉලක්කයක් බවට පත්ව දැයට අහිමි වුවද ඔහුගේ නම සදාකාලික වනු ඇත.

**ආනන්ද ජයසිංහ**

**විජය කුමාරතුංග ජන්ම දින සැමරුම එතුමන් ඝාතනය කළ පොල්හේන්ගොඩ නිවස අසලදී ඔක්තෝබර් මස 09 දින පෙ.ව. 9.30ට පැවැත්වේ. රටපුරා සැමරුම් සතියක් මහජන පක්ෂයේ සංවිධායකත්වයෙන්.**

## මානව දයාවේ පණිවිඩය ජනතාව අතරට ගෙන යාමට හැකි වේවා



09 පිටුවට

## ප්‍රශස්ත රටක් ගැන සිහින දුටු විජය



07 පිටුවට

## ආර්ථික අර්බුදයට විසඳුම IMF නොවෙයි



04 පිටුවට

## සුසාගේ තෙවන ඇස




## ප්‍රජාතන්ත්‍රවාදී බලවේග රට වෙනුවෙන් එක්විය යුතු මොහොතක්



06 පිටුවට

## දුෂ්කර මොහොතක විශාල වගකීමක්



06 පිටුවට

## අර්බුදයෙන් රට ගොඩගන්න මහජන පක්ෂයට පුළුවන්



07 පිටුවට

ඇස

අංක 25, ලින්ක්වුඩ් පෙදෙස, වැහැර, කුරුණෑගල
දුරකථන/ෆැක්ස් - 037 222 9993
ඊ මේල් - esaslmp@gmail.com

**කතෘ මණ්ඩලය**
නිහාල් අකුරුගොඩ
නිමල් ෆ්‍රැන්සිස්
ජනරංග විජඉඳු දේවසුරේන්ද්‍ර
ආනන්ද ජයසිංහ

**යතුරු ලියන සහය**
ජීවන්ත දිසානායක
නිමේෂ් මාධව ජයතිලක
දුෂ්‍යන්ත පතිරණ
අරවින්ද කුමාර
සඳුනි රාජපක්ෂ

**බෙදාහැරීම** - දුෂාන්ත අලහකෝන් - 0772091926

## කතුවැකිය

# දෙස නගන ඇස

ඇස යනු එක් පැත්තකින් මානවයා ඇතුළු සත්ව ප්‍රජාවගේ ශරීරයේ ඇති ඉතාම වැදගත් අංගයක් ලෙස සැලකිය හැකිය. අනෙක් පැත්තෙන් එකී ජීවියා සහ පරිසරය හෝ තමා වටා ඇති ලෝකය සමග ප්‍රබලතම බැඳීම ගොඩනගන්නේ ඇස ය. ඒ නිසා ඇස ජීවියෙක්ගේ පැවැත්ම සඳහා බලපාන තීරණාත්මකම අවයවය ලෙස ජීව විද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක අර්ථයෙන් හැඳින්වූවාට වරදක් නැත. මානවයාගේ අංශයෙන් මෙකී කාරණය විමර්ශනය කරද්දී පෙනීයන්නේ මිනිසාගේ ඇස යනු මිනිසාට හුදෙක් අවට ලෝකය පිළිබඳ පෙනීම ලබාදෙන අවයවය පමණක් නොව 'මිනිසාගේ දැක්ම' වෙනුවෙන්, මිනිසාගේ දර්ශනය සම්බන්ධයෙන් ප්‍රබලතම සන්නිවේදනය සිදුකරන මාධ්‍ය ලෙස සැලකිය හැකි බවය. ඒ නිසා ඇස් යනු මිනිසාට ලොව දකින්නට සහ ලොව නගන්නට ඇති හොඳම අවිය බව සැකයක් නැත.

ශ්‍රී ලංකා මහජන පක්ෂය 'ඇස' පුවත්පත අරඹන්නේ ස්වකීය දේශපාලනික ගමනේ ඉතාම තීරණාත්මක අවධියක්වූ පක්ෂයේ පැටි අවධියේ දී ය. විශේෂයෙන්ම ලංකාවේ පත්තර කලාව ඉතා උන්නතිකාමී හැරවුම් ලක්ෂයකට හේතු සාධකවූ හැත්තෑව-අසූව දශකයන්හි, මෙරට පත්තකලාවේ පතාක යෝධයන් බිහිවෙන වටපිටාවක මහජන පක්ෂය ඇස පුවත්පත දේශයට දායාද කරනු ලබන්නේ දේශයට නව ඇසක් ලබාදීමේ අරමුණින් ය. සාම්ප්‍රදායික දේශපාලනය විසින් ලංකාවේ ප්‍රගතිශීලී ගමන්මග එකතැන පල්වෙන තැනකට ඇද දමා තිබිය දී, ඊනියා වාමාංශිකයන් විසින් වාමවාදී දේශපාලනයේ හරසම්පන්න ලක්ෂණයන් අඳුරට දමා තිබිය දී නිවැරැදි දිශාව දකින්නට, නිවැරැදි දැක්මකින් කටයුතු කරන්නට මෙරට සුවහසක් ජනතාවට 'ඇසක' අවශ්‍යතාව සැබෑ ලෙසම දැනෙමින් තිබුණු අවධියක් විය.

ඒ අවධියේ පැවති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඉතා මර්ධනකාරී ආකාරයට මෙරට දේශපාලන ව්‍යාපාර අකර්මණ්‍ය කරමින් සිටිය දී, මෙරට මැතිවරණ සිතියම හකුලවමින් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් මහ දවල් අමු අමුවේ උල්ලංඝනය කරන වටපිටාවක මෙරට ජනතාවට 'නව ඇසක්' ලබාදීමට එදා විජය කුමාරතුංග මැතිතුමන් ප්‍රමුඛ ශ්‍රී ලංකා මහජන පක්ෂය කටයුතු කරනු ලැබීය. නව වමක් උදෙසා ප්‍රතිපත්තිගරුක දේශපාලනයක නිරත වෙමින් එකී උත්තුංග දේශපාලනයෙන් ශ්‍රී ලංකාවේ අභිවෘද්ධිය මෙන්ම එවකට දලුලා වැඩෙමින් තිබූ ගැටලු ගණනාවක් උදෙසා වන පොහොසත් වැඩ පිළිවෙළ ජනතාව අතරට ගෙනයාම 'ඇසෙහි' මෙහෙවර විය. එකී අරමුණ යථාර්ථයක් කරගැනීම වෙනුවෙන් කලක් ඇස පුවත්පත ඉතා කටුක ගමනක නිරත වූ බව මෙරට පුවත්පත් කලාව සහ දේශපාලනය ගැන අවබෝධයක් ඇති සෑම දෙනෙක්ම පාහේ දන්නා කරුණකි.

වසර 38කට ආසන්න එකී ඉතිහාසයත්, වර්තමානයේ මේ ලියන මොහොතත් අතර ඇති අපූරු සබඳතාව මේ මොහොතේ සිහිපත් කළ යුතුය. එදා මෙන්ම අද ඇත්තේත් මෙරට දේශපාලනයේ අඳුරකි. රට මුහුණ දෙමින් තිබෙන බරපතල ගැටලුකාරී තත්වයන්ට පිළිතුරු නොමැතිව රටේ පාලන තන්ත්‍රය ගොළුවී, ගල්ගැසී සිටින මොහොතක, මෙරට දේශපාලනයේ පුරෝගාමීන් විය යුතු පාර්ශ්වයන් නිද්‍රාශීලීව කල්මරණ මොහොතක නැවතත් දේශයට 'ඇස පෑදීමේ' මහඟු කර්තව්‍යයට නායකත්වය දීමට ශ්‍රී ලංකා මහජන පක්ෂයට සිදුවී ඇත. එකී කර්තව්‍යයේ සැලකිය යුතු කොටසක් සිදුකිරීමට දැනටමත් රටපුරා කටයුතු සිදුවෙමින් පවතී, එසේම මහජන පක්ෂයේ නායකත්වය සහ ප්‍රගතිශීලී ජනතාව නැවත වතාවක් 'නිවැරැදි දිශාව හඳුනාගත් සැබෑ වාමාංශික දේශපාලනයක්' පිළිබඳ අවංක බලාපොරොත්තුවකින් මහජන පක්ෂය සමග එක්වෙමින් සිටිනු දැකිය හැකිය.

එදා විජය කුමාරතුංග මැතිතුමන් ඇතුළු මහජන පක්ෂයේ නායකයන් විශාල පිරිසක් ජීවිත කැපකිරීමෙන්, තවත් පිරිසක් තම ජීවිතයේ වටිනාම කාලය ලෙයින් කඳුලින් කැපකරමින් අපේක්ෂා කළ උතුම් අරමුණ සහ දර්ශනය සැබෑ ලෙසින්ම අද ලංකාවට අවශ්‍ය කරන දේශපාලන වැඩපිළිවෙළ බවට සැකයකින් තොරවම අවබෝධ කරගත හැකිය. ඒ නිසා නැවත නැගී සිටින මහජන පක්ෂයක් සමගින්ම එකී දර්ශනය නැවත ජනගත කරන 'ඇසක' අවශ්‍යතාව නැවත පැනනැඟී ඇති මොහොතක 'ඇස' පුවත්පත ජනතාව අතරට එන්නේ 'දෙස නගන ඇස' යන ඉලක්කය සහිතව ය. සැබෑ ලෙසම එය එක් අතකින් දේශය නංවාලන දර්ශනයක් අවශ්‍ය මොහොතක ඒ සඳහා මෙරට ප්‍රගතිශීලී ජනතාව අභිප්‍රේරණයට කරන සොඳුරු සන්නිවේදන සටන් සගයෙක් බවට පත්වනු ඇත. විජය ගුණ සැමරෙන මොහොතේ නැවතත් එළිදකින 'ඇස' සමස්ත දේශයටම 'ඇසක්' වනු ඇති බව අපේ විශ්වාසයයි.

ඒ නිසා පෙරට එන ජනබලය උදෙසා නිවැරැදි දිශාන්තිය පෙන්වන්නට ඕනෑම දුෂ්කර ගමනක් වෙත පය තබන්නට 'ඇස' අපි සූදානමින් සිටින බව මෙහි ලියා තැබිය යුතුමය. අතීතයේ අවිචාර සමයන්හි පවා ඉතා නිර්භයව පෑනේ සැබෑ හඬ අවදි කළ 'ඇස' පුවත්පතේ අතීත නියමුවන්ට මේ මොහොතේ අපගේ ආදරණීය ගෞරවය හිමිවිය යුතුය. ඔවුන් එදා දේශයට ඇස පෑ ආකාරයෙන්ම, ඉදිරියටත් එකී මෙහෙවර සිදුකරන බවට පොරොන්දුවීමට කැමැත්තෙමු. අප සැම ඉදිරියේ ඇති පොදු අභියෝගයන්ට මුහුණ දෙමින් මෙරට දේශපාලනයේ ක්‍රමවේදාත්මක වෙනසක් උදෙසා වන ධනාත්මක ප්‍රවේශයට 'ඇස' හදවතින්ම එක්වන බව 'ඇස' නැවත උපදින' මේ මොහොතේ ඔබ වෙත ඉතාම මිත්‍රශීලීව සඳහන් කළ යුතුය.

# විජය ජීවතුන් අතර සිටියා නම්

## මේ රටේ ජනාධිපති වෙනවා



ආචාර්ය දයාන් ජයතිලක

**විජය කුමාරතුංග අමරණීය මතක සටහන්**

විජය කුමාරතුංග සහෝදරයාව මා හඳුනන්නේ 1984 ශ්‍රී ලංකා මහජන පක්ෂය ඇරඹෙන්න බොහොම කාලයකට පෙරාතුවයි. ඒ කාලයේ අපි ගොඩ නගාගෙන තිබුණු ජාතිවාදයට එරෙහි සිවිල් සංවිධානයක කටයුතුවලදී ඔහු මාත් සමඟ බොහොම හිතවත් වුණා. මට මතකයි, හැත්තෑ ගණන්වල අග භාගයේ බොහොම රැඩිකල් මතවාදයක් දරපු තිස්ස බාලසූරිය පියතුමන් සංවිධානය කරපු ජාතිවාදයට එරෙහි රැස්වීමක ප්‍රධාන කථිකයා වුණේ විජය. එදා ඒ වැඩසටහන අවසන් වෙලා නැවත කොළඹ බලා එන ගමනට විජය මටත් ඔහු එක්ක එන්න කියලා ආරාධනා කළා. එදා අපි දෙන්නා බොහෝ වේලාවක් ලංකාවේ දේශපාලනය ඇතුළු විවිධ මාතෘකා ගැන කතා කළා. අන්න ඒ වගේ සිදුවීම්වලින් විජය සහ මා අතර ඉතා සමීප සබඳතාවක් නිර්මාණය වුණා.

ඒ නිසාම 1984 දී මහජන පක්ෂය ඇරඹීමෙන් පසුව මා එකල 'ද ගාර්ඩියන්' සඟරාවට මහජන පක්ෂයේ බිහිවීම සම්බන්ධයෙන් ලිපි ගණනාවක්ම පළ කරනු ලැබුවා. ඉන් එකක ශීර්ෂ පාඨය වුණේ ඒ Star is born (තාරකාවක් බිහිවුණා) යන්නයි. ඒ මොකද මම එදා ඒ ආරම්භය දැක්කේ ලංකාවේ දේශපාලනයේ ඉතා තීරණාත්මක වෙනසක් විධියට. මොකද විජය එදා තමන්ගේ දේශපාලන ප්‍රතිපත්ති එක්ක ආරම්භ කරපු නව මග මා දුටුවේ ලංකාවේ දේශපාලනයට නව හුස්මක් එක් කරන ප්‍රවේශයක් ලෙසටයි. විජය ආරම්භ කළ මහජන පක්ෂය එක් පැත්තකින් නව වාමාංශික පක්ෂයක්. අනෙක් පැත්තෙන් එය එතෙක් පැවැති වාමවාදී පක්ෂවලට නව මුහුණුවරක් එක් කිරීමක් ලෙස හඳුන්වන්න පුළුවන්.

1985 ජූලි මාසයේ දී විජය සහ මා ඇතුළු පිරිසක් රුසියාවේ - මොස්කව් නුවර බලා පිටත් වුණේ එහි පැවැති තරුණ සහ ශිෂ්‍ය සමුළුවකට සහභාගී වීම සඳහා. මට ඉතා හොඳින් මතකයි ඒ අවස්ථාවේ දී කියුබානුවන්ගේ සටන්කාමීත්වය එක්ක බැඳුණු කලාකාමී ජීවිතය විජයගේ අවධානයට සහ ඇගයීමට හේතු වුණා. විජය එතනදී කිව්වා 'බලන්න මේක නේ නියම සමාජවාදය කියන්නේ, සටන් කිරීම වගේම ප්‍රීතියෙන් ජීවත්වීම. ඇත්තටම අපේ රටේ සමාජවාදය වෙන්නත් ඕන මේකම නේද?' කියලා. ඒ වෙද්දී විජය තුළ දකුණු ඇමරිකානු කලාපයේ විප්ලවවාදී චින්තනය එක්ක සෑහෙන්න බැඳියාවක් නිර්මාණය වෙමින් තිබුණා.

> **විජය සහ මා අතර සබඳතාව ඉතා තදින්ම වර්ධනය වූ කාලයක්. ඒකට එක් හේතුවක් තමයි එවකට ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිවරණය සිතියම හකුළමින්, ජනමත විචාරණයක් හරහා ධූර කාලය දිගුකරගෙන ඉතා මර්ධනකාරී පිළිවෙතකින් කටයුතු කිරීමත් එක්ක රට තුළ එයට එරෙහිව ජනතා හඬ නැගෙමින් තිබූ කාලයක් වීම.**

මට මතකයි 1987 දී වාමේ පක්ෂවල මැයි දින සැමරුම පැවැත්වුණේ පොලිස් ප්‍රහාර මධ්‍යයේ, නාරාහේන්පිට - අභයාරාම විහාරයේ දී. එදා විජය ඇතුළු වාමාංශික පක්ෂවල නායකයන් පොලිස් වෙඩි තැබීම්වලින් මිනිසුන් ඝාතනය වන වටපිටාවකට ජේ.ආර්. පාලනයට එරෙහිව තමන්ගේ විරෝධය එල්ල කළා. එදා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන රඳවාගෙන හිටපු පිරිස බේරාගැනීමට විජය ඉතාම කැපවීමෙන් කටයුතු කළා.

මේ කාලයේ දී විජය උතුරේ ප්‍රශ්නයට දේශපාලනික විසඳුමක් ලබාදිය යුතුයි කියන දැඩි ස්ථාවරයේ හිටියා. ඒ වෙනුවෙන් සාකච්ඡා කරන්න ඔහු එක් අවස්ථාවක උතුරට ගියා. ඒත් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ දෙබඩි පිළිවෙත සහ ප්‍රතිගාමී ස්වරූපය නිසා එය සාර්ථක වූයේ නෑ. ඊළඟ අවස්ථාවේ දී විජය චෙන්නායි බලා ගිහින් එහිදී දෙමළ නායකයින් සමඟ සාකච්ඡා කළා. විශේෂයෙන්ම එල්.ටී.ටී.ඊ. රැඳවුම්භාරයේ හිටපු හමුදා සාමාජිකයන් බේරාගැනීම සම්බන්ධයෙන් ඔහු දීර්ඝව සාකච්ඡා කළා. පසුව විජය උතුරේ සංවිධාන අතරේ මාක්ස්වාදී නැඹුරුවක් ඇති ප්ලොට් සහ ඊ.පී.ආර්. එල්.එෆ්. වැනි සංවිධාන එක්ක, උමා මහේෂ්වරන් වැනි නායකයන් සමඟ යම්කිසි සමීකරණයක් ඇති කර ගත්තා. නමුත් එල්.ටී.ටී.ඊ. සමඟ කවදාවත් විජය එවැනි එකඟතාව ඇති කර ගත්තේ නෑ. විජයගේ තිබුණු නම්‍යශීලි, විවෘත සහ නව සමාජවාදී දේශපාලන ප්‍රතිපත්ති එක්ක උතුර - දකුණ යා කිරීමේ වැඩසටහන වෙනුවෙන් විජය උත්සහයක නිරත වුණා. ඒ අතරම විජය 1985 ඉඳන්ම දේශපාලනික ප්‍රතිසංස්කරණ උදෙසා සටන් කළා. ඒ වෙනුවෙන් විජයගේ කැපකිරීම කොච්චරද කියනවා නම්, තමන්ට නැක්සලයිට් චෝදනාව එල්ල කරලා සිරගත කරපු ජනාධිපති ජේ.ආර්.ට ලිපියක් ලියමින් විජය උතුරේ ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් යෝජනා කරනවා. එහිදී ඔහු සර්ව පාක්ෂික සමුළුවක් යෝජනා කරන්නේ එ වෙනුවෙන්. ජේ.ආර්. මෙයට යහපත් ප්‍රතිචාර දක්වමින් 1986 දී මෙම සමුළුව සංවිධානය කළත් එ.ජා.ප. ය තුළ අන්ත දක්ෂිණාංශික පාර්ශවය නියෝජනය කරපු ලලිත් ඇතුලත්මුදලි ඇතුළු කණ්ඩායම මෙයට එරෙහිව වෙනවා.

අන්තිමට ආණ්ඩුවට සිද්ධ වුණේ 1987 ඊටත් වඩා බරපතල විධියට ප්‍රතිසංස්කරණ සිදු කරමින් ඉන්දු - ලංකා ගිවිසුමට එකඟවෙන්න. එතනදී විජය සහ මහජන පක්ෂයේ ස්ථාවරය වඩා යහපත් කියලා පෙනෙන්න තිබුණා. ඊට මාස කිහිපයකට පස්සේ තමයි විජය ජ.වි.පෙ. සන්නද්ධ අංශයේ වෙඩි ප්‍රහාරයකින් අපිට අහිමි වෙන්නේ. 1986 දෙසැම්බර් මාසයේ ලංකාවේ දේශපාලනයේ ඉතාම වැදගත් සිදුවීම් දෙකක් සිද්ධවෙනවා. එකක් කොළඹ විශ්වවිද්‍යාලයේ නිදහස් ශිෂ්‍ය සංගමයේ දයා පතිරණ සහෝදරයා ජ.වි.පෙ. විසින් පැහැරගෙන ගිහින් මරා දමනවා. විජය මේ ඝාතනයන්ට එරෙහිව දැඩිව හඬ නගනවා. මේ කාලයේ දී විජය මහජන පක්ෂය එක්ක උතුරේ එල්.ටී.ටී.ඊ. විරෝධී සහ දකුණේ සැබෑ වාමාංශික කණ්ඩායම් එකතු කරමින් දේශපාලන ව්‍යාපෘතිය කරගෙන යනවා. ඔහු එතනදී ප්‍රකාශ කරනවා පළාත් සභා ක්‍රමය ආවොත් මහජන පක්ෂ ය සියලුම පළාත් සභාවලට ඉදිරිපත් වෙනවා කියන එක, ඒ විතරක් නෙවෙයි ඔහු ඉඟි කළා ඉදිරි ජනාධිපතිවරණයටත් ඉදිරිපත් වෙන්න අපේක්ෂාවෙන් ඉන්නවා කියලා.

මේ කාලයේ රජය ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ මා, ඉන්ද්‍රික ගුණවර්ධන වගේ ගණනාවක් පස්සේ පන්නමින් ඉන්න කාලයක්. මේ කාලයේ මා සැඟ වී කටයුතු කරද්දි විජය ඇවිත් මට යෝජනාවක් කළා විජයගේ මවගේ ගෙදර සැඟවෙන්න කියලා. ඒත් මම ඒකට එකඟ නොවෙන්නේ ඒක විජයගේ දේශපාලනයට නරක විධියට බලපාන බව දැනගෙන හිටපු නිසා. ඒත් විජයගේ සොහොයුරිය රූපා අක්කාට (රූපා කුමාරතුංග) අයත් ඈත ප්‍රදේශයක නිවසක මට සැඟවිලා ඉන්න අවස්ථාව ලැබුණා විජයගේ මැදිහත් වීමෙන්. මේක චන්ද්‍රිකා පවා දැනගෙන හිටියා. විජය ගොඩාක් අවස්ථාවල රෑ කළුවරේ මාව බලන්න එනවා. ඇවිත් බොහෝ වේලාවක් අප දේශපාලන කටයුතු ගැන කතා කරනවා. එතනින් ම ඉවත්ව යන අවස්ථාවේ දී විජයට ලියපු ලියුම් විජයගේ මරණය වෙද්දී පවා ඔහුගේ දින පොතක තිබිලා හමුවුණා කියලා පසු කාලෙක චන්ද්‍රිකා මට කිව්වා. මේ විධියට විජය ඒ වෙද්දී දරමින් හිටපු දේශපාලන මතයට මට එකඟවෙන්න පුළුවන්කම තිබුණා. ඊට පසුකාලෙක මා ඉන්දියාවේ සිටියදී තමයි විජය ඝාතනය වෙන්නේ. අවාසනාවකට මට ඒ වෙද්දී තිබුණු තත්ත්වය එක්ක විජයගේ අවමගුලටවත් සහභාගි වෙන්න බැරිවුණා. පසුකාලෙක ඔසී සහ වයි.පී. මාව හමුවෙලා විජයගේ අවසන් සමයේ ඉල්ලීමක් වූ පක්ෂයට මාව සම්බන්ධ කර ගැනීම සම්බන්ධයෙන් ඉල්ලීම් කළා. මම ඒකට එකඟවෙලා මහජන පක්ෂය සමඟ එක් වෙන්න තීරණය කළා. ඇත්තටම මා මහජන පක්ෂය සමඟ එකතු වෙන්නේ විජයගේ මරණයෙන් පසුවයි. ඒත් විජයගෙ අවමඟුල වෙනුවෙන් ඉන්දියාවේ මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂයේ නායක ආර්. ක්‍රිෂ්ණන් සිං සුරංජිත් සහෝදරයා ලංකාවට ඇවිත් දේශපාලනය කරන්නේත් මගේ ඉල්ලීම සහ මැදිහත්වීම එක්කයි.

විජයගේ ඝාතනයෙන් පස්සේ ඔසී අබේගුණසේකර මහජන පක්ෂයේ බර කරට ගන්න බියවුණේ නෑ. බොහෝ දෙනෙක් ජීවිත ආරක්ෂාවට පක්ෂයේ වගකීම්වලින් සැඟවෙද්දී ඔසී එයට බිය වුණේ නෑ. ඒ නිසාම ඔසී සහ චන්ද්‍රිකා පක්ෂය සම්බන්ධයෙන් බෙදෙන අවස්ථාවේ පවා මම හිටියේ ඔසී එක්ක. මොකද මට දැනුණ විදිහට ඔසී තමයි විජයගේ දර්ශනය පක්ෂය තුළ පවත්වාගෙන යන්න උත්සහ කළේ. පසුව එහි යම් යම් වෙනස්වීම් සිදු වුණා. පසුව මම මහජන පක්ෂයේ උප ලේකම්වරයෙක් වශයෙන් ඡන්දයෙන් පත් වුණා.

විජයගේ සහ මහජන පක්ෂයේ ඉතිහාසයේ වැදගත්ම සංවිධානයක් විධියට සලකන්න පුළුවන් සිදුවීමක් 1987 දෙසැම්බර් 26 වැනිදා කොළඹ මහනගර සභා ශ්‍රවණාගාරයේ දී සිදු වුණා. එම සමුළුවට වාමාංශික පක්ෂවලට අමතරව ශිෂ්‍ය සංවිධාන සහ වෘත්තීය සංවිධාන විශාල සංඛ්‍යාවක් සම්බන්ධ වුණා. මේකෙදී අත්සන් කරපු 'ප්‍රඥප්තිය' බොහෝ ප්‍රකට වුණා. මෙය දෙසැම්බර් 26 ව්‍යාපාරය කියලා හැඳින්වූවා. මෙයට කලින් කියපු සංවිධාන සහභාගී කර ගන්නට විජය සමත්වීම එක්ක විජයට හැකි වුණා ජාතිවාදයට එරෙහි කණ්ඩායම එකම තැනකට ගෙනන්නට. ඒත් ඊට මාස කිහියකට පස්සේ විජය ඝාතනය කරනු ලැබුවා. විජයට මේ කාලය වෙද්දී තිබුණු ජනප්‍රසාදය එක්ක ඔහු ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණා නම් සෑහෙන්න වෙනසක් වෙන්න තිබුණා. මම හිතන්නේ දේශපාලන ප්‍රශ්න පදනම් කරගෙන විජය, රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිවරයා එක්ක පවා සාකච්ඡා කළා. දෙදෙනාම පවුල් වාදයට එරෙහිව දේශපාලනය කියන තැනදී එකට හිටගත්තා. ඒ විධියට බලද්දී බොහෝ දුරට 1988 ජනාධිපතිවරණයේ දී නොවුණත් ඊට පස්සේ ජනාධිපතිවරණයක දී විජය නියත වශයෙන් ජනාධිපති ධූරයට පත්වෙන්න තරම් ජනප්‍රසාදයක් සහ පැහැදිලි ගමනක් ඔහුට තිබුණා.

හරියට බ්‍රසීලයේ ලූලා ද සිල්වා ජනප්‍රසාදය එක්ක බලයට ආපු විදිහට මෑතකදී චිලී රටේ තරුණ ජනාධිපතිවරයෙක් බිහිවුණා වගේ. මොකද විජයට තිබුණොත් දකුණු ඇමරිකානු සමාජවාදී නායකයෙක්ගේ ගමන. විජය ෆිදෙල් කස්ත්‍රෝ ගැන සෑහෙන්න අධ්‍යයනය කළා. ඔහුගේ සීදූව මහගෙදර කුටියේ ෆිදෙල් සම්බන්ධ සෑහෙන්න පොත් තිබුණා. ඒ වගේම කදිම වාමාංශික න්‍යායාත්මක පොත්පත් ඔහුගේ පුද්ගලික පුස්තකාලයේ තිබුණා. ඔහුගේ ඇස් මානයේ පෙනෙන්න අර්නස්ටෝ චේ ගුවේරාගේ ඡායාරූපයක් තිබුණා. විජය ළඟ චේ ගේ සෑහෙන්න ඡායාරූප තිබුණා. මොකද ඔහු චේ කියන චරිතයට සෑහෙන්න ආදරය කළා. ඔහුගේ ලියනමේසය ආසන්නයේ ඡායාරූප දෙකක් තිබුණා. එයින් එකක් ඔහු 'ක්‍රිස්තු චරිතය' චිත්‍රපටයේ රඟපාන ඡායාරූපයක්, අනිත් එක චේ ගේ ඡායාරූපයක්. ඒ තරමටම විජයගේ ආත්මය සහ අභ්‍යන්තර විඥාණය තුළ ජේසුස් ක්‍රිස්තුස්, චේ සහ ෆිදෙල් නිතරම රැඳී තිබුණා. හැබැයි චේ ගේ රූපය පච්ච කොටාගෙන ඊනියා විප්ලවවාදීන් වගේ නෙවෙයි විජය තුළ මානව දයාව තිබුණා. නිරායුධ මිනිසුන් කපා කොටාදමන විප්ලව වෙනුවට මානව දයාව කැටිවුණු විප්ලවවාදි දැක්මක් විජයට තිබුණා. ඒ නිසාම තමයි විජයට බොහෝ දෙනෙක් ආදරය කළේ සහ අදටත් කරන්නේ.

සංවාද සටහන
**ජනරංග විජඉඳු දේවසුරේන්ද්‍ර**

**ශ්‍රී ලංකා මහජන පක්ෂයේ වර්තමාන නායක සහ ප්‍රධාන ලේකම් අසංක නවරත්න මහතා කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුව නියෝජනය කරයි. ඔහු වයඹ පළාත් සභාවේ වසර 10ක් පළාත් සභා මන්ත්‍රීවරයකු ලෙසත් ඊට පෙර කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයකු ලෙසත් කටයුතු කර ඇත. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සහ ශ්‍රී ලංකා නිදහස් පොදුජන සන්ධානයේ උප ලේකම්වරයකු ලෙස කටයුතු කරන අතර වර්තමානයේ පාර්ලිමේන්තුව තුළ විපක්ෂයේ ස්වාධීන මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කරයි.**

**මගේ පියාණන් මට හුරුකරපු දේශපාලනය අනුව යමින් 2020 මහමැතිවරණයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් මනාප ඡන්ද 83,000 කට වැඩි ප්‍රමාණයක් ලබාගෙන පස්වැනි තැනට ජයග්‍රහණය කරන්නට ජනතාව මා වෙත තැබූ විශ්වාසය ඉතා ඉහළයි. ඔවුන් විශ්වාස කළා අපි වැඩක් කරාවි කියලා, අපි කොතනකදිවත් විකුණුනේ නැති නිසා.**



# මේ රට ගොඩගැනීමට හැකි දර්ශනය සහ සැලැස්ම අපේ පක්ෂයට තිබෙනවා

**අසංක නවරත්න**
කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී
නායක - ශ්‍රී ලංකා මහජන පක්ෂය

**● ශ්‍රී ලංකා මහජන පක්ෂය 1984දි බිහිවෙන්නේ ලංකාවේ දේශපාලනයේ ඉතාම තීරණාත්මක අවධියක දි. ඒ අවස්ථාව ඔබතුමා දකින්නේ කොහොමද?**

ශ්‍රී ලංකා මහජන පක්ෂය බිහිවන්නේම ලංකාවේ දේශපාලන රික්තයක් තිබෙන වෙලාවක. විශේෂයෙන්ම එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව හයෙන් පහක බලයක් සහිතව ඉතා මර්ධනකාරීව සහ ජනතා විරෝධීව කටයුතු කරන මොහොතක විජය කුමාරතුංග මැතිතුමන්ගේ මූලිකත්වයෙන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රගතිශීලී කඳවුර නියෝජනය කරපු ටී.බී.ඉලංගරත්න, කුමාරසූරිය, ප්‍රේමදාස උඩගම, චන්ද්‍රිකා බණ්ඩාරණායක, ඔසී අබේගුණසේකර සහ වයි.පී ද සිල්වා පතාක යෝධයින් එකතු කරගෙන තමයි මහජන පක්ෂය බිහිවෙන්නේ.

**● විජය කුමාරතුංග මැතිතුමන්ගේ මූලිකත්වයෙන් බිහිවුණු මහජන පක්ෂය ලංකාවේ දේශපාලනයේ ප්‍රබල නායකයන්ගෙන් පොහොසත් පක්ෂයක්. ඔබට එහි ප්‍රධානතම භූමිකාව පැවරෙන්නේ පක්ෂය දැඩි අර්බුදකාරී තත්වයක තිබියදී. එතනින් පස්සේ ඔබේ කාර්යභාරය මොනවගේ එකක්ද?**

විජය කුමාරතුංග මැතිතුමන් මහජන පක්ෂය බිහිකරලා ඊට පස්සේ සටන් කරන්න සිද්ධවුණේ ඉතා මර්ධනකාරී ආණ්ඩුවක් එක්ක. මේ දැන් තිබෙනවා වගේ සුන්දර වටපිටාවක නෙවෙයි, උතුරේ එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදය වගේම දකුණේ කැරැල්ල වගේ බරපතල තත්වයන්ට මුහුණ දෙන්න වුණා. ඒත් විජය ශ්‍රී ලංකා මහජන පක්ෂය සහ වමේ ප්‍රගතිශීලී කණ්ඩායම් එකතුකරලා පොදු එකතුවක් ගොඩනගන්න අවශ්‍ය කටයුතු 1988 පෙබරවාරි 16 වැනිදා විජය ඝාතනය වෙද්දිත් ඔහු විසින් සකස් කරලා තිබුණා. පසුව එය තමයි එක්සත් සමාජවාදී පෙරමුණ විධියට බිහිවෙන්නේ.

එක්සත් සමාජවාදී පෙරමුණ තමයි එදා මුලින්ම එ.ජා.ප ආණ්ඩුවට එරෙහිව මුල්ම පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වෙලා සෑම පළාත් සභාවකම වමේ බලය තහවුරු කරමින් විපක්ෂය විධියට පත්වෙන්නට හැකියාව ලැබුණා. ඉතිහාසයේ ශ්‍රී ලංකා මහජන පක්ෂය තරම් මර්දනයට මුහුණ දුන්න වෙනත් පක්ෂයක් නෑ. පක්ෂයේ නායකයන් ඇතුළු ප්‍රධාන ක්‍රියාකාරීන් 117ක් පමණ ඝාතනයට ලක්වුණා. ඒ අතරේ පොහොද්දරමුල්ලේ පේමාලෝක හිමියන්, බුත්තල මයිකල් රොද්‍රිගෝ පියතුමා, විජය කුමාරතුංග, දේව බණ්ඩාර සේනාරත්න වැනි ප්‍රමුඛ පෙළේ නායකයන් ඝාතනය කර දැම්මාට පස්සේ පක්ෂයක් ඉතිරිවුණේ නෑ. පසුව ඔසී අබේගුණසේකර මැතිතුමන් පක්ෂයේ බර කරට ගත්තා, චන්ද්‍රිකා මැතිනිය ආරක්ෂාව සඳහා රටෙන් පිට වුණා.

පසුව ඔසී මැතිතුමන් එ.ජා.පයට එක්වුණාට පස්සේ ඔසී පිළ සහ වයි.පී පිළ විදිහට මහජන පක්ෂය දෙකඩ වුණත් වයි.පී. ද සිල්වා මැතිතුමන් ඉතාම දුෂ්කර ගමනකින් පක්ෂය ඉදිරියට අරගෙන ආවා. එතුමන්ගේ පස්සේ මගේ පියතුමා රංජිත් නවරත්න මැතිතුමන් ඉතාම වගකීමෙන් සහ කැපවීමෙන් පක්ෂය ඉදිරියට අරගෙන එනවා. 2013 වසරේ එතුමාගේ අභාවයෙන් පස්සේ පක්ෂයේ නියෝජ්‍ය ලේකම්වරයා විදිහට කටයුතු කරපු මා පක්ෂයේ විධායක කමිටුවේ පත්කිරීම මත පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා ලෙස කාර්ය භාරගන්නවා.

ප්‍රධාන ධාරාවේ පක්ෂ එක්ක කටයුතු කිරීම ඉතා අසීරු අවස්ථාවක පවා පක්ෂයේ විධායක කමිටුවේ සහ සියලුම ක්‍රියාධරයන්ගේ මැතිහත්වීමෙන් පක්ෂය ගොඩනැගීමේ කටයුතුවල නිරත වෙනවා.

**● ශ්‍රී ලංකා මහජන පක්ෂය ලංකාවේ වත්මන් දේශපාලනය එක්ක බලද්දි මේ මොහොතේ දරන ස්ථාවරය මොකක්ද?**

1994 ඉඳන් මහජන පක්ෂය සන්ධානගතවූ දේශපාලන ගමනක තමයි යෙදෙමින් ඉන්නේ. 1994දී පොදුජන එක්සත් පෙරමුණ එක්ක, ඉන් පසුව 2004 දී එක්සත් ජනතා නිදහස් සන්ධානය සමග සහ 2016 දි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විදිහට සන්ධානගත වෙනවා. මෙහෙම සන්ධාන ගතවෙද්දි පක්ෂයට සෑහෙන අසාධාරණකම් සිදුවුණා. ඒත් අපි 2020 මැතිවරණයේදී වසර 20කට පසුව මහජන පක්ෂයට පාර්ලිමේන්තුවේ අසුනක් හිමිවෙන්නේ අපේ ඒ කැපකිරීම්වල ප්‍රතිඵලයක් විධියට. කෙසේ වුවත් පවතින තත්ත්වය සලකා බලලා ඉදිරි මැතිවරණවලදී ශ්‍රී ලංකා මහජන පක්ෂය වෙනම තරඟ කිරීමේ සූදානමක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පාක්ෂිකයන් දැනුවත් කරමින් අපි මේ වෙද්දි රටපුරා පක්ෂය නඟාසිටුවීමේ කටයුතු ආරම්භකරලා තියනවා.

**● ලංකාවේ ජාතික ප්‍රශ්නයට වගේම ඉදිරි ගමන වෙනුවෙන් ඉතාම ප්‍රශස්ත සහ ප්‍රායෝගික වැඩ පිළිවෙලක් තිබුණු පක්ෂයක් විදිහට මහජන පක්ෂය සලකන්න පුළුවන්. මේ වෙද්දි ලංකාව මුහුණදෙමින් ඉන්න අර්බුදකාරී තත්වයන්ට මහජන පක්ෂයේ යෝජනාවන් මොනවාද?**

විශේෂයෙන්ම මේ වෙද්දි අපේ රටේ ජනතාව මුහුණදෙන ආර්ථික ප්‍රශ්නවලට පැවති ආණ්ඩු සියල්ලම වගකීම දරන්න ඕන. ඒ වගේම ඒ ආණ්ඩුවල කොටස්කරුවන් විධියට හිටපු අපිටත් ඒ වගකීම්වල යම්කිසි කොටසක් පැවරෙනවා. ඒත් ඒ බොහෝ ආණ්ඩුවල අපිට තීන්දු තීරණ ගැනීමේ අවස්ථාව හිමිනොවීම එක්ක අපේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න ලැබුනේ නෑ කිව්වොත් නිවැරදියි. ඒත් මේ මොහොතේ හැම ප්‍රශ්නයක් විසඳගන්න පෙර රටක් තිබිය යුතු නිසා, රටේ ස්ථාවරත්වය ගැන සලකලා හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට අපි සර්ව පාක්ෂික ආන්ඩුවක් මගින් මේ ගැටළුවලට පොදුවේ විසඳුමක් සොයමු කියන යෝජනාව කළා සහ ඔහු ඒ සඳහා සූදානමක් තිබුණා. ඒත් ඔහුට ඒ සඳහා ඉඩක් ලැබුණේ නෑ. වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහටත් අපි ඒ යෝජනාව කළත් ඔහුත් ඒ සඳහා පැහැදිලි උනන්දුවක් සහ දැක්මක් ඇතිව වැඩකරන බවක් පෙනෙන්නට නෑ.

පාර්ලිමේන්තුව තුලත් යෝජනාවුණු ජාතික විධායක සභාව සම්බන්ධයෙන් පවා යහ චේතනාවකින් කටයුතු කරන බවක් පෙනෙන්නට නැහැ. ඒ නිසා රටේ ජනතාව තවදුරටත් අපහසුවට පත්නොකර, මේ ගැටළුවලට වඩා ප්‍රායෝගික යෝජනා ඉදිරිපත් කරන්නත්, ඒවා ක්‍රියාත්මක කරන්නටත් අපි අවංකව කටයුතු කරනවා. ඒ සඳහා අවශ්‍ය ජනවරම අපි ඉදිරි මැතිවරණවලදී ජනතාවගෙන් ඉල්ලා සිටිනවා. ඒත් මැතිවරණවලට පෙරාතුව පවතින ප්‍රශ්න නිරාකරණයට නිශ්චිත වැඩපිළිවෙළක් ඇති බවක් පෙනෙන්න නෑ. රටම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දිහා බලාගෙන ඉන්නවා. නමුත් අපේ යෝජනාවන් ඊට එහා ගියපු රටේ නිෂ්පාදනය, සේවා නියුක්තිය සහ හැමදාමත් මහජන පක්ෂයට කටයුතු කළා වගේ ජාත්‍යන්තරව නොබැඳි පිළිවෙතක් අනුගමනය කරමින් අවංකභාවයකින් කටයුතු කරන්න අපි මැදිහත්වෙනවා.

**● පහුගිය කාලයේ මහජන පක්ෂය ලංකාවේ විවිධ දේශපාලන සංධාන සහ එකමුතුවල කොටසක් බවට පත්වුණා, ඒ මගින් මහජන පක්ෂයේ උන්නතියට මොනවගේ බලපෑමක්ද වුණේ?**

රටේ ප්‍රශ්නයට ප්‍රමුඛතාව දීලා අපේ පක්ෂයේ වුවමනාකම් දෙවැනි තැනට දාලා කටයුතු කිරීම නිසා තමයි බොහෝවිට පක්ෂයට සෑහෙන්න හානිවුණේ. විවිධ සන්ධානගතවීම් නිසා රටක් විදිහට ලැබූ ජයග්‍රහණවල කොටස්කරුවෙක් වෙන්න පක්ෂයට හැකියාව ලැබුණත්, පක්ෂයක් විදිහට සෑහෙන්න කැපකිරීම් කරන්න සිදුවුණා. විශේෂයෙන්ම 1994 ජයග්‍රහණයෙන් පස්සේ චන්ද්‍රිකා මැතිනිය නිදහස් පක්ෂයට ගිහින් මහජන පක්ෂයේ නායකයන් නිදහස් පක්ෂයට සම්බන්ධ කරගැනීම වගේම 2004දී පක්ෂයට විජය කුමාරතුංග මැතිතුමන් ඝාතනයට සම්බන්ධ ජ.වි.පෙ සමග සන්ධාන ගතවීමට සිදුවීමත් එක්කත් පක්ෂයේ ක්‍රියාකාරීන් කොටසක් අහිමි වුණා. 2015 මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පරාජයෙන් පස්සේ ගොඩනගපු ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් අපේ පක්ෂය ඉතා විශාල කාර්යභාරයක් කළා, ඒත් පසුව එහි සාර්ථකත්වය ලබද්දි පසුව සම්බන්ධ වෙච්චි පාර්ශව එහි බලය අරගෙන පුරුදු විදිහටම අපේ පක්ෂය නොසලකා පැත්තකට දැම්මා. ඒ නිසා සන්ධානගතවීම් එක්ක බොහෝදුරට පක්ෂයට සිදුවුණු හානිය ඉතා ඉහළයි.

**● 2020 පාර්ලිමේන්තු මහ මැතිවරණයේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් විශිෂ්ට ජයක් ලබලා කාලෙකට පස්සේ මහජන පක්ෂයට පාර්ලිමේන්තුවේ ඉඩක් වෙන්කරගන්න ඔබට හැකිවෙනවා. ඒ ජයග්‍රහණය වෙනුවෙන් ආපු ගමන සහ ඒ ජය ඔබ දකින්නේ මොන විධියටද?**

කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් 2000දී ලබපු මහමැතිවරණ ජය එක්ක පාර්ලිමේන්තු අසුනක් ලැබුණත් මගේ පියා රංජිත් නවරත්න මැතිතුමන්ට එවකට රජයේ වගකීමක් හිමිවෙන්නේ නෑ. ඉන් පසුව පවා පළාත් සභා මැතිවරණවලින් ජයග්‍රහණ ලැබුවත් හිමිවෙන්නේ ඒ ඉරණම ම තමයි. ඒත් මගේ පියාණන් මට හුරුකරපු දේශපාලනය අනුව යමින් 2020 මහමැතිවරණයේදී කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් මනාප ඡන්ද 83,000 කට වැඩි ප්‍රමාණයක් ලබාගෙන පස්වැනි තැනට ජයග්‍රහණය කරන්නට ජනතාව මා වෙත තැබූ විශ්වාසය ඉතා ඉහළයි. ඔවුන් විශ්වාස කළා අප වැඩක් කරාවි කියලා, අප කොතැනකදීවත් විකිණුනේ නැති නිසා. බොහෝ දෙනෙක් විකිණුන තැන්වලදී නොවිකිණී, වැරැද්දට එරෙහිව කතාකරපු නිසා පාර්ලිමේන්තුවේ අපිට තිබුණු සුළුම තනතුරක් වුණු ආණ්ඩු පක්ෂයේ සහකාර සංවිධායක තනතුර පවා අහිමි කළා. ඒත් අපේ නිවැරැදි ගමන ඉදිරියටම යනවා, ඒක වෙනසක් නෑ.

**● අද වෙද්දි මහජන පක්ෂය නැවත වතාවක් රටපුරා තමන්ගේ දේශපාලන ක්‍රියාකාරීත්වය ඉතා හොඳින් වර්ධනය කරගනිමින් ඉන්න බව පෙනෙන්න තියනවා. කොහොමද පාක්ෂිකයන්ගේ උනන්දුව සහ ඉදිරි ගමනට ඇති දායකත්වය?**

ඇත්තම කිව්වොත් අපේ පක්ෂයේ මේ වෙද්දි විශාල පිරිසක් නෑ. පක්ෂයේ මුල් සාමාජිකයන් බොහෝ දෙනෙක් මියගිහින්. ඒත් ඔවුන්ගේ පසු පරපුර, දරුවන් අද වෙද්දි පක්ෂය සමගින් එකතුවීම ඉතාම හොඳ සිදුවීමක්. පක්ෂය පැත්තෙන් අපි හිතනවා ඒ කණ්ඩායම එක්ක ඉතාම ශක්තිමත්ව ඉදිරියට යන්න පුළුවන්. පහුගිය පළාත් පාලන මැතිවරණයේදීත් අපි වෙනම තරග කළා නම් බොහෝ පළාත් පාලන ආයතනවල අපේ පක්ෂයේ නියෝජිතයන් තෝරා පත්වීමට ඉඩතිබුණා. නමුත් ඉදිරියේදී අපි ඒ ස්ථාවරයේ ඉන්නවා.

**● ඉදිරියේදී බොහෝවිට පළාත් පාලන මැතිවරණය හෝ පළාත් සභා මැතිවරණය පැවැත්වීමට නියමිතයි. ඒ සඳහා මහජන පක්ෂයේ සූදානම මොකක්ද? තනිව තරග කිරීමේ බලාපොරොත්තුවක් තියනවද?**

දැන් තියෙන තත්ත්වය අනුව බොහෝවිට දේශපාලනඥයින්ට ගමට යන්න බැරි තත්ත්වයක් තිබෙන්නෙ. ඔවුන් සම්බන්ධයෙන් තිබෙන පිළිකුල සහ ඔවුන් ඉන්න ජරාජීර්ණ ක්‍රමය නිසා අද රාජ්‍ය ඇමතිවරුන්ට ගම්වලට යද්දී පහරදෙන තත්වයක් ඇතිවෙලා තියනවා. අපේ පක්ෂය කවදාවත් එවැනි ජරාජීර්ණ පක්ෂයක් නෙවෙයි. ඒ නිසා අපි රට ඉදිරියට යන සැලැස්මක් සහිතව අවංකවම, ජනතාව සමග බිම් මට්ටමේ සිට කටයුතු කරන පක්ෂයක්. ඒ නිසා ඒ යහපත් සංස්කෘතිය ඒ විධියටම පවත්ගෙන යනවා.

**● රටේ බොහොමයක් දේශපාලන පක්ෂ වෘත්තිකයන්ගේ, තරුණ ප්‍රජාවගේ වගේම කාන්තාවන්ගේ නියෝජනය සහ ක්‍රියාකාරී දේශපාලන පැවැත්ම ගැන ගුණාත්මක දායකත්වයක් දක්වන බවක් පෙනේනනට නැහැ. එතැනදි මහජන පක්ෂය මොනවගේ පියවරක්ද ඒ වෙනුවෙන් අනුගමනය කරන්නේ?**

දැනට අපේ පක්ෂයේ වෘත්තීය සමිති සහ දේශපාලන මණ්ඩලයට සම්බන්ධ පාර්ශ්ව වන වෘත්තීය සමිති ආචාර්යවරුන් ඇතුළු වෘත්තියවේදීන් ක්‍රියාකාරීව ඉන්නවා. තරුණ සහ කාන්තා නියෝජනයන්ටත් පක්ෂයේ තිබෙන්නේ ඉතාමත් වැදගත් තැනක්. තරුණයෙක් විධියට පක්ෂයේ මේ තනතුරට එන්නට මට අවස්ථාව ලැබුණොත් පක්ෂය තුළ ඇති ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවය සහ තරුණයාට ඇති ප්‍රමුඛත්වය නිසා. කාන්තාවන්ට සහ තරුණයන්ට පක්ෂය තුළ ඉතා හොඳ තැනක් තිබෙන නිසා ඔවුන්ගේ තීන්දු තීරණවලට තැනක් ලැබෙනවා, සාමාන්‍ය දේශපාලන පක්ෂවල වගේ තරුණයන් සහ කාන්තාවන් පාවිච්චිවෙන තැනට අපේ පක්ෂය කටයුතු කරන්නේ නෑ. ඉදිරියේදී විශාල තරුණ සමුළුවක් පවත්වන්නත් අපි කටයුතු කරමින් ඉන්නවා. වෘත්තීයවේදීන් එක්ක කටයුතු කරද්දි ඉතාම හොඳින් අපි ඔවුන්ගේ දායකත්වය හඳුනාගෙන පක්ෂය ක්‍රියාකරනවා, පසුගියදා මහජන වෘත්තිය සමිතිය රැස්කරලා නැවත එය සවිබලගැන්වීම එක්ක ඉදිරිය ඉතාම හොඳ බව පෙනෙන්න තිබෙනවා.

**● අවසාන වශයෙන් පාක්ෂිකයන්ට සහ පොදු මහජනතාවට දෙන්න තියන පණිවිඩය මොකක්ද?**

විජය කුමාරතුංග මැතිතුමන් බිහිකරපු මහජන පක්ෂය හැමදාමත් එහි නිර්ප්‍රභූ දේශපාලන ප්‍රතිපත්තිය අනුගමනය කරමින් එවැනි ප්‍රතිපත්තියක් ඇති එකම පක්ෂය විධියට ශ්‍රී ලංකා මහජන පක්ෂය ක්‍රියා කරනවා. ඒ නිසා ඕනෑම කෙනෙක්ට අපේ පක්ෂයේ ප්‍රතිපත්ති සහ දර්ශනය බාරගන්නවනම් කිසිදු සීමාවකින් තොරව අපේ පක්ෂය එක්ක එකතුවෙන්න පුළුවන්. මේ රට ගොඩගැනීමට හැකි දර්ශනය සහ සැලැස්ම අපේ පක්ෂයට තිබෙනවා. ඒ නිසා මේ සියලු පුද්ගලික කටකතා පැත්තකින් තියලා රටේ සහ දරුවන්ගේ අනාගතය ගැන හිතලා ඒ වෙනුවෙන් වැඩ කරන්න මහජන පක්ෂය සමඟින් එකට එකතුවෙන්න කියලා මම හැමදෙනාටම ආරාධනා කරනවා.

**සංවාද සටහන**
**ජනරඟ විජඉඳු දේවසුරේන්ද්‍ර**



**නව ඇරඹුමක්.... ශක්තිමත් නායකත්වයක්.. අපේ ශක්තිය**
**පා.ම අසංක නවරත්න මැතිතුමන්ට සහ**
**ශ්‍රී ලංකා මහජන පක්ෂයට,**
**" ඇස" පුවත්පතට**
**උණුසුම් සුභ පැතුම්!**

**දේශමාන්‍ය අමිත් සුරංග රත්නායක**
**සභාපති - ශ්‍රී ලංකා මහජන පක්ෂ කුවේට් ශාඛාව**
**සංවිධායක - අනුරාධපුර (බටහිර) ආසනය**
**අධිපති** - Pure Hair Care Saloon Kuwait

ඇස

වෂී 2022ක් වූ ඔක්තෝබර් මස 09 වැනිද ඉරිද

# ආර්ථික අර්බුදයට ජනතාවට විසඳුමක්

මහාචාර්ය සුමනසිරි ලියනගේ

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ හිටපු මහාචාර්ය සුමනසිරි ලියනගේ මහතා විසින් රචිත "ආර්ථික අර්බුදයට ජනතා විසඳුමක්" නමැති ග්‍රන්ථය පිළිබඳව එතුමා සමඟ පැවති සංවාද සටහනකි.**

පසුගිය සති කීපය තුළ කරනු ලැබූ සාකච්ඡාවන්හිදී අපට පෙනී ගියේ නව ලිබරල් වාදීන් අතර පමණක් නොව ජාතිකවාදී සහ වාමවාදී පිරිස් අතර පවා පවතින ආර්ථික අර්බුදය විසඳීම සම්බන්ධයෙන් කිසියම් විචිකිච්ඡාවක් පවතින අතර එයින් කියවෙන්නේ. "විසඳාගත නොහැකියි" ඒ නිසා එළිපිට කියන්න බැරි වුවත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යෑම මගහැරිය නොහැකි බවයි. මෙය නව ලිබරල් වාදයෙන් විශේෂයෙන්ම නව ලිබරල්වාදී දෘෂ්ටිවාදයෙන් ගලා එන අදහසකි. දශක හතරකට වඩා වැඩි කාලයක් නව ලිබරල්වාදය තුළ වර්ධනය වූ සමාජයක් විධියට එවැනි විශ්වාස සහ භාවිතාවන් ඇතිවීමේ අරුමයක් නැත. ලංකාවට තියෙන ප්‍රශ්නය ඩොලර් නැතිකමය. ඩොලර් ලබාගත හැක්කේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පිහිටෙනි. එය කොළ එළි පත්තු කරන්නේ නම් අනිත් ආයතන ද ණය ලබා දෙනු ඇත. ජාත්‍යන්තර ස්වෛරී පිළිනපත් කිහිපයක් විකුණා ගන්නට බැරි නොවණු ඇත.

මෙම අර්බුදයේ ප්‍රාග්ධනය වුවමනාවන් වෙනුවෙන් පමණට වඩා පුම්බපු එකකි, අර්බුදය අතිශයෝක්තිකරණයට ලක් කර ඇත්තේ අරමුණු දෙකක් ඇතිවය.

01. අර්බුදයට වෙනත් විසඳුමක් නැත යන අදහස ජනතාව තුළ පැලපදියම් කොට ශ්‍රී ලංකා ආර්ථිකය ගෝලීය මූල්‍ය ප්‍රාග්ධනයේ ආධිපත්‍යයට නතු කිරීම ඉන් පළමුවෙනිව අරමුණයි.

02. ශ්‍රී ලංකාව සමීර අමීන් විසින් "ත්‍රිත්වය" (Three) ලෙස හැඳින්වූ ඇමරිකා එක්සත් ජනපදය, බටහිර යුරෝපය හා ජපානය යන රටවල පදයට නටන රටක් බවට පත්කර ගනිමින් ඉන්දීය සාගර කලාපය හැසිරීම දෙවන අරමුණ ය

මෙහිදී ත්‍රිත්වයට හීලෑ කරගත් ඉන්දියාව අවශ්‍ය වන්නේය. "චතුරස්‍රය" (Quad) බිහිවන්නේ ඒ සඳහාය. (ඔස්ට්‍රේලියාව ඉන්දියාව ජපානය ඇමරිකා එක්සත් ජනපදය) අර්බුදය කියවීමේ දී මේ අතිශයෝක්තිකරණ උවමනාව අප වටහා ගත යුතු වේ.

**ඇත්ත කුමක්ද?**

වැඩි අතීතයකට නොගොස් 2021 මහ බැංකු වාර්තාවෙන් පටන් ගනිමු. අර්බුදය හඳුන්වන්නේ අවට ඕනෑම කරන එහෙත් විදේශවලින් ලබාගත යුතු වන බඩුමුට්ටු ටික ගන්නවත් ශ්‍රී ලංකාවට විදේශ විනිමය නොමැති බව ද? මේ කරුණ සත්‍යයක් ද? අපි අපේ රටේ අවශ්‍යතා පූර්වතා ලේඛනයට ඇතුළු කර බලමු.

01. ඖෂධ සහ සෞඛ්‍ය උපකරණ: මේ සඳහා 2021 වැයකොට ඇත්තේ ඩොලර් මිලියන 882.5 කි.

02. ඉන්ධන බොරතෙල් හා පිරිසුදු කළ ඉන්ධන 2021 වියදම ඩොලර් මිලියන 3742.9 කි

03. නිෂ්පාදනය සඳහා අවශ්‍ය යෙදවුම්: ඩොලර් මිලියන 4140 කි.

04. අත්‍යාවශ්‍ය ආහාර: (පරිප්පු, සුදු ලූනු, තිරිඟු වැනි) ඩොලර් මිලියන 500.

ආර්ථික අර්බුදය විසඳෙන තුරු ආයෝජන වියදම් කපා දැමුවොත්, ආයෝජන වියදම ඩොලර් මිලියන 2231කට සීමා කළ හැක. එවිට අත්‍යවශ්‍යම ආනයන සඳහා අප වියදම් කරන්නේ ඩොලර් මිලියන 12000කට එනම්, ඩොලර් බිලියන 12ක පමණ ප්‍රමාණයකි. 2021 ශ්‍රී ලංකාවේ මුළු ආනයන වියදම ඩොලර් මිලියන 20600කි. එනම් ඩොලර් බිලියන 20.5කි. අප විසින් දැක්වූ ආනයන පූර්වතා ලේඛනය තවත් ලිහිල් කොට, ආනයන වියදම් ඩොලර් බිලියන 15 මට්ටමේ ලබා ගත්තත් ඒ සඳහා වැය වෙන ඩොලර් ප්‍රමාණය ශ්‍රී ලංකාවේ මේ වන විටත් වාර්ෂිකව උපයයි.

අපි දැන් ඉපයීම් පැත්ත බලමු. ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ඩොලර් උපයන්නා වන්නේ අපනයන අංශයයි. 2021 ඩොලර් මිලියන 12498කි. ප්‍රේෂණ (විදේශ රටවල රැකියා කරන්නවුන් එවන මුදල්) 2021 ඩොලර් මිලියන 5221කි. පරිගණක සේවා සපයන්නන්ගේ දායකත්වය ඩොලර් මිලියන 1000කට මඳක් වැඩිය. 2021 සංචාරක ක්ෂේත්‍රයේ ආදායම, ඩොලර් මිලියන් 1600කි. මේ ටික එකතු කර බලමු. 2021 ශ්‍රී ලංකාවේ ඩොලර් ඉපැයීම්වල අගය ඩොලර් මිලියන 20000කි. එනම් ඩොලර් බිලියන 20කි. ශ්‍රී ලංකාවේ ලැබීම ඩොලර් බිලියන 20 යි. ගෙවීම් ඩොලර් බිලියන 20යි එහෙනම් මොකද්ද ප්‍රශ්නය? ඩොලර් බිලියන 50 ඉක්මන වාර්ෂික ණය සේවා ගෙවීම්. 2022 අවසන් වනවිට අපි ණය සේවා ගෙවීම් ලෙස දැරිය යුතු අගය ඩොලර් බිලියන 7.3 කි. තරමක රැඩිකල් තීරණ කිහිපයකින් ජාතික ආර්ථික සැලැස්මක් අනුව ආර්ථිකය හැසිරීමෙන් මේ අතිශෝක්තිකරණයට ලක් කර ඇති ආර්ථික අර්බුදය විසඳිය හැකිවා පමණක් නොව රට සංවර්ධනය මාවතට සේන්දු කළ හැකිය.

**ශ්‍රී ලංකාවේ වර්තමාන අර්බුදය**

අතිශෝක්තිකරණයට ලක්ව ඇතැයි අප කළ නිරීක්ෂණයෙන් අර්බුදයක් නැතැයි අදහස් නොවේ. අර්බුදය තේරුම් ගැනීමට නම් විශේෂ ප්‍රකාශයේදී අගමැති රනිල් වික්‍රමසිංහ කිසිදු උත්සාහයක් නොගත්තේ ය. ඒ වෙනුවට කවුරුත් මේ වන විටත් අත්දකිමින් සිටින අර්බුදයේ මතුපිට රෝග ලක්ෂණ කිහිපයක් අවධාරණය කළේය. කප්පාදුව පටි තද කරගැනීම සහ පෞද්ගලිකකරණය දේශපාලනික තේමාවක් මිස ආර්ථික අවශ්‍යතාවක් නොවන බව අපි අවධාරණය කරමු.

නොපෙනෙන තරම් සෙමින් ඇදී ආ මෙම අර්බුදය ඉන්දියානු මහාචාර්යවරයෙකු වන ප්‍රභාත් පැට්නයික් නිශ්චිත අර්බුදයක් (Contingent Crisis) කරනු ලැබූ නාමකරණය වඩා නිවැරදි එකකි. නව ලිබරල්වාදී ඕනෑම කුඩා රටක මෙවන්නක් ඇතිවිය හැකි බව හේ මැනවින් පැහැදිලි කළේය. විදේශ ණය ගොඩ ගැසීමත්, ඒවා ගෙවාගත නොහැකි මට්ටමට එන තුරුම ඒ අනතුර නොපෙනීමත් අවිනිශ්චිත අර්බුදයක චරිතාංගයකි. අර්බුදයට විසඳුම් ලෙස පහත දැක්වෙන යෝජනා ඉදිරිපත් කෙරෙන්නේ මෙම කොන්දේසි තුනට යටත්ව ය.

එම කොන්දේසි 3 තුන මෙසේ සාරාංශ කරමු.

01. මේ අර්බුදය විසඳීමට රජය යෝජනා කරන කිසිදු යෝජනාවකින් ජනතාවට, විශේෂයෙන් සමාජයේ පහළ මහලේ ජනතාවට කිසිදු අතිරේක බරක් නො පැටවිය යුතුය.

02. මේ විසඳුම් යෝජනා නිසා මේ වන විට රටේ විශාල ණය කන්ද කිසිදු ආකාරයකින් ඉහළ නොදැමීමට වග බලා ගත යුතුය.

03. මේ විසඳුම් හේතුකොටගෙන ජාතියේ පොදු ධනයට සහ ජාතික ස්වාධිපත්‍යයට හානියක් නොවිය යුතුය.



කොන්දේසි තුනට යටත්ව 1977 සිට ක්‍රියාත්මක වූ ආර්ථික මූලෝපාය කණපිට ගැසීම අවශ්‍ය වේ. 1977 ලංකාවේ වෙළෙඳ ශේෂය සහ වර්තන ගිණුම් අතිරික්තයක් පෙන්නූ අවසන් වසර වේ. එයින් පසු හැම වසරකම ඇතිවූයේ හිඟයකි. 1977 එය සමතුලනයට පියවර ගත්තේය. ඒ සියල්ල සාර්ථක නොවුන බව සැබෑවකි. 1977-2000 විතර කාලය තුළ ආණ්ඩු මේ හිඟය පියවූයේ විදේශ ප්‍රදාන සහ ආධාර යොදාගනිමිනි. එහෙත් 2000 න් පසු විශේෂයෙන්ම 2007 න් පසු එහිලා අනුගමනය කළේ ණය ගැනීම් ය. ශ්‍රී ලංකාව ප්‍රධාන මත රැඳුණු ආර්ථිකයකින් (Grant-economy) ණය මත රැඳුණු ආර්ථිකයක් (Debt-economy) වෙතට විතැන් විය. මීට සමාන ක්‍රියාවලියක් දේශීය වශයෙන් ද සිදුවිය. 1977 ට වියදම් පරතරය පියවූයේ බදු වැඩි කිරීමෙන් හා රාජ්‍ය සංස්ථා ලාභ වැඩි කර ගැනීමට කරගැනීමට උත්සාහ කිරීමෙන් ය. එහෙත් දෙවැනි උත්සාහය සාර්ථක නොවීය. 1977 ට පසු ජාතික ආදායමෙන් 25% ක් පමණ වූ ආණ්ඩුවේ ආදායම 9% කට පමණ දැන් පහත වැටී ඇත. අයවැය හිඟය පියවූයේ ණය ගැනීමෙනි. එමගින් බදු රාජ්‍යයක (tax-state) සිට අප ණය රාජ්‍යයකට(Debt-state) මාරු වුනෙමු. මේ විතැන්වීම් දෙකම ආපස්සට හැරවිය යුතු වේ. එය කළ හැක්කේ ජාතික සැළැස්මක් මගින් ආර්ථිකය හැසිරවීමෙනි.

**විසඳුම් යෝජනා සමහරක්**

අප මුලින්ම සලකා බලමු සෙසු ලෝකය සමග කරන ගනුදෙනු විෂයෙහි කළ යුතු වෙනස්කම් මොනවාද කියා

**01. පස් වසරක ණය විරාමයක් -**

සමුච්චනය කරගත් විදේශ ණය කන්දට කුමක් කරන්නේද යන්න විසඳුම් මාවතේ පළමුවැනි ප්‍රශ්නය වන්නේ ය. ශ්‍රී ලංකාවේ විදේශ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 50 කි. ඉදිරි වසර පහේදී (2022-2026) ගෙවිය යුතු ණය සේවා ගෙවීම් ඩොලර් බිලියන 30 ක් පමණ වේ. මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපතිවරයාට අනුව ශ්‍රී ලංකාව මේ වන විට බන්කොලොත් වූ රාජ්‍යයකි.

මෙම සන්දර්භය තුළ පියවුම් මූල්‍ය (Bridge Financing) ලෙස ඉදිරි මාස කිහිපයේදී ගන්නා විදේශ ණය වසරකදී බේරා දමන්නේ යැයි අගමැති රනිල් වික්‍රමසිංහ BBC මාධ්‍ය ආයතනයට කළ ප්‍රකාශය කවරෙකු නම් විශ්වාස කරයිද යන්න ගැටලු සහගත ය. එම තීන්දුව නිසා සිදුවන අවාසි සහ තුවාල අවම කර ගැනීමට කටයුතු කරමින්, ශ්‍රී ලංකාව පස් වසරක ණය විරාමයක් (5 year Moratorium ) ප්‍රකාශයට පත් කළ යුතු අතර. එම ණය නැවත ගෙවීමේ සැලැස්මක් ද සැකසිය යුතුය.

ණය ප්‍රශ්නය විචාරාත්මකව බැලිය යුතු වේ. David Greber නමැති සුප්‍රකට මානව විද්‍යාඥ ට අනුව,ණය ගෙවීමේ වගකීම ණය ගැනුම්කරුවාගේ වගකීමක් පමණක් නොවේ, ණය දෙන්නා ද වගකිව යුතුය. ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ සාකච්ඡාවේදී Eric Toussaint කරුණු තුනක් අවධාරණය කරයි.

පළමු වැනි කරුණ වන්නේ දුප්පත් රටවල් දරණ ණයෙන් සැලකිය යුතු කොටසක් අව්‍යාජක ණය (Illegitimate Debt) හෝ පිළිකුල් සහගත ණය(Odious Debt) වන්නේය යන්නය.කොටසක් විලෝපී ණය දෙන්නන් (Predatory Lenders) විසින් දෙන ලද ණය වේ. රාජපක්ෂ රෙජීමය යටතේ මෙන්ම යහපාලන රජය යටතේ ගත් ණයවල ස්වභාවය, ඒවායේ ප්‍රතිලාභ සහ ණයහිමි විලෝපිකයන් ගැන විමර්ශනයකින් තොරව ණය නැවත නොගෙවිය යුතුය.

දෙවනුව සියලු ආකාර ණය ප්‍රතිව්‍යුහගත කිරීම්වල වැඩි සහ අවසාන වාසිය ලැබෙන්නේ ණය ගත් රටට නොව ණය දුන් රටට, ආයතනයට, ව්‍යතිරේකයන් බොහෝවිට ජාත්‍යන්තර බල අරගලය හා බැඳී ඇති වූ ඒවා ය. (බටහිර ජර්මනිය, ඊජිප්තුව සහ ඉරාකය)

තෙවනුව ණය අර්බුදය කිසියම් ප්‍රමාණයකට ණයගැති රටට සාධාරණයක් වන ලෙස විසඳා ගැනීමට ජනතා ආණ්ඩුවක් (People's Government) අවශ්‍ය වේ. (ඉක්වදෝරය සහ බොලිවියාව)

මේ පියවර නිසා විය හැකි තුවාල, ජාතික ආර්ථික ප්‍රතිපත්ති මගින් ද අවම කරගත හැක. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හවුල් කරගෙන කරන ණය ප්‍රතිව්‍යුහකරණය, ජාතික ආර්ථික දේහයට ඇතිකරන තුවාල වඩා ගැඹුරට ගිය ඒවා වෙන්නට බැරි නැත. (ආජන්ටිනාවේ අත්දැකීම් ගැන කියවන්න)

ජාතික ආර්ථික සැලැස්මකට සම්බන්ධ කොට කළ යුතු වෙනස්කම් මොනවාද?

**02. ඩොලරයෙන් දුරස්ථ වීම** (De-Dollarization):

ගෝලීය ආර්ථිකය පසුගිය දශක හතර තුළ ලොකු වෙනසකට ගමන් ගත්තේ ය. චීනය ඇතුළු BRICS (බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය සහ දකුණු අප්‍රිකාව) රටවල නැගීම නොසලකා හැරිය නොහේ. අප රටේ වර්තමාන අපනයන ගලනය සහ එහි දිශාන්තිය එසේම තිබේ යැයි නො සිතිය යුතු ය. නව වෙළෙඳපොළවල් අප ආකර්ෂණය කර ගත යුතු වේ. අනෙක් පැත්තෙන් අපේ ආනයන බොහොමයකට ඩොලරය අනිවාර්ය කොන්දේසියක් නොවේ. මේ අනුව වෙළඳාමේ දීත් සෙසු ජාත්‍යන්තර ගනුදෙනුවලදීත් සංචිත පවත්වා ගැනීමේදී ඩොලරය සමඟ එල්ලී නොසිට රූබල්, යුවාන්, යෙන්, අරාබි රටවල මුදල් මෙන්ම ඉන්දියානු රුපියල් ද යොදාගත යුතුවේ.

**03. ගෙවුම් ශේෂයේ වර්තන ගිණුම් හිඟය සහ ආනයන ආදේශනය:**

මෙහිදී අප ආදේශනයන් දෙකක් ගැන සැලකිලිමත් විය යුතු වේ. පළමුවැනි ආදේශනය වන්නේ මෙරට දී සහේතුක පිරිවැය යටතේ නිපදවිය හැකි දේ ආනයනය කිරීම වළක්වා දේශීයව නිපදවීම ධෛර්යමත් කිරීම මෙන්ම පොකුරු කර්මාන්ත (Cluster Effect) සංකල්පය යටතේ දේශීය සැපයුම් දාමය(Local Supply Chain) ශක්තිමත් කිරීම ය. දෙවනුව, පාරිභෝගික සහ අතරමැදි ආනයන වෙතින් ආයෝජන භාණ්ඩ ආනයනයට නැඹුරු වීම අවශ්‍ය වේ. මේ අනුව ආනයන බිල ඉදිරි පස් වසර තුළ ඩොලර් බිලියන 18-22 පරාසයකි එහි පවත්වා ගැනීමට සැලසුම් කිරීම ඇවැසි වේ. ළදරු කර්මාන්ත (Infant Industries) සහ ආරක්ෂණ ප්‍රතිපත්තිය තරගකාරී ශක්තීන්ගෙන් යුතු නිෂ්පාදනයකට බාධාවක්ය යන තර්කය ප්‍රත්‍යක්ෂ මූල සාක්ෂි මගින් සනාථ කෙරේ. කෙසේ වුවද ආරක්ෂණය කාල සටහනකට යටත් කිරීමෙන්, එවන්නකට ඇති ඉඩකඩ ඇහිරිය හැක.

**04. ගෙවුම් ශේෂයේ වර්තන ගිණුම සහ අපනයන ප්‍රතිපත්තිය:**

සංවර්ධන රාජ්‍ය න්‍යාය මත පිහිටා කෙරෙන නිර්ණායනාභිමුඛ කාර්මික සංවර්ධනයක අවශ්‍යතාව බැහැර කළ නොහැක්කකි. මෙහිලා කෙටිකාලීනව අපනයන කර්මාන්තයන්හි දේශීය වටිනාකම් එකතු කිරීම් වර්ධනය වඩාත් යථාර්ථවාදී වේ. කෙටිකාලීනව, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කළ හැකි වෙනස්කම් බොහෝය. A2 කිරි නිෂ්පාදනය සහ ස්වභාවික ගොවි නිෂ්පාදනය සහ ධීවර කර්මාන්තය නඟාසිටුවීම අලුතින් සැලකිල්ලට ගත යුතු කරුණකි මෙම කරුණ ගොවිබිම් අස්වාමිකකරණයට (Accumulation Through Dispossession) මෙන්ම ප්‍රාග්ධනය විසින් ගොවියා උපග්‍රහණයට (Sub Sumption Of Labor By Capital) ලක් කිරීම වළක්වන කෘෂිකාර්මික නිෂ්පාදන මාදිලියේ (Agricultural Mode Of Production) වෙනස්වීමක් යටතේ මෙන්ම සාකච්ඡා කිරීම සහ බිම් මට්ටමේ නිෂ්පාදන සංවිධාන ව්‍යුහයක් ඇති කිරීම අත්‍යවශ්‍ය වේ.

**05. විනිමය අනුපාතිකය:**

කුඩා ආර්ථිකයක් ලෙස ශ්‍රී ලංකාවට තනිව විනිමය අනුපාත ප්‍රතිපත්තියක් පවත්වා ගත නොහැක. රටේ සංවර්ධනයෙහි ලා ස්ථාවර විනිමය ප්‍රතිපත්තියක් යෝග්‍ය වුවද එය කළ නොහැක්කකි. එසේ වුවද එහි උච්චාවචන අවම කරනු වස් කාල් මාක්ස් විසින් යෝජිත මුදල් පිළිබඳ භාණ්ඩ නියාය(Commodity Theory Of Money)මත පිහිටමින් රුපියලේ අගය නිර්ණය කොට උච්චාවචනය වීමට පාවීමට ඉඩ හැරීම වඩාත් යථාර්ථවාදී ය.

දේශීය ආර්ථිකය විශාල ව්‍යුහාත්මක වෙනසක් කිරීම අනිවාර්යය වේ. එහිලා කළ යුතු යෝජනා සමහරක් පහත දක්වන්නෙමු.

**බදු ප්‍රතිපත්තිය**

01. වර්තමානයේ සෘජු සහ වක්‍ර බදු අතර අනුපාතය 16:84 කි. රාජ්‍ය ආදායම් නිර්ණය කිරීමේ දී මෙය වක්‍ර බදු මත රැඳි මේ ප්‍රවණතාව ආපසු හැරවිය යුතු වේ. වසර දෙකක කාලයක් තුළ මේ අනුපාතය 40:60 අනුපාතයට ගෙන ඒමට පියවර ගැන්ම

02. මෙහිලා වර්තමාන ආදායම් බදු ක්‍රමය අනුක්‍රමික බදු ක්‍රමයකට හැරවිය යුතු වේ. ආදායම් ප්‍රවාහයකි. ඒ හැරුණු විට ධනවත් බද්දක් හඳුන්වා දිය යුතුය.

03. බදු ක්‍රමයේ ප්‍රතිසංස්කරණය කිරීමේ ආරම්භක පියවරක් ලෙස

A. පුද්ගල වාර්ෂික ආදායම රුපියල් 1,200,000 වැඩි සෑම ආදායම්ලාභියකු ම බදු ගෙවිය යුතු වේ.

B. රුපියල් 1200000-2400000 දක්වා බදු ප්‍රතිශතය සියයට 10ක සීමාවේ තබාගත හැක. 1200000 අඩු ආදායම්ලාභීන් බදු ගෙවිය යුතු නොවේ.

C. රුපියල් 2400000-4800000 සඳහා ආදායම් තලයට බදු ප්‍රතිශතය සියයට 20 කි. එවිට 4800000 ක ආදායම්ලාභියකු ගෙවන බද්ද රුපියල් 24,000+ 48,000=72,000 කි

D. රුපියල් 4,800,000-7,200,000 ආදායම්ලාභීන්ගේ අවසාන ආදායම් තලයෙන් සියයට 40ක බද්දක් අය කෙරේ.

E.7,200,000 සිට 9,600,000 තලය සඳහා බදු ප්‍රතිශතය සියයට 60 ක් වන අතර එය රුපියල් 12,000,000 ඉක්මවන කාලයෙන් සියයට 65ක් බදු ලෙස අය කෙරේ.

04. උපයන විට බදු අයකරන අතර, යැපෙන්නන් ගණන, හදිසි රෝගාබාධ, ළමයින් ගේ අධ්‍යාපනය වැනි කරුණු මත පදනම්ව, ඔබ අවසන බදු යළි ලබා ගැන්මකට ආදායම් ලාභීන්ට ඉඩක් සැලසේ.

05. ධනය මත පදනම්ව බද්දක් නියම කෙරේ. කෙනෙකුට හෝ පවුලකට නිවෙස් හෝ වාහන හෝ ඉඩම් හෝ වෙනත් ධනයක් හෝ කිසියම් පැනවෙන සීමාවට වැඩි හිමිකමක් ඇත්නම් එම අතිරේක ධනය සඳහා ධන බද්දක් අය කෙරේ.

06. බැංකු, රක්ෂණ, ඉඩම් හා නිවාස ගනුදෙනු වැනි රාජ්‍ය සංස්ථා හා පෞද්ගලික ව්‍යාපාර ආයතනවල ලාභයෙන් ප්‍රතිශතය සැලකිල්ලට ගෙන සෘජු, ලාභ බද්දක් අය කෙරේ. විදේශ ආයතනවලින් බදු අයභාරයක් අය කෙරේ.

07. කාර්මික හෝ කෘෂිකාර්මික නිෂ්පාදන ආයතන ලාභය එක්කෝ බද්දෙන් නිදහස් කෙරේ. නැත්නම්, සියයට 5කට අඩු බද්දකට යටත් කෙරේ. ලාභයේ ප්‍රති ආයෝජන කොටස බද්දෙන් සපුරා නිදහස් කෙරේ. මෙය විදේශ ආයෝජන සම්බන්ධයෙන් ද ඒ අයුරින්ම ක්‍රියා කෙරේ.

08. පරිවහන (දුම්රිය සහ බස්, ජලය) සේවා බදුවලින් නිදහස් කරන අතර විදුලිය, ඉන්ධන, ගුවන් සේවා වැනි අංශවලින් බද්දක් අය කෙරේ.

09. රේගු බදු ප්‍රතිපත්තිය රටේ සාර්ව ආර්ථික සැලැස්ම මගින් නියම කෙරෙන රාජ්‍ය වෙළඳ ප්‍රතිපත්ති අනුව සැකසේ.

10. ජනයාගේ මූලික ම පරිභෝජන භාණ්ඩ (සහල්, තිරිඟු පිටි දියර, කිරි වැනි) වක්‍ර බදුවලින් නිදහස් කෙරේ.

11. නව තාක්ෂණය සහ ඩිජිටල් ක්‍රමය මත රැඳි පවතින තරුණ තරුණ ව්‍යවසායකත්වයන් ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය බදු සහන ලබාදීම පරිගණක සහ තොරතුරු තාක්ෂණය, කලාව සහ අධ්‍යාපන සහ අන්තර්ජාලය මත කෙරෙන අලෙවි කටයුතු සඳහා විශේෂ අවධානය යොමු කිරීම.

**බැංකු ක්‍රමයේ සංශෝධන**

ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රමය වර්ධනය වී ඇත්තේ ජාතික නිෂ්පාදනය අරමුණ කර නොවේ. මහජන බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව ආරම්භක අරමුණුවලින් අපහරණය වී ඇත මෙනිසා රජය සතු තව බැංකු දෙකක් අවශ්‍ය වේ.

01. ජාතික සංවර්ධන බැංකුව: දැනට ක්‍රියාත්මක වන සියලු පෞද්ගලික සහ රාජ්‍ය සංවර්ධන බැංකු ඒකාබද්ධ කොට පිහිටුව යුතු මේ බැංකුව යොදා ගනිමින් ප්‍රාග්ධනය ගලා යන දිශාන්තිය මේ මගින් හැසිරවිය හැකි වේ.

02. ආනයන අපනයන බැංකුව: සියලු ජාත්‍යන්තර මුදල් ගනුදෙනු සිදු කෙරෙන්නේ මෙම බැංකුව මගින් හෝ එහි ලියාපදිංචි වාණිජ බැංකු මගිනි. අවසාන වශයෙන් කිව යුත්තේ ජාතික සංවර්ධන සැලැස්මක් මගින් ආර්ථිකය මෙහෙය වීම අනිවාර්ය වන බවය. මෙම අර්බුදය අපට උගන්වා ඇති වැදගත්ම පාඩම නම් සැලසුම් නොකරන ලද අඩු සංවර්ධිත ආර්ථිකයක් මුහුණ දිය හැකි ඛේදජනක ඉරණමයි.

සංවාදය - දුෂ්‍යන්ත පතිරණ

මහජන "ඇස" දිගුකල් දිනේවා !


ඇල්ෆ්‍රඩ් රාමනායක
සභාපති
ශ්‍රී ලංකා මහජන පක්ෂය


ජීවන්ත දිසානායක
නියෝජ්‍ය ලේකම්/
කොළඹ දිස්ත්‍රික්
ප්‍රධාන සංවිධායක


රොෂාන් ද මෙල්
නියෝජ්‍ය සභාපති/
රත්මලාන ආසන
ප්‍රධාන සංවිධායක


මිල්ටන් ගුණරත්න
සහකාර ලේකම්/
හෝමාගම ආසන
ප්‍රධාන සංවිධායක


රුවන් හේවාවිතාරණ
කොලොන්නාව ආසන
ප්‍රධාන සංවිධායක


රංජිත් පෙරේරා
කොළඹ දිස්ත්‍රික්
සංවිධායක

ඇතුළු කොළඹ දිස්ත්‍රික් ප්‍රගතිශීලී ජනතාව




ඇගේ හී ගඩු පිපෙන වැහි හීගතුව හන්දා කෝපි කෝප්පයක් බිව්වොත් මසුරං කියල හිතිල දවසක්දා හැන්දෑකොරේ මං ගොඩවුණා බොලල්ලා අබරං ගොයියගෙ වෙලේ කඩේට. කුසුම කෙල්ලට කියල කෝපි ඇබින්දක් වක්කොරගන්න ඇහැක් වුණත් ආයිබොවං මට මහ මොකක්ද වගෙ අවේලාවෙ එකේකේව ඉල්ලන්න, ඒකිටත් කොරන්න තියෙන වැඩ කන්දරාව දැක්කාම. ඉතිං මං කඩේ මිදුලට ගොඩවුණා ඉතරයි මේ වැහි බීරුමේ කඩ මිදුලෙ බිලිං ගහ යට සේතං එක්ක දාං ඇද ඇද හිටපු ගබං ගොයිය හිටිගමං නැගිට්ට නොවැ, "මූත් එක්ක බෑ ආතෙ, මූ හොර කොරනව. බැලූ නොබැලූ ඇහිල්ලෙ මගෙ ඉත්තො උස්සනවා" කියලා. "උඹලට අපි ඉත්තෙක් සෙල්ලමට උස්සන එක තමා පේන්නෙ. මහ උන් කෙල කෝටි ගණන් උස්සන ඒවා පේන්නේ නෑ" කියල සේතං කියාපි. අනේ අම්මප මුගෙ කටකැඩිච්ච කතා. ඕකා කට ඇරියොත් ඔහොම්මමයි, ඔපාවක්මයි කියන්නෙ. ඕකා ඕක කියැව්වෙ මටමයි කියලයි මට හිතෙන්නේ. මොකද මාත් අර හැටනම ලස්සෙන් එකෙක් කියන්න ඕකා සහසුද්දෙන්ම දන්නවා නොවැ. මාත් ඉතිං ඒක ඇහුන නෑහුන ගානට, "අබරං ළමයො, මටත් දාමුකො කෝපි කෝප්පයක්" කිව්ව. "ඇයි පුරං ආතේ, සව් බාගයක් එහෙම බිව්වොත් නාකයැ. ඔය පරසුද්දගෙ කෝපි ජරාවට වඩා සැරීරෙටත් හොඳයිනෙ" කියල මූ ආයි කියාපි. අනේ අම්මාපල් මට මුගෙ හොම්බ කට සමතලා කරන්න හැටියක් නැති හැටි, ආයි ඕවගෙ කඩප්පුලි කතා නොකියන්ඩ. ඔය සව්බාගෙ දැකුමද මොකක්ද ඔය ඒ කාලෙ ගෝඨාභය මහත්තයගෙ ඡන්ද ව්‍යාපාරෙ නමටනෙ ඕකා ඔය මට ඇනෙන්න කෝචොක් කොළේ. මං හොරැහින් අබරං ගොයිය දිහා බැලුවම අබරං ගොයිය මූට රවපු හින්දද කොහොද මූ කට පියාගත්ත. නැත්නං ඕකගෙ ඔය දහදුරා කතා ඔතනින් නතර වෙන එකක්යැ. මං ඉතිං මයෙ පාඩුවෙ කෝපි උගුරක් කටට අරගෙන බංකුවෙ ඈඳිගත්තෙ, අම්මපා අබරං ගොයියගෙ කෝපි කෝප්පෙට ගහන්න කෝපි වැක්කෙරිල්ලක් කොරන්න අපේ ගමේ කොයියම්ම බවලෙතෙකුටවත් බෑයිය කියල හිතන ගමං.

ඉතිං ආයිබොවං බංකුවෙ පතබෑවිලා දෙවෙනි කෝපි උගුර කටට ගන්නවත් එක්කම හරියට මී ගොං වස්සෙකුගෙ තප්පුලෑමට වල් බල්ලෙකුගෙ උඩු බිරිල්ලක් එකතු වුණා වාගෙ සද්දයක් පාර පැත්තෙන් ඇහිච්චි. තව ඩිංගෙන් කෝපි උගුරත් ඉස්පෝල්ලෙ යනව ගැස්සුණු ගැස්සිල්ලට. මං දනිපනි ගාල නැගිටගන්නත් කලින් අබරං ගොයියයි සේතනුයි ගබනුයි තුන්දෙනාම මිදුලට බැහැල බලාපි සද්දෙ මොකක්ද කියලා. ඕං ඒ එක්කම ඒ සද්දෙන්ම මොකක්ද හීපදයක් වගේ එකක් කියනව ඇහුන හන්ද මාත් පොඩ්ඩක් විපරමෙන් බැලුවා ආයිබෝවංඩ අහවල් නාඩගොමක්ද කියලා. තමුන්නැහැලට කියන්ඩ එකෙක් 'සබඳ අපි කුදු නොවෙමු' කියල තප්පුලන සද්දෙන් කියන කොට අනිකා 'උණත් පරයා නැගෙන' කියල උඩුබිරුම් සද්දෙන් කියාගෙන කවුද වසවසරතියො දෙබානක් අල්ප දයන්න වගේ වකුටු වීගෙන කඩේ මිදුලට ගොඩවෙච්චි. මුන් දෙන්නගේ කොම්බු දෙකක් වාගෙ වකුට්ට හින්ද මූණත්තහඩු දෙක මහපොළොව පැත්තට හැරිලනෙ. ඉතින් මුන් කවුද කින්ද මන්දා කියල අඳුරගන්න අමාරු හන්ද මං අබරං දිහාට හැරුන ඌවත් ඇඳින්නද බලන්න. අබරං ගොයියත් ඇස් දෙක ගොබළු ගෙඩි දෙකක් වගේ කොරං බලන් ඉන්න කොට මෙන්න වසවසර්තියො දෙන්න කඩපිලට ගොඩ වෙලා ඔළු ගෙඩි ඉස්සුවයි කියහල්ලකො. මගෙ දෑහෙ පෙනීම අඩු හන්ද මට මුන් දෙන්නව හරියට පෙනුනෙ නෑ නෙව නිකං ඇළිරි පාටට මිසක්. ඒ හන්දා මං, "කවුද බොලං අර රත්තරං කපුගේ මහත්තයටත් අවමාන කොරන මේ වසවරතියො" කියල අබරං ගොයියගෙන් අහල කට ගන්ඩ හම්බු වුණේ නෑ, " වෙන කවුද ඉතිං අබරං ආතගෙම මුණුපුරයි උගෙ අතීසාර මිත්තරය ඇට්ටරයයි මිසක්කා" කියල ඌ කියාපි. ඒක අහපු ගමන් මට හිතුනෙ කෝපි බොන්ඩ ඇවිල්ල මං කොරගත්ත මෝඩකොමක් කියල. වෙනේකක් හන්ද නෙවෙයි මයෙ මුණුපුරා විමුත්තියා, ඕක කට ඇරියොත් මට නුහුරටමයි කතා කොරෙන්නේ. ගෙදරදියි පිටදියි කියල ඕකට වගේ වගක් තියෙන එකක්යැ. ඕක ඉපදිච්ච වෙලාවෙ අපේ කෙලී ඕකට විමුත්ති කියල නම දැම්මහම මං ඉන්තේරුවෙන්ම විරුද්ධ වුණා, ඔය ලොකු ලොකු අයගෙ නං අපේ ඇච්ච බැච්චන්ට දාන එක හරි නෑ කියල. අර චන්ද්‍රිකා නෝනගෙ පුත්තරයගෙ නමත් විමුත්තිද කොහෙදනෙ. ඕක ඒක දැනගෙන ද දන්නෑ හැමවෙලේම මාත් එක්ක පටලැවෙන්නෙ.

ඉතිං මුන් දෙන්න කඩේට වැදිල බංකුවක ඈඳි ගන්ඩ හම්බ වුණේ නෑ සේතං අහපි, "ඉලංදාරි දෙන්න කොහෙ ගෙහුං එන ගමන්ද?" කියලා. "අපි ගියානෙ මාමෙ මහින්ද මහත්තේලෑ පොලිටිකල් ඇකඩමියට. නායකත්ත පුහුණුව බලන්ඩ" කියල අපේ එකා උත්තර දුන්නෙ මා දිහෑ හොරැහින් බලන ගමන් කියල මට තේරුණා. හැබැයි ආයිබෝවංඩ මට ඌ කියපු මෙලෝ දානයක් තේරුණේ නෑ. කලට්පොල් කඩන්ඩ ගියා වගේ එකක් තමයි මට ඇහුනෙ. අම්මපා! ඉතිං මූ තව මොනව කියයිද කියල මාත් කට ඇරං බලන් ඉද්දී, "මං මේ කල්පනා කොලේ සේතං මාමෙ, ලොකු බේබි ඉද්දී අනිත් උන්ට නායකත්ව පුහුණුවක් දීලා අහවල් කෙං ගෙඩියක් කොරන්ඩද කියලා. ඇයි ඉතිං බේබිලා ඇරෙන්ඩ වෙන එහෙකුටවත් නායකයො වෙන්ඩ පුළුවනෑ" කියල ඇට්ටරයා කියාපි. සේතංටත් මදෑ ඒක. ඌත් අපේ විමුත්තියා වාගෙ පරතිගාමියා නොවැ. "ඇයි විමුත්ති පුතේ, බදු වංචා කොරන හැටි කොමිස් ගහන හැටි උගන්නන්නෙ නැතුවැයි ඔතන ?" කියල මූ ඇහුවනෙ ආයිබොවංඩ. "නැතුව... නැතුව... උගන්නයි ... උගන්නයි... බැඳුංකර වෙන්දේසි කොරන හැටි ගැන උගන්නන්න රනිල් මහත්තය ගෙන්නයි මහිතේ." කියල අපේ විමුත්තිය උත්තර දුන්න ඒකට. "මට නං තොපි කියන කිසි දෙයක් තේරෙන්නේ නෑ බොලව්. කියන මල ඉලව්වක් තේරෙන බාසාවකින් කියාපියව්කො" කියල මං අන්තිමට කිව්වෙ ඉවසල ඉවසල බැරිම තැන. "ඔව්වොව්..., උඹලට නං මේ සම්මජ්ජාතියෙ දි ඔච්ච තේරුම් කොරන්ඩ බෑ තමයි ආතෙ." කියල ඇට්ටරය කිව්වාම මට අසූහාරදාහට නැග්ග ආයිබොවංඩ. ඒ වුණාට ඒ වගක් නොපෙන්නා "තොපි කියාපියව්කො ඉතිං දැන් තොපි දෙන්නා එනකොට කොඳු නාරටි දෙක කොම්බු දෙකක් වගේ නවාගෙන බැරි බැරි ගාතෙ ආවෙ මොකොද කියල.

තොපි දෙන්නගෙ ඔය කඩප්පුලි කතාවලට හම්බුනා නේද කාගෙන් හරි කොඳු හරහා ඇඹුල් පොල් පිති පාරක්. තොපි හැංගුවට මං ඉත්තේරුවෙන්ම කියන්නං වෙච්චි සංගෙදිය." කියල මං කිව්වාම මුං දෙන්න මට නක්කලං හිනාවක් හේම දාලා, "අපි එදා ගියානෙ ආතෙ රනිල් මහත්තේලෑ සංවත්සරේට. ආතලට ලේසි වෙන්නෑ ඕ රනිල් මහත්තයා සෙන්චරියක්ම ගහන්ඩයි හදන්නෙ. දෙදාස්හතලිස් අටේ රට සුවයංපෝසිත කොරනවා කිව්වේ" කිව්වනෙ. මුන්ගෙ අණ්ඩර දෙමළ කතා අහන් ඉන්ඩ හැරීම තැන" කියන මලඉලව්වක් තේරෙන බාසාවෙන් කියාපියව්කො. අනික ඉතිං තොපිනෙ බොලව් අරගොලයක්ද මොකක්ද කොරල උන්නැහැව ගෙනාවෙ. ඒකනෙ උන්නැහැ ජනාදිපොති වුණා ඉතරයි. තොපි හාවක් හූවක් නැතිව කූඩාරං ටිකත් අකුලගෙන හීංසැරේ පල්ලං බැස්සෙ. ඒ ඉතරක්යැ. ආන් තොපි ගෝල්ෆීස් පිටියට කොරාපු අලාබෙ මිලියන ගානක්ලු." කියල මං කිව්වහම "සිරිපාල මහත්තයද ආතෙ කිව්වෙ. අර ජපානෙ තානාපති කියාපු ගාන ගැන එහෙම මොකුත් කිව්වෙ නැද්ද ආතෙ? කියල මූ කියාපි. අම්මප මං කියන කියන එකට කියන්ට එකක් තියෙනවනෙ මූට. "ඇයි වසවරතියො අර කොමිසමෙන්ද මොකෙන්ද එකෙන් උන්නැහව නිරදෝස කළා නේද යකෝ. අනිවාරතේ මනුස්සයින්ට අපහාස නොකරන්නෙ තොපිට නුහුගුණ මයෙ හිතේ." කියල මං කිව්වාම, "නිදොස් කොට නිදහස් නං අයෙ ඉතිං නතිංනෙ මේ කාලෙ ආතෙ. ඇරත් තමුන්ට ඕන උං පත්කොරගත්තාම" කියල මූ අහක බලාගෙන කිව්වනෙ. මුන් මොනව කියනවද මට තේරුන්නෑ ආයිබෝවංඩ. මුන් එක්ක කතා කොරනොවට වැඩිය හොඳයි පාඩුවෙ විටක් හපාන ඉන්න එක කකිකියල හිතිල මං ඉලත්තට්ටුව ළං කොරගත්ත.

ඩිංගක් වෙලා කට පියාන හිටපු මූ ආයෙ මං දිහාට හැරිලා, "ඕක ආතෙ මීට පස්සෙ ආතලට නිවං දකින්න දිව්ය ලෝකෙ යන්ඩ අවුරුදු ගණන් පෝයක් පෝයක් ගානෙ කට්ට කාගෙන සිල් සමාදං වෙන්ඩ ඕනැන්නෙ නෑ" කියලා කියාපුවාම මගෙ කේන්තිය එහෙම පිටින්ම නිවිල ගියා ආයිබොවංඩ. අම්මපල්ල මට හිතුණා මුන් අර වගෙ කඩප්පුලි කතා කිව්වට දර්ම කාරණා ගැනත් යමක් දන්නවනෙ කියලා. ඉතිං මේ දරම කාරණාව තේරුං බේරුං කොරගන්න ඕනැ හැනිද මං මුගෙන යාප්පුවෙන් ඇහුවා, "ඒ කොහොම කියලා කියාපංකො පුතේ. මටත් ඒ කෙරෙමෙ මොකක්ද කියල දැනගත්තාම ලබන පෝයට සිල් ගන්ඩ ගිහිං උපාසක ඇත්තටන්ටත් කිව්වෑකිනෙ. අනේ සාදු! ඒ පිනම ඇති උඹටත් දිව්ය ලෝකෙ යන්ඩ" කියල. ඒ ගමන මූ රැල් බුරුල් ඇරල හෙම," ඇයි ආතෙ අර නෙළුං කුළුණ තියෙන්නේ. ඒකෙ උඩට ගියාම තව්තිසාවට අත දික්කොලා වාගෙලුනෙ. අර උන්නාන්සෙ කෙනෙක දේසනා කොළේ. ආතට තියෙන්නේ රුපියල් පන්සීයක් දීල ටිකෙට් එකක් අරං කුළුණු උඩට නැගල සිල් රෙද්ද එහෙම පිටපොට ගහල හිමිං සැරෙ තව්තිසාවට මාරු වෙන එකනෙ. ආච්චිවත් එහෙදි හම්බ වෙන්නෙ නැතෑ" කියපි. අම්මප මගෙ මූලග්ගින්න නැග්ග නැගිල්ලට අතට අහුවෙච්ච හැරමිටියෙන් දීල ඇද්ද ඕකගෙ දට්ටික බඩට යන්න. කොහෙද එතකොටත් ඌ දාං ලෑල්ල ළඟ ඉඳගෙන හිටපු සේතංගෙ කරටත් උඩිං පැනල පාරටත් ගොඩ වෙල ඉවරයි නෙවැ.

**පුරං සිංඤ්ඤෝ**

අපෙන් ඔබට ගෙයක් අතට...
**Saman house and construction**
SAMAN HOUSE AND CONSTRUCTION
SHAC
Reg.No: 42/2083 CIDA/REG/14/20653
වාස්තු විද්‍යානු කූලව
**නිවාස සැලසුම් සහ ඉදිකිරීම්**

නිවාස සැලසුම්
**HOUSE PLAN**

නගර සභා ප්‍රාදේශීය සභා අනුමැතිය
**MIUNICIPAL AND COUNCILE APPROVAL**

ඉදිකිරීම් සේවා සැපයීම
**HOUSE CONSTRUCTION**

නිවාස ඇස්තමේන්තු සැකසීම
**HOUSE ASTIMATE [BOQ]**

ත්‍රිමාණ සැලසුම්කරණය සහ සජීවීකරණය
**3D PLANING AND VISUALIZATION**

නිවාස ණය සඳහා අනුමතිය
**APPROVAL FOR HOUSE LOANS**

**072 - 809 4808 / 071 - 574 7333**

# ශ්‍රී ලංකා මහජන පක්ෂයේ ගමන් මග

**ආචාර්ය රංජිත් නවරත්නයන්ගේ ග්‍රන්ථයක් ඇසුරෙනි**

ශ්‍රී ලංකා මහජන පක්ෂය 1984 ජනවාරි මස 22 වන දින උත්කර්ශවත් ලෙස ස්වකීය ආරම්භය සනිටුහන් කරන ලදී. එදා සිට මේ දක්වා තිස්පස් වසරක් පුරා අප පක්ෂය ජාතික දේශපාලන බිමේ අනේකවිධ දුක්වේදනා අභියෝග හා බාධක මැදින් අතිශය දුෂ්කර ගමනක යෙදුනු බව ඔබ සැම දන්නා කරුණකි. මෙම දුෂ්කර ගමනේ දී අපට විඳින්නට සිදු වූ දුක්ගැහැට, කරදර, හිංසා පීඩා, නොසළකා හැරීම් අතිමහත්ය. අපට සිදු වූ පිරිමසා ගත නොහැකි බරපතල පාඩු මෙතෙකැයි කියා කිව නොහැක. ඒ අතර අපට කිසිදා අපට අමතක කළ



නොහැකි හානි සිදු වූ කාල වකවානු වනුයේ 1988-1989 භීෂණ සමය බව ඔබ අප දන්නා කරුණකි. පක්ෂයේ නිර්මාතෘ විජය කුමාරතුංග ශ්‍රීමතාණන්, පක්ෂයේ අනුශාසක පූජ්‍ය පොහොද්දරමුල්ලේ ප්‍රේමාලෝක නාහිමිපාණන්, තරුණ සංවිධාන නායක දේව බණ්ඩාර සේනාරත්න, ගොවි නායක ටී. බී. විජේසූරිය සොයුරාණන් ඇතුළු 117 දෙනෙකු ඝාතනය කිරීම අපට සිදු වූ බරපතලම හානිය බව අවිවාදයෙන් යුතුව පිළිගනු ඇතැයි සිතමි.

මේ මොහොතේ රට තුළ පවත්නා දේශපාලන සමාජය ආර්ථික තත්ත්වයන් සම්බන්ධයෙන් ඔබ සැමගේ සුවිශේෂි අවධානයක් යොමු කළ යුතු බව අනිවාර්ය වන නමුදු අප පක්ෂයේ ආරම්භය හා විකාශය පිළිබඳව සැකෙවින් හෝ අදාළ කරුණු සහ තොරතුරු ඔබ වෙත ඉදිරිපත් කොට අපගේ තිස්පස් වසරක අභිමානවත් ඉතිහාසය පිළිබඳව සිහිපත් කිරීම ප්‍රයෝජනවත් වනු ඇතැයි මම විශ්වාස කරමි. වර්තමානය නිවැරදිව අවබෝධ කොට ගැනීමට මෙන්ම අනාගතය සඳහා අපගේ දේශපාලන ක්‍රියාකාරකම් විධිමත්ව සැලසුම් කිරීමට ද ඉතිහාසයේ අත්දැකීම් අපට යහපත් පදනමක් ලබාදෙනු ඇතැයි යන්න මගේ විශ්වාසයයි.

1977 දී පවත්වන ලද මහ මැතිවරණය ශ්‍රී ලාංකික දේශපාලන ඉතිහාසයේ තීරණාත්මක මැතිවරණයක් විය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු වමේ පක්ෂ අන්ත පරාජයකට පත් වූ අතර ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ පමණක් උතුරු නැඟෙනහිර ප්‍රදේශවල ආසන සංඛ්‍යාවක් දිනාගන්නා ලදී. පාර්ලිමේන්තුවේ 5/6ක බලයක් ලබාගත් එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු බලය ලබා ගැනීමත් සමඟ ම විරුද්ධවාදීන්ට එරෙහිව ප්‍රචණ්ඩ මර්ධනයක් මුදාහළේය. එලෙස ප්‍රතිෂ්ඨාපනය වූ එ.ජා.ප. බලය ජේ.ආර්. ගේ නායකත්වය යටතේ මෙතෙක් අප රට මුහුන නොදුන් ආකාරයේ පාලනයක් දියත් කරමින් ජනතා විරෝධි වැඩ කටයුතු රාශියක්ම සිදු කළේ ජේ.ආර්. යටතේ පහත සඳහන් කාරණා රටට එරෙහිව සිදු විය.

01. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව වෙනස් කොට විධායක බලය සහිත ජනාධිපති ක්‍රමයක් ස්ථාපිත කරන ලදී. පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය වෙනස් කරමින් මනාප ක්‍රමයක් මත පදනම් වූ සමානුපාතික නියොජන ක්‍රමය ඇති කරන ලදී. අපගේ දේශපාලනයේ අප විසින් භුක්ති විඳින බොහෝ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සැලසුම් සහගතව කපා දමන ලදී. අසත්‍ය චෝදනා ඉදිරිපත් කරමින් එවකට ශ්‍රී ල නි ප නායකත්වය වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහිමි කරමින් ඒකාධිපතිත්වයක් කරා යාමට අවශ්‍ය කරන මංපෙත් සියල්ල විවෘත කරන ලදී.

ස්වයං පෝෂිත දේශීය ආර්ථිකයේ මුදුන් මුල් සියල්ල උදුරා දමා අපට නොගැලපෙන විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් නමින් ඊනියා සංවර්ධන ආර්ථික උපාය මාර්ගයක් හඳුන්වා දෙමින් රාජ්‍ය දේපොළ කුණු කොල්ලයට විකුණා දමා ශ්‍රී ලංකාව බහු ජාතික සමාගම්වල පාරාදීසයක් බවට පත් කරන ලදී. දේශීය කෘෂිකර්මය බිඳ වැටී ගොවියාට මහත් අභියෝගයකට මුහුණ පෑමට සිදු විය. වී ගොවිතැන, හේන් ගොවිතැන, අතුරු බෝග වගාව සහ පලතුරු වගාව වේගයෙන් කඩාවැටුණු බව ඔබ ද දන්නා කරුණකි.

03. දේශීය කර්මාන්තකරුවා නව දේශීය වෙළෙඳපොළේ පිරී තිබූ ආනයනික සරුව පිත්තල විසිතුරු භාණ්ඩ ඉදිරියේ අන්දමන්ද වීය. ගොවි කම්කරු සහ ධීවර ජනයා ප්‍රමුඛ රටේ නිෂ්පාදිතයේ උරුමකරුවන් වූ වැඩ කරන ජනතාව මේ ආර්ථික ක්‍රමය නිසා ජීවත්වීමේ බරපතල ප්‍රශ්නයකට මුහුණ පෑමට සිදු විය. 70 ලක්ෂයක් ජනතාව දිගු කලක් භුක්ති විඳි සහල් සලාක පත අහිමි කරමින් ජනතාව ඉමහත් පීඩනයකට ලක් කරන ලදී.

04. අවුරුදු දහස් ගණනක් තිස්සේ අපේ සමාජය තුළ පැලපදියම්ව තිබූ මනුෂ්‍යත්වය ආධ්‍යාත්මය කර ගත් අපට අනන්‍ය වූ සාරධර්ම සහිත අපේ ජාතික සංස්කෘතිය සෘනාත්මක විදේශීය සංස්කෘතික ආක්‍රමණයකට යටපත් කොට මුදල් පසුපස හඹා යන නව වාණිජවාදි සමාජ සන්ධර්භයක් ස්ථාපිත කරන ලදී.

05. ජාතික සමගිය බිඳ දමමින් ජාතීන් අතර වෛරය පතුරුවා දෙමළ බස කතා කරන ජනතාවට එරෙහිව ප්‍රචණ්ඩ මර්ධනයක් දියත් කරන ලදී. සංවර්ධන සභා මැතිවරණයේ දී ආසියාවේ ප්‍රධානතම පුස්තකාලය වූ යාපනය පුස්තකාලය ගිනි තබා එහි තිබූ වටිනා පොත් 95000කට වඩා විනාශ කරන ලදී. එහි දී ප්‍රචන්ඩ ක්‍රියා රාශියක් සිදු කළ එජාප මැරයන් යාපනයේ පාර්ලිමේන්තු මන්ත්‍රී යෝගේශ්වරන් මහතාගේ නිවස ඇතුළු නිවාස 200කට අධික සංඛ්‍යාවක් ගිනිතබා විනාශ කළ අතර එම ප්‍රචණ්ඩත්වය නිසා යාපනයේ ඡන්දදායකයින්



140,000කට තම මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතියක් වූ ඡන්දය දීමේ අයිතිය පවා අහිමි කරන ලදී.

මේ අනුව දේශපාලන ආර්ථික සමාජයීය හා සංස්කෘතික ක්ෂේත්‍ර සියල්ලෙන්ම රටට හා ජනතාවට දරා ගත නොහැකි තත්ත්වයක් ඉස්මතු වන්නට විය. අප පක්ෂය ආරම්භයට බලපෑ ප්‍රධානතම හේතුව වූ 1982 ජනාධිපතිවරණය ද මෙරට දේශපාලන ඉතිහාසයේ තීරණාත්මක මංසන්ධියක් සනිටුහන් කරන බව කිව යුතුය. එහිදී මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කර තිබූ නිසා ශ්‍රී.ල.නි.ප අපේක්ෂකයා ලෙස හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා ඉදිරිපත් වුව ද එතුමාට විරුද්ධව ශ්‍රී.ල.නි.පක්ෂයේ ඇතැමුන් විසින් අභ්‍යන්තරයේ දියත් කළ කුමන්ත්‍රණ හමුවේ වුවද මෙරට ප්‍රගතිශීලි ජනතාවගේ සහයෙන් ඡන්ද 25,48,438වක් ලබා ගැනීමට එතුමාට හැකිවිය. එතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් සියලුම කැපකිරීම් කරමින් රට පුරා ජනතාවට නායකත්වය දුන් විජය කුමාරතුංග, ටී. බී. ඉලංගරත්න, චන්ද්‍රිකා කුමාරතුංග, වයි.පී. ද සිල්වා, ඔසී අබේගුණසේකර, ආචාර්ය ප්‍රේමදාස උඩගම, දේව බණ්ඩාර සේනාරත්න, ආරියවංශ පතිරාජ, වී.ඩබ්. කුලරත්න වැනි නායක නායිකාවන් ජනපතිවරණ සටනේ අතිවිශාල කාර්යය භාරයක්

**ඉතිරි කොටස ලබන කලාපයට...**



වෂී 2022ක් වූ ඔක්තෝබර් මස 09 වැනිද ඉරිද


# "ඇස" පුනරාගමනයට විජය සැමරුමට උණුසුම් සුබ පැතුම්




## වඩාත් ජනතාවාදී පුවත්පතක් වේවා!

සිය තනතුර හා ප්‍රතිබද්ධිත වගකීම් සමුදායන් මනාව වටහාගෙන සැබෑ මානව දයාවෙන් දේශයේ උන්නතිය උදෙසා කටයුතු කළ සැබෑ මානව හිතවාදී දේශපාලන නායකයෙකු ලෙස ඉමහත් මහජන ගෞරවයට හා සම්මානයට පාත්‍ර වන විජය කුමාරතුංග ශ්‍රීමතාණන්ගේ 77 වන ජන්ම දින සැමරුම නිමිත්තෙන් මහජන පක්ෂයේ නිල පුවත්පත වන "ඇස" පුවත්පත නිර්මාණය කොට එළිදැක්වීමට කටයුතු කිරීම ප්‍රශංසාර්හ කටයුත්තකි.

ප්‍රවීණ සිනමාවේදියෙකු ලෙස ඉහළ ජනතා ප්‍රසාදයට පාත්‍ර වුණු විජය කුමාරතුංග මැතිතුමන් දේශය වෙනුවෙන් සිය යුතුකම් හා වගකීම් ඉටුකර ලීමේ සද් චේතනා පෙරදැරිව සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු, සිසු තරුණ යන සප්ත මහා බලවේගයන් ඒකරාශී කරමින් ශ්‍රී ලංකා මහජන පක්ෂය පිහිටුවා අද්‍යයතන ලාංකේය දේශපාලන ඉතිහාසය තුළ සුවිශේෂී කඩඉමක් සනිටුහන් කිරීමට සමත් වූ ප්‍රබුද්ධ දේශපාලකයෙකි. මානව හිතවාදී, ජන දුක පිළිබඳ සංවේදී දේශපාලකයෙකු ලෙස මෙන්ම ප්‍රවීණ රංගධරයකු ලෙස එතුමන් සිදුකරන්නට යෙදුණු සේවය ජනහදවත් තුළ සදානුස්මරණීය වන බව නොරහසකි.

මහනුවර උපෝෂිත පුෂ්පාරාම විහාරද්වයාධිපති,
**තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලභිධාන,**
මහාවිහාරවංශික ශ්‍යාමෝපාලි මහානිකායේ
මහානායක ස්ථවිරයන් වහන්සේ



## ජනතාවගේ ආදරය දිනාගත් විජය ඉතිහාස ගතවෙනවා

මානව හිතවාදී දිවංගත විජය කුමාරතුංග මැතිතුමාගේ 77 වෙනි ජන්ම දිනය නිමිති කරගෙන "ඇස" නමින් නිකුත් කරනු ලබන පුවත්පත දිනෙන් දින දියුණුවට පත් වේවායි ආශිර්වාද කරමි.

ශ්‍රී ලංකාවේ බිහි වූ අග්‍රගන්‍ය කලාකරුවෙකු මෙන්ම බේදයකින් තොරව ජනතාවගේ ආදරය දිනාගත් නායකයෙක් වශයෙන් ද විජය කුමාරතුංග මහතා ඉතිහාසයට එක් වී ඇත. සඟ, වෙද, ගොවි, ගුරු, කම්කරු, සිසු, තරුණ යන සප්ත බලවේගයන් ඒකරාශි කරගෙන කටයුතු කිරීමට එතුමා මහත් උත්සාහයක් ගත් බව ද ප්‍රසිද්ධ කාරණයකි. එතුමාගේ සේවය අගය කරමින් අනුස්මරණීය කටයුතු සිදු කරන මෙම අවස්ථාවේ විජය කුමාරතුංග මැතිතුමාට සංසාර විමුක්තිය ලැබේවා'යි ප්‍රාර්ථනා කරමි.

අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය
**මකුලෑවේ විමලාභිධාන**
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ
මහානායක මහා ස්ථවිර



## ඇස පුවත්පතට ශ්‍රී ලාංකික හින්දු ජනතාවගේ සුබ පැතුම් මෙසේ එක් කරමි.

මේ රටේ ජීවත්වන සාමාන්‍ය ජනතාව විඳින පීඩාවන් නිමා කිරීමටත්, උතුරේත්, දකුණේත් ශ්‍රී ලාංකිකයින් එක් රෑනකට රැගෙනවිත් සාමයේ ආලෝකයෙන් ඒ හදවත් එළිය කරන්නටත් දිවා රෑ නොබලා වෙහෙස වී, අවසානයේ ඒ අරමුණ වෙනුවෙන්ම සිය ජීවිතය කැප කළ දිවංගත විජය කුමාරණතුංග නමැති ශ්‍රේෂ්ඨ නායකයා පිළිබඳව මේ මොහොතේ සිහිපත් කරන්නේ මල් කළඹක් එතුමා නමට පුදමිනි.

වසර ගණනාවක් නිහඬව තිබූ ඇස පුවත්පත යළි අරඹමින් මේ රටේ දුක් විඳින ජනතාවගේ ඇස් ඇරවීම සඳහා ගන්නාවූ මේ ප්‍රයත්නය ඉතා අගය කොට සලකමි. එසේම විජය අරමුණු පණගන්වමින් මහජන පක්ෂයේ නව නායක අසංක නවරත්න මැතිතුමා කරනා මෙම උදාර මෙහෙවර දිනෙන් දිනම සාර්ථක වේවායි මේ ඓතිහාසික මොහොතේ ප්‍රාර්ථනා කරමි.

**ආචාර්ය ශිව ශ්‍රී රාමචන්ද්‍ර කුරුක්කල් බාබුශර්මා**
ලේකම් - ජාත්‍යන්තර හින්දු ආගමික සම්මේලනය



## සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමේ විජයගේ සිහිනය ජාතික ප්‍රමුඛතාවක්

ජනවාර්ගික ගැටලුවලට අවැසි විසඳුම් පිළිබඳ සාකච්ඡා කිරීමට දමිළ දේශපාලන නායකයන් හමුවීමට කටයුතු කළ ඔහු විදෙස් දමිළ නායකයන් සමඟ ද මේ සඳහා සමීප සබඳතා ගොඩ නගමින් කටයුතු කොට ඇත. මනු හදවත් දිනා ගැනීමට ඔහු සමත් වූ අතර මිනිසුන් ද ඔහුව දැක බලා ගැනීම පිණිස ඔහු ගිය සෑම තැනකටම ඔහුගේ දේශනවලට සවන් දීමට රැස්ව සිටියහ. ඔහු බහු වාර්ගික සමාජයක් ගොඩනැගීමට උත්සාහ කළ අතර වාර්ගික ගැටුම් සඳහා දේශපාලන විසඳුම් සෙවීමට කටයුතු කර ඇත.

බොහෝ නායකයින් සාර්ථක කර ගැනීමට අපොහොසත් වූ සහජීවනය හා යහපත් සමාජයක් ගොඩනැගීමට අප සියලු දෙනාටම ශක්තිමය හා ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන අතර නව මුහුණුවරකින් සමාජයට නිරාවරණය වීමට නියමිතව ඇති "ඇස" පුවත්පට ද සුබ පැතුම් එක් කරන්නෙමු.

**මුෆ්ති එම්.අයි.එම්.රිස්වි**
ගරු සභාපති
සමස්ත ලංකා ඉස්ලාම් ආගමික විද්වතුන්ගේ සභාව



## බේදයකින් තොරව සැමට සමානව සැලකූ නායකයෙක්

ශ්‍රී ලංකාවෙන් බිහි වූ දක්ෂ කලාකරුවකු මෙන්ම මානව හිතවාදී ජාති, ආගම්, කුල බේද කිසිත් නොසලකා ජනතාව සමඟ කටයුතු කළ දේශපාලන නායකයකු වන දිවංගත විජය කුමාරතුංග ශ්‍රීමතාණන්ගේ 77 වැනි ජන්ම දිනය වෙනුවෙන් අප සංවිධානයේ සුභාශිංසනය පිරිනමමු.

එමෙන්ම බේදයකින් තොරව සමස්ත ශ්‍රී ලාංකිකයින්ගෙ ආදරය නොඅඩුව දිනාගත් එතුමා විසින් ආරම්භ කළ ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නිල පුවත්පත වන "ඇස" පුවත්පත ද සාර්ථක වේවායි ආශිර්වාද කරමු.

**ආචාර්ය දේශමාන්‍ය**
**එම්.එම්. අබ්දුල්ලා මව්ලවිතුමා,**
සමස්ථ ලංකා සූෆි ආධ්‍යාත්මික සම්මේලනය



## විජය ස්වාධීන අභිමානවත් ලංකා පුත්‍රයෙක්


අපගේ කතා වස්තුව අප දේශයේ ඉමහත් භක්ත්‍යාදරයට හා ජනප්‍රියත්වයට පාත්‍ර වූ යුග පුරුෂයෙක් ලෙස නම් කරන්නට පිළිවන් අමරණීය කලා සම්ප්‍රදායක් ලෙසට ඈඳා ගැනීමට හැකි විජය කුමාරතුංග නම් අසහාය නළුවා හා සම්බන්ධ වේ. මෙහිදී කැපී පෙනනා එක්තරා ලක්ෂණයක් නම් ඔහු ඉතාමත් ස්වාධීනවත්, අභිමානවත් ලෙසත්, දුර දක්නා ඥණයෙනුත් කටයුතු කළ ලංකා පුත්‍රයෙකු ලෙස සඳහන් කළ යුතුම වීමය.

බොහෝ කරුණු කාරණා මේ ඔස්සේ ඉදිරිපත් කරන්නට හැකි වුවත් අවස්ථාවෝචිතව අපගේ අවධානය යොමු වන්නේ හා පුරා කියා යළිත් "ඇස" පුවත්පත කාලානුරූපීව ප්‍රකාශයට පත් කිරීම පිළිබඳවය.

එය අද රටේ පවතින අබුද්දස්ස ක්‍රියාකාරකම් අකාමකා දැමීමට සහ නව චින්තනයක් වෙත වෙසෙසින්ම තරුණ පරපුර පෙළ ගස්වා ගැනීමට හැකි ප්‍රබල මාධ්‍යයක් යැයි අපි කල්පනා කරමු.

මේනයින් මුද්‍රණ ද්වාරයෙන් එළි දැක්වෙන "ඇස පුවත්පත" අඳුරට නතුව අන්ධකාරයේ සැරිසරන බොහෝ අයට ආලෝක ධාරවක් වනු දැකීම අපගේ විශ්වාසයයි. බලාපොරොත්තුවයි.

**ගරු බෙනඩික්ට් ජෝශප් පියතුමා**
ශ්‍රී ලංකා ජාතික කතෝලික සිනමා පර්ශදයේ හිටපු ජාතික අධ්‍යක්ෂක
සහ ඥනාර්ථ ප්‍රදීපය කතෝලික පුවත්පතේ හිටපු ප්‍රධාන කර්තෘ




## විජයගේ දර්ශනය ජනතාව අතරට ගෙන යන්න

අග්‍රගණ්‍ය සිනමාවේදියෙකු වන දිවංගත විජය කුමාරතුංග මහතා කෘතහස්ත දේශපාලනඥයෙකි. සිනමාවෙන් කලා ක්ෂේත්‍රයට පිවිසි විජය, ශ්‍රී ලංකේය හා විදෙස් සහෘද රසිකයන් අතර වඩාත් ආදරයට සහ ගෞරවයට ලක් වූ මානව හිතවාදියෙකි.

දශක දෙකකට අධික කාලයක් පැවති යුධමය තත්ත්වය වෙනුවට ශ්‍රී ලාංකික සැමට විසඳුමක් වෙනුවෙන් ස්ථිර දේශපාලන ව්‍යාපාරයක අවශ්‍යතාව වටහාගත් විජය කුමාරතුංග, ඒ සඳහා සප්ත විධ බලවේග එක් රැස් කර, "ශ්‍රී ලංකා මහජන පක්ෂය" පිහිටුවා, එහි පුරෝගාමිය වශයෙන් සුවිශාල කාර්ය භාරයක් ඉටු කළේය.

විජය කුමාරතුංග මහතාගේ අභිමතාර්ථ සහ දර්ශනය මත පිහිටා නැවත පළ කරන "ඇස" පුවත්පත ජනමාධ්‍යයේ මානුෂීය සහ නෛතික සීමා හඳුනාගනිමින් ග්‍රාහක ප්‍රජාවට වගවන මාධ්‍යක් වනු ඇතැයි විශ්වාස කරන අතර, දිවංගත විජය කුමාරතුංග මහතාගේ 77 වන ජන්ම දිනය වෙනුවෙන් පළ කරන "ඇස" පුවත්පත සාර්ථක වේවායි සුබ පතමි.

**රනිල් වික්‍රමසිංහ**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති
නායක - එක්සත් ජාතික පක්ෂය



## අංකුර දේශපාලඥයින්ට ගුරුවරයෙක් වූ විජය

සිය පවුල් පසුබිම තුළ වූ සමාජවාදී සංකල්පය පෙරදැරිව දේශපාලනයේ මුලකුරු කියවූ ඔහු රටේ සුපසන් දේශපාලනඥකු දක්වා ආ ගමනේ, මූලිකාංගය වූයේ ඔහු සතු මානව හිතවාදී ගුණයයි එකී මානව හිතවාදී ගුණය නිසාම කුසලතා පිරිපුන් රංගධරයා, දේශපාලනඥයා අභිබවා ඉදිරියට ආ මානව හිතවාදියා නිසා, පෙරකී රංගධරයා හා දේශපාලනඥයාගේ වරප්‍රසාද රැසක් අහිමි කළේය. එහු පසු කලෙක නවමු දේශපාලන සංකල්පයක් මත බිහි කළ ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නිර්මාතෘවරයා ලෙස නව පරපුරකට ආමන්ත්‍රණය කළේය. ඒ සඳහා ඔහු තෝරා ගත් දේශපාලන මාවත නිදහසේ රටපුරා ගලායන්නට ඉඩ හැරියේය. ඒ තුළින් රට පුරා කුසලතා පිරිපුන් අංකුර දේශපාලනඥයන් රැසක් බිහිවිය.

මෙම ජන්ම දින සැමරුමට ද ඒ සමඟ පවත්වන මහජන පක්ෂයේ නිල පුවත්පත වන "ඇස" නව්‍යකරණය කොට එළිදැක්වීම ද සාර්ථක වේවායි. සහෝදරත්වයෙන් අප සුබ පතන්නෙමු.

**දිනේෂ් ගුණවර්ධන**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය,
නායක - මහජන එක්සත් පෙරමුණ



## මර්ධනයට එරෙහි වූ "ඇස"ට උණුසුම් සුබ පැතුම්

ශ්‍රේෂ්ඨ කලාකරුවකු වශයෙන් විජයගේ සිනමා කලාව පිළිබඳව මෙහිලා සඳහන් කරන්නේ මහත් අභිමානයෙන් යුතුවය. විජය ශ්‍රී ලංකා චිත්‍රපට ඉතිහාසයේ පෙරලිකාර රංගනයක නිරතවූ සුන්දර මිනිසෙකු ලෙස කුඩා, තරුණ, වැඩිහිටි, සියලු සහෘදයන්ගේ සිත් තුළ බොහෝ කල් රැඳෙනු ඇත.

කලාකරුවකු මෙන්ම විජය, සංවේදී චරිතයකින් හෙබි ප්‍රතිපත්තිමය දේශපාලනඥයකුද විය. ඉතා කෙටි කාලයකින් දේශපාලන ලෝකයේ කීර්ති නාමයක් දිනාගත් මොහු ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නායකයා වශයෙන් දීර්ඝ දේශපාලන ගමනකට අඩිතාලම දැමුවේය. ජාති, ආගම්, කුල භේද වැනි පටු ආකල්ප බැහැර කළ එතුමා අවංක, නිහතමානී, නීතිගරුක, එඩිතර සහ ප්‍රතිපත්තිමය දේශපාලනඥයකු විය.

විජය කුමාරතුංගයන්ගේ 77 වන ජන්ම දිනය සමරන මේ අවස්ථාවේදී එතුමන් ආදරයෙන් සිහිපත් කරමි. එමෙන්ම මහජන පක්ෂය ආරම්භ කළ මුල් අවධියේ මහජන පක්ෂයේ මතය ජනතාව අතරට ගෙන යාමට සහ එම වකවානුවේ රටේ පැවති මර්ධනකාරී දේශපාලනය පිළිබඳව ජනතාව දනුවත් කිරීමට ආරම්භ කළ "ඇස" පුවත්පතට සුභාශිංශන පිරිනමමි.

**මහින්ද රාජපක්ෂ**
පස්වන විධායක ජනාධිපති
නායක ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ



## විජය දේශපාලන පතාක යෝධයන්ට අභියෝගයක් වුණා

විජය කුමාරතුංග නම් කෘතහස්ත කලාවේදියා එදා මෙදා තුළ ශ්‍රී ලාංකික සිනමාවේ බිහි වූ අග්‍රගණ්‍ය කලාකරුවෙකු ලෙස අවිවාදයෙන් අප සියලු දෙනා පිළිගත යුතු වෙනවා. සිනමා ජීවිතයෙන් ඔබ්බට ගිය මානව දයාව පිරි යහපත් මනුෂ්‍යයෙකු ලෙස විජය හැඳින්විය හැක. සිනමා ජීවිතයෙන් අසීමිත ජනාදරයට පාත්‍ර වූ විජය කුමාරතුංග මහතා අභිබවා සිංහල සිනමාවේ එම ජනප්‍රියත්වය අතික්‍රමණය කිරීමට සමත් වූ කලාකරුවකු අද වනතුරු බිහි නොවී ඇත.

විශේෂයෙන් ම එතුමාගේ 77 වන ජන්ම දිනය සමරන මේ මොහොතේ මතක් කර දීමට ඇත්තේ මිනිසුන් තුළ ජීවත් වූ මිනිසෙක් සදාකල් මිනිසුන් අතර නොමියන මිනිසකු ලෙස සදා වැජඹෙන බවයි. විජය කුමාරතුංග මහතාගේ මතකයන් සහ ඔහුගේ දැක්ම සමාජගත කිරීමට කටයුතු කරන "ඇස" පුවත්පතට මේ මොහොතේ මාගේ ගෞරවය සහ ස්තූතිය පුද කරමි.

**මෛත්‍රීපාල සිරිසේන**
හයවන විධායක ජනාධිපති
සභාපති - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය



## ජාතීන් අතර සමඟිය වෙනුවෙන් විජය ලොකු කැපකිරීමක් කළා

විජය මානව හිතවාදියකු ලෙස ගත්තොත් ඒ ගැනම වුවත් කෙනෙකුට විශාල පොතක් ලිවීමට තරම් තොරතුරු, කරුණු රැසක් තියෙනවා. ජාතීන් අතර සමගිය මෙන්ම සාමාන්‍ය ජනතාව ගැන ලොකු කැක්කුමකින් විජය කටයුතු කළා. එසේ කළේ, ඔහු තුළ මනුස්සකම නිතැතින්ම තිබුන නිසා. "මනුස්සකම" කියන වචනය වැඩිම වශයෙන් කතා කළ දේශපාලනඥයා විජය. එසේම "මනුස්සකම" යන වචනය දේශපාලනගත කළෙත් විජය මේ නිසා විජය සැබෑ මානව හිතවාදියෙක්. විජය සාමාන්‍ය ජනතාව සමග උරෙන් උර ගැටී බාල මහලු, යෞවන, සියලූ ජාතීන්, ආගම් හා කුලවලට අයත් අය සමග සමීපව ජීවත් වුණා.

**චන්ද්‍රිකා කුමාරතුංග**
හතරවන විධායක ජනාධිපති
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය



## ප්‍රශස්ත රටක් ගැන සිහින දුටු විජය

විජය කුමාරණතුංගයන් අනාගතවාදී දේශපාලනඥයෙකි. ලංකාවේ ජනවාර්ගික සාමය හා සමගිය පිළිබඳව එතුමන් තුළ පැවැති දැක්ම බෙහෙවින් ම ප්‍රගතිශීලිය, ඉදිරිගාමීය. ජාතිවාදයේ බලපෑමෙන් තොරව, සමාජ සාධාරණත්වයේත්, සමාජවාදයේත් පණිවිඩය රටපුරා ජනයා අතරට ගෙන යා හැකි බව එතුමා ඔප්පු කළේ ය. වර්ගවාදයෙන් තොර දේශපාලන විසඳුමක් සඳහා වූ පණිවිඩය සිංහල මෙන්ම ද්‍රවිඩ ජනයා අතරට ද ගෙන යාම උදෙසා එතුමන් මහත් පරිශ්‍රමයක් දැරුවේ ය. වර්ගවාදී ගැටුම් උත්සන්න මොහොතේ උතුරේ සංචාරය කරමින් උතුරු දකුණු සංහිඳියාවේ පාලම තැනීමේ පුරෝගාමී අභියෝගය භාර ගත්තේ එතුමන් ය.

අවාසනාවකට විජය කුමාරතුංගයන් දැයට අහිමි විය. ඔහු ජීවත්ව සිටියා නම් වඩාත් ප්‍රශස්ත රටක් වෙනුවෙන් අති මහත් මෙහෙවරක් කළ යුග පුරුෂයෙකු ලෙස ඉතිහාසගත වනවාට සැක නැත. ඔහු ජීවත්ව සිටි කෙටි කාලය තුළ කළ කී දෑ තවත් දශක ගණනාවක් මුළුල්ලේ උපනූපන් පරපුර විසින් සිහිපත් කරනවාට සැක නැත.

**සජිත් ප්‍රේමදාස**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තු විපක්ෂ නායක
නායක - සමගි ජන බලවේගය



## ප්‍රජාතන්ත්‍රවාදී බලවේග රට වෙනුවෙන් එක්විය යුතු මොහොතක්

විජය කුමාරතුංග මැතිතුමාගේ දර්ශනය අපට පැළකරගන්න කුමක්ද කළ යුතු කියා අප එම චින්තනය නැවත කියවා ගත යුතුයි. මා එම චින්තනය තුළ හඳුනාගත් ප්‍රධාන කරුණු දෙකක් ඔබට සඳහන් කරන්න කැමතියි. එකක් තමයි ප්‍රජාතන්ත්‍රවාදී ධාරාවේ වාමාංශය හා මැද එක්සත් කරන්න විජය කුමාරතුංගයන් දැක්වූ උත්සාහය හා එතුමාට ඒ තුළ තිබුණු වුවමනාව. දෙවැන්න ජාතික සමගිය වෙනුවෙන්, සංහිඳියාව වෙනුවෙන් චකිතයකින් තොරව එතුමා ගනු ලැබූ තීන්දු. මේ විජය කුමාරතුංග චින්තනයේ පදනම් කණු දෙක අපි අද දවසේ නැවත කරළියට ගෙන ආ යුතුයි.

අපි එය මහජන වේදිකාවට ගෙනැවිත් ඒ සමාජ සාකච්ඡාව පෝෂණය කරමු. එම චින්තනය අදටත් අවශ්‍යයයි.

**ඩලස් අලහප්පෙරුම**
මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී,
නිදහස ජනතා සභාව



## දුෂ්කර මොහොතක විශාල වගකීමක්

මේ මොහොත අප රට මෑත ඉතිහාසය තුළ උග්‍රතම ආර්ථික අර්බුදයට මුහුණ දී ඇති මොහොතකි. මුළුමහත් සමාජයම ඉන් දැඩි සේ බැට කමින් සිටින මොහොතකි. සර්වපාක්ෂික එකඟතාවෙන් සැකසෙන, ජාතික එකඟතා වැඩපිළිවෙළක් තුළින් එම ආර්ථික ආපදාවට විසඳුම් සෙවීමට යුහුසුලුව ක්‍රියාත්මක විය යුතු මොහොතකි. මෙරට දේශපාලන කරළියෙහි "උඩුගම් බලා පිහිනන" ස්වාධීන පක්ෂ එකමුතුව තුළ රැඳෙමින්, ශ්‍රී ලංකා මහජන පක්ෂය ද කටයුතු කරන්නේ මෙම ආර්ථික ආපදාව, පුනරුදයේ මොහොත බවට පත් කර ගත යුතුය යන ඒකායන අරමුණෙනි.

එවන් සද් අරමුණකට මේ දුෂ්කර මොහොතේ උරදී සිටින පක්ෂයක නිල පුවත්පතකට පැවරෙන වගකීම ද සුළුපටු නොවේ. විප්ලවීය පුවත්පතක කාර්යභාරය පිළිබඳව වී.අයි. ලෙනින් සහෝදරයා අවධාරණය කර ඇති පුවත්පත දේශපාලන අධ්‍යාපනය ලබාදීමටත් පක්ෂයට මිතුරන් දිනා දීමටත් පමණක් නොව එය තීරණාත්මක මොහොතක සාමූහික ප්‍රචාරකයකු, උද්ඝෝෂකයකු පමණක් නොව සංවිධායකවරයකු ද විය යුත්තේය. ශ්‍රේෂ්ඨ වදන් පෙළ සිහිපත් කරමින් "ඇසට" එවන් ගමනකට ධෛර්යය හා ශක්තිය පතන්නෙමු.

**විමල් වීරවංශ (පා.ම.)**
නායක - ජාතික නිදහස් පෙරමුණ.



## විජය ගැන ඇස පුවත්පතේ ලිවීමට ඇති දේ බොහෝයි

ශ්‍රී ලංකාවේ නිර්මාණය වූ විශිෂ්ට ගණයේ සිනමාවේදියෙකු, මානව හිතවාදියෙකු මෙන්ම සදාචාරාත්මක දේශපාලනඥයෙකු වූ දිවංගත විජය සිහිපත් කරන්නේ සෙනෙහෙබර හදවතින් හා සදා නොමැකෙන අනුවේදනාවකිනි.

විජය කුමාරතුංග නම් වූ සදාචාරාත්මක දේශපාලනඥයා, ශ්‍රී ලංකා මහජන පක්ෂයෙන් නිර්මාණය කළේ සමස්ත ශ්‍රී ලංකාවාසී ජනතාව සමාජ, සංස්කෘතික හා දේශපාලනික වශයෙන් සන්නද්ධ කිරීමටය.

විජය නම් වූ කලාකරුවා, විජය නම් වූ මානව හිතවාදියා, විජය නම් වූ අසහාය දේශපාලනඥයා ගැන ඔබගේ "ඇස" පුවත්පතේ ලියන්නට ඇති දේ බොහෝයි. "ඇස" දේශපාලන පුවත්පතක් වීම හේතුවෙන්ම මෙම යුගය ඔබතුමන්ලාට ඉතාමත් වටිනාම යුගයක් බැව් නොරහසකි.

**කුමාර වෙල්ගම**
කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී
නායක - නව ලංකා නිදහස් පක්ෂය



## අර්බුදයෙන් රට ගොඩගන්න මහජන පක්ෂයට පුළුවන්

සමාජ වෙනසක් සඳහා අපත් සමඟ ජන අරගල මාවතේ සටන් වැදුනු විජය පොදු ජනතාවගේ ආදරණීය හිතමිතුරෙක් විය. ඔහු සියලු ජාතීන්ගේ අයිතිය නියෝජනය කළ දේශාභිමාන නායකයෙක් ලෙස අධිරාජ්‍යවාදී බලවේගවලට විරුද්ධව වාමාංශික දේශපාලනය සමඟ පෙළ ගැසී කටයුතු කළේය. එතුමා ප්‍රජාතන්ත්‍රවාදී මාවතින් නිසැකවම ශ්‍රී ලංකාවේ ප්‍රමුඛත්වයට පැමිණීම පිළිබඳව, වර්ගවාදී ආකල්ප දැරූ පිරිස් හා අධිරාජ්‍යවාදීහු දැඩිව වියරුවට පත්ව සිටියෝය. එනිසා ඔහු ගෙන ගිය දේශපාලනය ප්‍රජාතන්ත්‍රවාදී මාවතින් පරාජය කළ නොහැකි බැවින් ඒ සඳහා ඔහුගේ ජීවිතයට එම රුදුරු බලවේග විසින් පැහැර ගත්තේය. එදාමෙදා තුර ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික දේශපාලනය ඔහු ගත් මග අත් නොහැර ඉදිරියටම ගෙනයාම වෙනුවෙන් කැපවූ අතර අපත් සමඟ දිගුකාලීනව එක්ව ගමන් කරමින් සිටින ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නායකත්වය වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ දෙන අර්බුදකාරී තත්ත්වයෙන් මුදවා ගැනීම සඳහා පෙරමුණ ගනු ඇති බව ඉහත 77 වන ජන්ම දින සැමරුම් අවස්ථාවේ දී අපගේ අපේක්ෂාවයි.

**වාසුදේව නානායක්කාර (පා.ම.)**
ලේකම්
ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ




## සියල්ලන්ගේ ආදරය නොඅඩුව දිනා ගත් ජන නායකයා

දෙමළ ජනතාවගේ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නය හමුවේ වාර්ගික ස්වයංපාලන ක්‍රමය පිළි ගෙන, මෙය ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළින් සාමකාමීව විසඳිය යුතු බවට ඔහු උනන්දුවක් දැක්වීය. ඔහු සියල්ලන්ගේ ආදරය නොඅඩුව දිනා ගත් උසස් ප්‍රතිපත්තිවලින් හෙබි අග්‍රගණ්‍ය පුද්ගලයෙකි.

අද දින දිවංගත ශ්‍රීමතාණන් නැවතත් සිහිපත් කරන අතර, ඔහු අත්හැර දමා ගිය ජනහිතකාමී මෙහෙවර ශ්‍රී ලංකා මහජන පක්ෂය විසින් කවදත් ඉදිරියට ගෙන යනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

මෙම පක්ෂයේ නිල පුවත්පත මේ රටේ මාධ්‍ය ක්ෂේත්‍රයේ සමාජ සුබසාධන කටයුතු සිදු කිරීම වෙනුවෙන් හා මෙවැනි කටයුත්තක් සිදු කිරීම පිළිබඳව පක්ෂ නායක, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අසංක නවරත්න මැතිතුමා ඇතුළු සියලුම සංවිධායකයන්ටත් මාගේ හද පිරි සුබ පැතුම් හා ශුභාසිංශන පළ කරමි.

**ඩග්ලස් දේවානන්දා පා.ම.**
ධීවර අමාත්‍ය,
මහ ලේකම් - ඊ.පී.ඩී.පී.




## වමේ සහ ප්‍රගතිශීලී කඳවුර එකතු කළ නායකයා ඔහුයි

විජය කුමාරතුංග යනු වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සැබෑ මිනිසෙකි, මානව හිතවාදය, මනුෂ්‍යත්වය, යුක්තිය, සාධාරණත්වය ඔහුගේ මුවග නිතර රැව්දුන් වචන කිහිපයකි. ඔහු සැබැවින්ම ඒවා වචනවලට සීමා නොකර තම ජීවිතයෙන් සනාථ කර පෙන්වූ උත්තරීතර සත්‍යවාදියෙකි. ශ්‍රී ලංකා මහජන පක්ෂයේ ප්‍රගතිශීලීන් සමඟ එදා වාමාංශික ව්‍යාපාරයේ සියලු කොටස් එක්සත් කළ විජය මෙරට ජනතාවගේ ආදරණීය නායකයෙකි.

විජය නම් මානව හිතවාදී කලාකරුවාගේ / දේශපාලනඥයාගේ 77 වන ජන්ම දිනයට සුබ පැතුම් සහ එතුමන්ගේ මූලික මගපෙන්වීමෙන් ආරම්භ කළ "ඇස" පුවත්පත දිනෙන් දින සාර්ථක වේවායි සුබ පතමු...

**මහාචාර්ය තිස්ස විතාරණ**
පාර්ලිමේන්තු මන්ත්‍රී
නායක / ප්‍රධාන ලේකම් - ලංකා සම සමාජ පක්ෂය



## A Grate Leader who Stood against Racism

We are pleased to send this message on the occasion of the 77 Birth Anniversary of late Mr. Vijaya Kumaratunga which falls on 09 October 2022 and the release of ESA newspaper.

Late Mr. Vijaya Kumaratunga had a vision for uniting all communities in Sri Lanka towards achieving social justice and equality. Being an actor, he won the hearts of Sri Lankans which paved the way for his entry into main political arena founding the Sri Lanka Mahajana Pakshaya.

We are happy to note that the newspaper titled ESA is being re-published on this date which we hope will popularize the policies and objectives of Sri Lanka Mahajana Pakshaya

**Jeevan Thondaman M.P.**
General Secretary
Ceylon Workers Congress



## Played a Positive Role to Improving Two Countries Friendship

Mr. Kumaratunga has made important contributions to Sri Lanka's film industry and national peace and development during his whole life. And since its founding, the SLMP has been playing a positive role in improving the well-being of Sri Lankan people and promoting the traditional friendship between the two peoples of China and Sri Lanka. I sincerely expect that despite the major changes of the current global landscape and the severe challenges facing Sri Lanka, the SLMP will continue to uphold the people-centered political ideology, and make good use of the party official newspaper "Esa" to unite and guide people, to contribute more to the peace, stability and development of Sri Lanka, and to the friendship and cooperation between China and Sri Lanka.

**Qi Zhenhong**
Ambassador of China to Sri Lanka




## සාමය උදෙසා ප්‍රගතිශීලී හඬක් නැගූ විජය

ජාතීන් අතර සමගිය ඉතා ඉහළින් අගය කළ විජය, උතුරේ ද්‍රවිඩ තරුණයින්ගේ සන්නද්ධ සටන් ඇවිළුන යුගයේ එම ද්‍රවිඩ කණ්ඩායම් හමු වී රටට සාමය උදාකරලීම සඳහා දේශපාලන විසඳුමක් ගෙන ඒමට විශාල පරිශ්‍රමයක් දැරීය.

වාමාංශික පක්ෂ සමඟ එකතුව එක්සත් සමාජවාදී පෙරමුණ බිහි කරමින්, මේ රටේ ජනතාවගේ ප්‍රශ්නවලට ස්ථිරසාර විසඳුම් ලබා දිය හැකි වාමාංශික රජයක් බිහිකරලීමට අධිෂ්ඨානශීලිව ක්‍රියා කළේය. එක්සත් සමාජවාදී පෙරමුණ සමාජ ගත කරන්නට ඉතා ආසන්න මොහොතක මිනීමරු දේශපාලන කණ්ඩායමකගේ වෙඩි පහරින් මේ මානව හිතවාදී දේශපාලනඥයා මිහිපිටින් තුරන් කරනු ලැබිය.

අද ශ්‍රී ලංකාව පවතින්නේ ද එදා ශ්‍රී ලංකා මහජන පක්ෂය බිහි වූ පසුබිමට සමාන තත්ත්වයටය. එබැවින් අද දවසේ ද, නිවැරදි නායකත්වයකින් වාමාංශික ප්‍රගතිශීලි පක්ෂ එකමුතුවක් හරහා සමාජ අර්බුද විසඳීම සඳහා රජයක් පිහිටුවීමට කටයුතු කිරීම, සියලුම ප්‍රගතිශීලීන්ගේ අධිෂ්ඨානය විය යුතුය.

**විශේෂඥ වෛද්‍ය ජී. වීරසිංහ**
ප්‍රධාන ලේකම් - ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය
ප්‍රධාන ලේකම් - උත්තර ලංකා සභාගය



## දේශපාලන ගමන්මගේ හැඩතල හා දිශාන්තිය වෙනස් කළ මානව හිතවාදියෙක්

ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසය තුළ රටේ දේශපාලන ගමන් මගේ හැඩතල හා දිශාන්ති වෙනස් කළ මානව හිතවාදී නායකයන් සිටින්නේ අතළොස්සකි. ඒ අතරින් විජය කුමාරතුංග මැතිතුමාට හිමිවන්නේ අතිශය වැදගත් ස්ථානයකි.

විජය තරම් මෙරට පීඩිත ජන කොටස්වල ආදරය දිනූ ඔවුන්ට සමීප වූ හෘදයාංගම නායකයකු නොවූ බව පැවැසීම අතිශයෝක්තිය නොවේ. විජය රට හමුවේ තැබූ ජනතාවාදී දේශපාලන දර්ශනයේ නිම්වළලු වඩාත් පුළුල් අන්දමින් නූතන තරුණ පරපුර වෙත සමීප කරවීම යුගයේ කාලීන අවශ්‍යතාවකි.

ඒ සඳහා "ඇස" පුවත්පතට විශිෂ්ට කාර්යභාරයක් ඉටුකළ හැකිවනු ඇතැයි විශ්වාස කරන අතරම "ඇස" ඉදිරි කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි පතමි.

**ටිරාන් අලස්**
මහජන ආරක්ෂණ අමාත්‍ය
නායක - එක්සත් මහජන පක්ෂය



## මහජන වෘත්තීය සමිති යළි පිබිදෙයි

ශ්‍රී ලංකා මහජන වෘත්තීය සමිති සම්මේලනය (Sri Lanka Mahajana Trade Union Federation - SLMTUF) ට අනුබද්ධ වෘත්තීය සමිතිවල ක්‍රියාකාරීන්ගේ හමුවක් රත්මලාන, ශ්‍රී ලංකා මහජන දුම්රිය සේවක සංගම් මූලස්ථානයේදී මහජන පක්ෂ නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී අසංක නවරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

මෙම අවස්ථාවට පක්ෂයේ නියෝජ්‍ය සභාපති රොෂාන් ද මෙල් මහතා සහ ගුරු, දුම්රිය, ප්‍රවාහන, වතු සේවක, කලා ඇතුළු අනුබද්ධ හා වෘත්තීය සමිති සංවිධානවල ක්‍රියාකාරීන් පිරිසක් එක්ව සිටියා.



## මහජන පක්ෂ මාතර දිසා සමුළුව

ශ්‍රී ලංකා මහජන පක්ෂයේ මාතර දිස්ත්‍රික් සමුළුව මාතර, නූපේ සණස සංගම් පරිශ්‍රයේදී සාර්ථකව පසුගියදා පවත්වන ලදී.

මෙහිදී පක්ෂයේ දිවංගත නායකයින් වන විජය කුමාරතුංග, හිටපු මන්ත්‍රී මොහොමඩ් අක්‍රම්, ආචාර්ය රංජිත් නවරත්න, හිටපු මාතර ප්‍රා. සභා සභාපති චන්ද්‍රසිරි දේවසුරේන්ද්‍ර ඇතුළු දිවිපිදූ පක්ෂයේ නියමුවන් සහ රණවිරුවන් සිහිපත්කරමින් විශේෂ පුෂ්පෝපහාරයක් ද සිදුකරන ලදී.

එමෙන්ම පක්ෂ සාමාජිකත්වය ලැබූ නවකයින් කිහිපදෙනෙකුට සාමාජිකත්වය ප්‍රදානය කිරීම ද මාතර දිස්ත්‍රික්කයේ නව ආසන සහ කොට්ඨාශ සංවිධායකවරුන් වෙත පත්වීම් ලිපි ප්‍රදානය පක්ෂ නායකතුමන් අතින් සිදුකරන ලදී.

## කුරුණෑගල සංවිධායකවරුන් පත්කෙරේ

ශ්‍රී ලංකා මහජන පක්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආසන 14 සඳහා ආසන සංවිධායකවරුන්, ආසන කළමණාකරුවන් සහ ආසන සම්බන්ධීකාරකවරුන් වෙත අදාළ පත්වීම් ලිපි ප්‍රදානය කිරීම පසුගිය 30 වෙනි දින කුරුණෑගල දී සිදුකරන ලදී.

එමෙන්ම මෙහිදී දිස්ත්‍රික්කයේ අධ්‍යාපන, මාධ්‍ය යන අංශ සඳහා ද සම්බන්ධීකාරකවරුන් පත්කිරීමක් සිදුකෙරිනි.





## මහජන පක්ෂය උතුරේ පැතිරේ

ශ්‍රී ලංකා මහජන පක්ෂයේ මුලතිව් දිස්ත්‍රික් සමුළුව පසුගියදා හිජ්රාපුරම් හිදී පැවැත්විණි.

මේ සඳහා වන්නි දිස්ත්‍රික් සම්බන්ධීකාරක නඩරාජා අරවින්දන්, මුලතිව් දිස්ත්‍රික් සංවිධායක රහීම් රමීම්, මහ මැතිවරණ අපේක්ෂක අල්හාජ් අබ්දුල් රමීම් සමඟ දමිළ, මුස්ලිම් සහ සිංහල ජාතීන් නියෝජනය කරමින් විශාල පිරිසක් ද සහභාගීවිය.




## අගමැති හා මහජන පක්ෂය අතර හමුවක්..

පක්ෂයේ විධායක සභාව වත්මන් අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සමඟ සාකච්ඡාවක් බොරැල්ල ඇන්.එම්. පෙරේරා මධ්‍යස්ථානයේ දී පසුගියදා පැවැත්විණි. වර්තමානයේ අප රට මුහුණ දෙන ආර්ථික අර්බුදය විසඳීම සඳහා සැමගේ සහය එතුමන් අපේක්ෂා කරන බව අගමැතිතුමන් පක්ෂ විධායක සභාව හමුවේ සඳහන් කරන ලදී.

## කැකිරාව පක්ෂ කාර්යාලය විවෘත කිරීම

ශ්‍රී ලංකා මහජන පක්ෂයේ කැකිරාව ආසනයේ සුමිත් දිසානායක මහතාගේ ප්‍රධාන සම්බන්ධීකරණ කාර්යාලය කැකිරාව, කිතුල්හිටියාව 50 කණුව යන ස්ථානයේදී පසුගියදා ශ්‍රී ලංකා මහජන පක්ෂයේ ප්‍රධාන ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී අසංක නවරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 9.27 ට යෙදුණු සුබ මොහොතින් මහා සංඝරත්නයේ ආශිර්වාද මැද විවෘත කෙරිණි.






## කොළඹ සමුළුව සාර්ථකයි

ශ්‍රී ලංකා මහජන පක්ෂයේ කොළඹ දිස්ත්‍රික් සමුළුව පසුගියදා බොරැල්ල, ඇන්. ඇම්.පෙරේරා මධ්‍යස්ථානයේදී පක්ෂයේ නායක, කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අසංක නවරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී.

මෙම අවස්ථාවට නැලිගම විහාරාධිපති පූජ්‍ය වල්පොල සද්ධානන්ද නාහිමි, දේශපාලන මණ්ඩලය වෙනුවෙන් භාණ්ඩාගාරික ගාමිණී වීරසිංහ, උප සභාපතිවරුන් වන මැද කොළඹ සංවිධායක හේමචන්ද්‍ර කුරුප්පුආරච්චි සහ රත්මලාන සංවිධායක රොෂාන් ද මෙල්, සහකාර ලේකම් සහ හෝමාගම සංවිධායක මිල්ටන් ගුණරත්න යන මහත්වරුන්ද, කාන්තා සම්මේලනයේ සභාපති සන්ධ්‍යා ද මෙල් මහත්මිය, කොළඹ දිස්ත්‍රික් සංවිධායක රංජිත් පෙරේරා, කොළොන්නාව සංවිධායක රුවන් හේවාවිතාරණ, කඩුවෙල සංවිධායක සුදර්ශන ගමගේ ඇතුළු ආසන සංවිධායකවරුන්, විධායක සභිකයින් පිරිසක් එක්විය.



## පුත්තලම දිසා සමුළුවට දයාශ්‍රිත එයි

ශ්‍රී ලංකා මහජන පක්ෂයේ පුත්තලම දිස්ත්‍රික් සමුළුව පසුගියදා ගෝල්ඩන් රිවර් හෝටලයේදී පක්ෂ නායක, කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අසංක නවරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

මෙම අවස්ථාවට විශේෂ ආරාධිතයින් ලෙස මහජන පක්ෂ ආරම්භකයෙකු වූ ප්‍රෝටස් තිසේරා මහතාගේ පුත් හිටපු අමාත්‍ය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ පුත්තලම දිස්ත්‍රික් සංවිධායක දයාශ්‍රිත තිසේරා, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජාන් ප්‍රනාන්දු යන මහත්වරුන් ද

පක්ෂ මූලස්ථානය නියෝජනය කරමින් අප පක්ෂයේ සභාපති ඇල්ෆ්‍රඩ් රාමනායක, වැඩබලන නියෝජ්‍ය සභාපති රොෂාන් ද මෙල්, සහකාර ලේකම් හා වෘත්තීය සමිති සම්මේලනයේ ලේකම් මිල්ටන් ගුණරත්න යන මහත්වරු ද, පුත්තලම් දිස්ත්‍රික් සංවිධායක හා සහකාර ලේකම් නිරෝෂ් ප්‍රනාන්දු, මහජන කාන්තා සම්මේලනයේ සභාපති සන්ධ්‍යා ද මෙල්, මහජන ධීවර සමිති සම්මේලනයේ කැඳවුම්කරු රුවන් හේවාවිතාරණ යන මහත්ම මහත්මීන් ද සහභාගීවිය.



## රජරට රජ ගමන අනුරපුරෙන් ඇරඹේ

ශ්‍රී ලංකා මහජන පක්ෂයේ අනුරාධපුර දිස්ත්‍රික් සමුළුව ජනවාරි 30 වන දින පෙරවරුවේදී අනුරාධපුර සිසිල උයන පරිශ්‍රයේදී මහජන පක්ෂයේ නායක, කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අසංක නවරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

මෙහිදී පක්ෂයේ ආරම්භය හා ඉතිහාසය පිළිබඳව මහජන පක්ෂයේ හිටපු උතුරුමැද පළාත් සභා මන්ත්‍රී සෝමචන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් විශේෂ දේශනයක් පවත්වන ලද අතර, වර්තමානයේ අපගේ කාර්යභාරය පිළිබඳව සභාවට කරුණු පැහැදිලි කරන ලදී.

එමෙන්ම පක්ෂයේ උප සභාපති සමීර සේනානායක, පක්ෂයේ සහකාර ලේකම් නිරෝෂ් ප්‍රනාන්දු, අනුරාධපුර දිස්ත්‍රික් සංවිධායක ආනන්ද හේරත් යන මහත්වරුන් ද සිය අදහස් දක්වන ලදී. මංජුල පෙරේරා, නිලන්ත දේශප්‍රිය, සුමිත් දිසානායක, රංජිත් විජේවර්ධන ඇතුළු ආසන සංවිධායකවරුන් ද සහභාගී විය.





ශ්‍රී ලංකා මහජන පක්ෂයේ ගාල්ල දිස්ත්‍රික් සමුළුව රත්ගම සත්‍යගුණ සංගම් පරිශ්‍රයේදී පවත්වන ලදී.

## ගාල්ලට ජන ගඟක්

පක්ෂ සාමාජිකත්වය ලැබූ නවකයින් කිහිපදෙනෙකුට සාමාජිකත්වය ප්‍රදානය කිරීම ද ගාල්ල දිස්ත්‍රික්කයේ නව ආසන සහ කොට්ඨාස සංවිධායකවරුන් වෙත පත්වීම් ලිපි ප්‍රදානය පක්ෂ නායකතුමන් අතින් සිදුකරන ලදී.

මෙම අවස්ථාවට පූජ්‍ය ගල්මන්ගොඩ සිරිනන්ද නාහිමි, පූජ්‍ය දෙමටගොඩ සුමේධ නාහිමි, පක්ෂයේ නියෝජ්‍ය සභාපති රොෂාන් ද මෙල්, භාණ්ඩාගාරික ගාමිණී වීරසිංහ, උප සභාපති සමීර සේනානායක, හිටපු උප සභාපති රත්නපාල විමලරත්න, සහකාර ලේකම් නිරෝෂ් ප්‍රනාන්දු, සහකාර ලේකම් විල්සන් ගමගේ, ගාල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරීන් රැසක් ද එක්ව සිටියා.

## සියනෑවේ මහජන හඬ



ශ්‍රී ලංකා මහජන පක්ෂයේ ගම්පහ දිස්ත්‍රික් සමුළුව පසුගියදා ගම්පහ, ජා ඇල පාරේ පිහිටි වියානා ග්‍රෑන්ඩ් උත්සව ශාලාවේදී පක්ෂ නායක, කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අසංක නවරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

මෙම අවස්ථාවට පක්ෂ සභාපති ඇල්ෆ්‍රඩ් රාමනායක, භාණ්ඩාගාරික ගාමිණී වීරසිංහ, වැඩබලන නියෝජ්‍ය සභාපති රොෂාන් ද මෙල්, උප සභාපති සමීර සේනානායක, සහකාර ලේකම්වරුන් වන නිරෝෂ් ප්‍රනාන්දු සහ මිල්ටන් ගුණරත්න, කාන්තා සම්මේලනයේ සභාපති සන්ධ්‍යා ද මෙල්, කොළොන්නාව සංවිධායක රුවන් හේවාවිතාරණ, මාවතගම සම්බන්ධීකාරක තරිඳු නිමන්තක යන මහත්ම මහත්මීන් ද විශේෂ ආරාධිතයින් ලෙස ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජා ඇල නාගරික මන්ත්‍රී අනිල් කුමාර පෙරේරා, පොදුජන පෙරමුණේ ලන්ඩන් ශාඛාවේ සභාපති අනුර මැදගෙදර, ඉබ්බාගමුව හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තිස්ස තෙන්නකෝන්, ප්‍රවීණ සිනමාවේදී නිමල් ෆ්‍රැන්සිස් යන මහත්වරුන් ද සහභාගීවිය

## රුවන්පුර මහජන බලය

රත්නපුර දිස්ත්‍රික් සමුළුව ඇහැලියගොඩ විජය කුමාරතුංග ශාලාවේදී සාර්ථකව පවත්වන ලදී.

මෙහිදී හිටපු සභාපති සබරගමුව පළාත් අමාත්‍ය දිවංගත ජී.එම්. කරුණාපාල මහතාගේ පුත් ප්‍රා.ස. මන්ත්‍රී දිලින් කරුණාපාල මහතා නව දිස්ත්‍රික් සංවිධායකවරයා ලෙස පත්විය.






## හම්බන්තොටත් සාර්ථකයි

හම්බන්තොට දිස්ත්‍රික් සම්මේලනය පසුගියදා විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් අම්බලන්තොට, බැරගම පාරේ "කමත" හෝටල් පරිශ්‍රයේදී පැවැත්විනි.

නව දිස්ත්‍රික් සංවිධායකවරයා ලෙස කැළුම් ඉන්දික රංග මහතා පත්වූ අතර, මුල්කිරිගල, බෙලිඅත්ත, තංගල්ල යන ආසන සඳහා ද අනෙකුත් ප්‍රා. සභා කොට්ඨාස සඳහා ද නව සංවිධායකවරුන් පත්කිරීම ද මෙහිදී සිදුකෙරිනි.

## සාමය හා සහෝදරත්වය වෙනුවෙන් කැපවුණු නායකයෙක්



විජය කුමාරතුංගයන් ජාතිවාදයට, ප්‍රචණ්ඩත්වයට, ඒකාධිපතිත්වයට එරෙහිව සාමය, සහෝදරත්වය, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් දිවි පුජාකොට බිහි කළ ශ්‍රී ලංකා මහජන පක්ෂය එතුමාගෙන් පසු මහජනතාව අතරට ගෙන යාමේ දී එවකට පැවැති ප්‍රචණ්ඩකාරීත්වය යටතේ ජීවිත ගණනාවක් අහිමි වෙද්දී ද තම මරණය අභියස සිට ශ්‍රී ලංකා මහජන පක්ෂයට අභීත නායකත්වය ලබා දුන් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් නවරත්නයන්ගේ ශ්‍රේෂ්ඨ නායකත්වය අපි අතිශයින්ම අගය කරමින් සදා සමරමු.

විජය කුමාරතුංගයන්ගේ හා රංජිත් නවරත්නයන්ගේ පූර්වගාමීත්වයෙන්, මගපෙන්වීමෙන් හා ආශිර්වාදයෙන් ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නව නායකත්වය හොබවන නිහතමානි සුහදශීලි බුද්ධිමත් පාර්ලිමේන්තු මන්ත්‍රීවර ගරු අසංක නවරත්න තරුණ නායකත්වයට දේශ විමුක්ති ජනතා පක්ෂයේ අපි අපගේ ආකල්ප නිරන්තර සහයෝගය මෙයින් ප්‍රකාශ කර සිටිමු.

**නීතිඥ ඩී. කලන්සූරිය**
ප්‍රධාන ලේකම්
දේශ විමුක්ති ජනතා පක්ෂය

## "ඇස" බොහෝ අයට ඇස් ඇර බලන්නට අවස්ථාව උදා කර දේවි



විජය කුමාරණතුංග යනු ශ්‍රී ලංකා තරු අම්බරයේ පෑයූ දීප්තිමත්ම තරුවයි. තරු අම්බරයේ පෑයූ සඳ යි. ඒ තරම් ආලෝකයක් ඔහුගෙන් අපේ සිනමා ක්ෂේත්‍රයට ලැබුණා. ඔහු එක් චිත්‍රපටයකින් දෙකකින් මුළු ලංකාවේම ජනප්‍රිය නළුවා බවට පත් වුණා. ඔහු තරම් රසිකයන් අසීමිතව ආදරය කළ වෙනත් චරිතයක් නැහැ. ඒ වගේම ජනතාව කෙරෙහි විශාල මානව දයාවක්, කරුණාවක් ඔහු ළඟ තිබුණා. ඔහුගේ ප්‍රියමනාප රූපය පමණක් නොවෙයි ඊට හේතු වුණු කාරණා විශාල සංඛ්‍යාවක් තිබෙනවා. අතිශයින් දැකුම්කළු සිනමාවේ කඩවසම්ම තරුණයා ඔහුයි. ඔහුට ජනතාව ආදරය කිරීමට මට දැනෙන දේ තමයි මේ තරුව නිවී ගියා නොවෙයි නිවල දැමුවා. මේ තරම් ජනතාව ආදරය කළ මේ තරුව ඝාතනය කළා. විජය කියන අකුරු තුන තුළ ඔහු මහා ප්‍රතිරූපයක් ගොඩනගා ගෙන තිබුණා. මට කියන්න තිබෙන්නේ මෙපමණයි තරු කොපමණ පෑයුවත් අහස ලස්සන වන්නේ හඳ පෑයුවමයි. නමුත් ඒ හඳ අපෙන් ඉවත් කළා. ඉන් හටගත් ඒ අඳුර තවමත් පවතිනවා.

**රවීන්ද්‍ර රන්දෙනිය**
ප්‍රවීන රංගවේදී

## රසිකයන්ගේ සිත්වලින් විජය නැති කරන්න කාටවත් බැහැ



කලා ශිල්පියෙක් හා ඔහුව ඉතා සමීපව දන්නා කෙනෙක් හැටියට මේ සිදු කරන ඔහුගේ ජන්ම දින සැමරුම මම ඉතා අගය කරනවා. විජය අප අතරින් වෙන් වුණාට, කලාකරුවෙක් හැටියට ඔහු සදාකාලිකයි. රසිකයන්ගේ හිත්වල සැමදාම ඔහු ජීවමානයි. ඒක නැති කරන්න කාටවත් බැහැ. ඔහුගේ රංගනය දකින තරමටම එහි අගය වැඩි වෙනවා. විජය ජීවත්ව සිටි කාලයේ නොසිටි අද පුංචි දරුවා පවා ඔහුට ආදරෙයි. ඔහුගේ පින්තූර දකින්න හරි කැමතියි. ඔහුගේ ජන්ම දින සැමරුම සංවිධානය කරන හැමෝටම මම ස්තුතිවන්ත වීමටත් සුබ පැතීමටත් කැමතියි.

**මාලිනී ෆොන්සේකා**
ජ්‍යෙෂ්ඨ රංගන ශිල්පිනී

## විජයගේ දර්ශනය එදාට වඩා අද අපිට වටිනවා



විජයගේ දර්ශනය, ඔහු ජීවත්ව සිටින කාලයට වඩා අද අපට වටිනවා. විජයගේ දේශපාලනයත් සමග කිට්ටුවෙන් කටයුතු කළේ නැති වුණත් ඔහු සමග ඉතා සමීපව කටයුතු කළ සිනමා ශිල්පියකු ලෙස ඔහුගේ සිතුම් පැතුම්, ඔහුගේ අදහස් උදහස්, ඔහුගේ හැඟීම් දැනීම් මම හොඳින් දැනගෙන සිටියා. විජය ප්‍රාර්ථනා කළ ඒ සමාජ සමානාත්මතාව, නිදහස, ජනතා සුබසිද්ධිය වෙනුවෙන් අවසානයේ ජීවිතය තිළිණ කළා. වර්තමානයේ මෙවැනි දූෂිත වකවානුවක් තුළ ඒවා ඉෂ්ඨ කළ හැකිද, මේ ගෝලීයකරණය තුළ, විවෘත ආර්ථිකය තුළ, විවිධ බලවතුන්ගේ විවිධ රටවල්වල කුරිරු ආක්‍රමණකාරී ක්‍රියාකලාපයන් තුළ ඔහුගේ ඒ සුපිරිසුදු ප්‍රාර්ථනා ජයගත හැකිද යන ප්‍රශ්නය අප තුළ ඇතිවන්නේ නිරායාසයෙන්. නමුත් ඔහුගේ ඒ පරාර්ථකාමී සිතුවිලි, ඒ යහපත් ප්‍රාර්ථනා අප සෑම දෙනාම තුළම ඇති කරගත හැකි නම් මේ ලෝකය මීට වඩා බොහෝ යහපත් තැනක් වේවි.

**සනත් ගුණතිලක**
ප්‍රවීන රංගවේදී


## මානව දයාවේ පණිවිඩය ජනතාව අතරට ගෙන යාහැකි වේවා



ශුද්ධ තිත්වයෙන් එතුමන් මගේ මයිලනුවන් වුවද එතුමන් සැමවිටම මට අවවාද කළේ විජය කුමාරණතුංගගේ බෑණනුවන් ලෙස නොව රන්ජන් රාමනායක ලෙස තමන්ගේ ස්වශක්තියෙන් නැගී සිටින ලෙසය. අද මා රංගන ශිල්පියෙකු ලෙස යම් ස්ථාවරයක සිටී නම් ඊට ඉවහල් වූයේ එතුමන්ගේ එම අවවාදය බව සඳහන් කරන්නේ නිහතමානී සතුටකිනි. ලෝකය වඩා යහපත් තැනක් කරන්නට දිවිහිමියෙන් කැප වූ එතුමන්ට අකාලයේ දිවියෙන් සමුගන්නට සිදුවූයේ එම යහපත් අදහස්වලට අකැමති වූ පිරිස් නිසාය. එතුමන්ගේ අදහස් යම් පමණකින් හෝ ක්‍රියාත්මක කරන්නට හැකි වූවා නම් අපේ රට මේ අගාධයට නොවැටෙන බව මගේ විශ්වාසයයි. එතුමන්ගේ අවිහිංසාවාදී මතය ජනගත කළ "ඇස" පුවත්පත නැවත අරඹන බව ඇසීම ඉමහත් සතුටට කරුණක් වන අතර යළි නව ජවයකින් එළිදකින "ඇස" පුවත්පතට විජය කුමාරණතුංගයන්ගේ අවිහිංසාවාදී මානව දයාවේ පණිවිඩය යළි ජනතාව අතරට ගෙන යාහැකි වේවායි ප්‍රාර්ථනා කරමි.

**රන්ජන් රාමනායක**
ප්‍රවීණ රංගන ශිල්පී

## ඒ දවස ඇස ලෝකය දෙස බැලුවේ යහපත සඳහායි



කාලෙකට පෙර බොහොම ජනප්‍රියව තිබුණු ඇස පුවත්පත නැවතත් පාඨකයන් අතරට පැමිණීමට කටයුතු කිරීම පිළිබඳව මාගේ බලවත් ස්තුතිය හා සතුට පුද කරන්න කැමතියි. එදවස ඇස ලෝකය දෙස බැලුවේ යහපත සඳහායි. මනුෂ්‍යත්වය සඳහායි. ප්‍රේමය සඳහායි. එසේම එවන් ප්‍රේමණීය මිනිසෙක් සඳහාත් අපේ ඇස් ඇරෙන්නට කාලය පැමිණ තිබෙනවා. ඒ විජය කුමාරණතුංගයන් වෙනුවෙන්. එතුමා ලෝකය දෙස බලපු ආකාරය මනුෂ්‍යත්වය යැයි අප විශ්වාස කරනවා. ඒ නිසාම ඒ මනුෂ්‍යත්වයේ නාමයෙන් බිහි වූ අග්‍රගන්‍ය ශ්‍රේෂ්ඨ කලාකරුවා විජය කුමාරණතුංගයන්. එතුමාගේ මේ ගුණානුස්මරණයේදී එතුමාගේ ප්‍රතිභාව, ඒ වගේම එතුමන් තුළ පැවති අසම සම වූ මානව දයාවත් සිහිපත් කරන්නට මෙය අවස්ථාවක් කරගන්න කැමතියි.

**ශ්‍රියන්ත මෙන්ඩිස්**
ප්‍රවීන රංගන ශිල්පී

## විකල්ප පුවත්පතක අවශ්‍යතාවක් තිබෙනවා




වර්තමානයේ ප්‍රධානම ප්‍රශ්නයක් තමයි සන්නිවේදන ජාලය තුළ කොහොමද මිනිසුන්ගේ යහපත් සිතුම් පැතුම් වර්ධනය කරන්නේ කියන එක. අන්තර් ජාලයේ යූ ටියුබ් ඇතුළු සමාජ මාධ්‍ය ජාලා විශාල ගණනකින් තොරා බේරාගැනීමකින් තොරව විශාල තොරතුරු අදහස් සම්භාරයක් මිනිසුන්ගේ සිත් තුළට ඇතුළු වෙනවා. පෙර කාලයේ මෙන් මිනිස්සුන්ට නැවතත් කියවීමේ අවශ්‍යතාව ඇති වෙලා. ඒ නිසා විකල්ප පුවත්පත් ධාරාවක් යළි මතු වීම හොඳ බවයි.

එසේම විජය කුමාරණතුංග යනු මේ රටේ දැවැන්ත සංස්කෘතික චරිතයක්. දේශපාලනය සංස්කෘතිය කලාව ආදී ක්ෂේත්‍ර ගණනාවකින් මේ රටට සේවය කළ කෙනෙක්. ඔහුගේ රංගන ප්‍රතිභාව තුළින් ඔහු රඟපෑ චරිත අපේ කලා ජීවිතවලට විශාල ආලෝකයක් සැපයුවා. ඔහුගේ ජන්ම සැමරුම පැවැත්වෙන මේ අවස්ථාවේ මේ මහා කලාකරුවාගෙන් සිදුවූ මහඟු සමාජ හා දේශපාලනික සේවය පිළිබඳ කලාකරුවකු ලෙස අපේ කෘතවේදීත්වය පළ කරන්න මෙය අවස්ථාවක් කරගන්න කැමතියි.

**නවරත්න ගමගේ**
ප්‍රවීන සංගීතවේදී

## ඇස පුවත්පත එළි දැක්වීම සුබ කාරණයක්



පුවත්පත් කලාව නැත්තටම නැතිවී ගෙන යන කාලයක, බොහෝ වෙලාවට පුවත්පතක් මුද්‍රණය කරගැනීමට නොහැකි කාලයක නැවත "ඇස" පුවත්පත එළි දැක්වීම සුබ කාරණයක් හැටියටයි මම සලකන්නේ. මෙය දේශපාලනික වශයෙන් විජය කුමාරණතුංග මහතාගේ ශ්‍රී ලංකා මහජන පක්ෂයෙන් ප්‍රකාශයට පත් කළ නිල පුවත්පතක්. නමුත් කිසියම් වූ හේතු සාධක මත කලකට පෙර මෙය වැසී ගියත් නැවත මේ රටට අලුත් පුවත්පතක් ලෙස හඳුන්වා දී මුද්‍රණය කිරීමට කටයුතු කිරීමම සතුටට කාරණයක්. මම කලිනුත් සඳහන් කළා වගේ අද පුවත්පත් මඳක් සමාජයෙන් ඈත්ව යන කාලයක පුවත්පතක් කලාව එහෙම නැත්නම් පුවත්පත් වේදය යටපත් නොවී "ඇස" තුළින් නැවත පුවත් කලාව රැක ගැනීමට කරන උත්සාහය පිළිබඳ මගේ ගෞරවනීය ආචාරය.

**වසන්ත විට්ටච්චි**
ප්‍රවීන අංග රචනා ශිල්පී හා රංගන ශිල්පී

## කෙතරම් ජනප්‍රිය වුවත් නිහතමානිකම අත් නොහැරියා



1985-86 කාල වකවානුවල මම "තරුණයා" පුවත්පතේ රූ රටා සංස්කාරකවරයා ව සිටි අතර ජායාරූප ගනු ලැබුවේ කලාතුරකිනි. මේ කාලයේ විජය කුමාරතුංග යනු එවක ලංකාවේ සිටි ජනප්‍රියම නළුවා විය. විජය සමඟ ඉන් පෙර මගේ පූර්ව හැඳුනුම්කමක් නොතිබුණු නමුත් පින්තූරයක් ගන්නට ආස නිසා ම වරක් මම ඔහුට දුරකතන ඇමතුමක් දුන්නෙමි. ජංගම දුරකතන නොතිබූ එකල ඔහු නිවසේ සිට අවස්ථාවේ ඔහුම දුරකතනයට ප්‍රතිචාර දක්වමින් කියා සිටියේ, යොදා ගන්නා දිනයේ උදේ හය හමාරට එන්න පුලුවන් ද කියාය. මම නියමිත දින උදේ හය හමාරට නාරාහේන්පිට විජයගේ නිවස ගියෙමි. ඒ යනවිටත් චිත්‍රපටයක රූ ගත කිරීමකට යන්න සූදානම් ව සිටි ඔහු මා වෙනුවෙන් පැය බාගයක් පමණ ගත කරමින් මට රිසි ලෙස ජායාරූප ගන්නට අවස්ථාව ලබා දුන්නේය.

කිසිදු පූර්ව හැඳුනුම්කමක් තිබුණ ද නොතිබුණ ද විජය කිසිදාක යොදා ගන්නා දිනයක් වෙලාවක් වෙනස් නොකළා මෙන්ම යොදා ගන්නා වෙලාවට බොහෝ දුර බැහැර සිට පවා නියමිත තැනට එන්නට තරම් නිහතමානී වූ බව මගේ පත්තර මිතුරන් මට කියා තිබිණි.

**ඉන්ද්‍රනාථ තේනුවර**
ජ්‍යෙෂ්ඨ ජායාරූප ශිල්පී, ලේඛක, දේශක සහ උපදේශක

## ජනහිතකාමී විජය සදා සමරමු....!



විජය ළඟින් ඇසුරු කළ පුද්ගලයකු ලෙසද ශ්‍රී ලංකා මහජන පක්ෂයේ ආරම්භක සාමාජිකයකු ලෙසද ඇස පුවත්පතේ කර්තෘ මණ්ඩලයේ හිටපු සාමාජිකයකු ලෙසද මේ අවස්ථාවේ මගේ මතකය වසර ගණනාවක් ඈතට දිව යයි.

මිනිස්කමේ අග්‍රඵලය කුමක්ද යන්න මගෙන් යමෙක් ඇසුවොත් එයට පිළිතුර ලෙස මා දෙනු ලබන්නේ විජය යන්න අකුරු තුනයි. විජය එපමණටම මිනිස්කමට ආදරය කළේය. ඒ නිසාම විජය චිත්‍රපට නළුවකුට වඩා සමාජය තුළ ඉදිරියෙන් සිටින්නේ මේ රටේ බිහිවූ ප්‍රගතිශීලී දේශපාලන නායකයකු ලෙස ය. විජයගේ දේශපාලනය මෙරට සාම්ප්‍රදායික ධනපති පක්ෂවලට මෙන්ම අන්තගාමී වමේ දේශපාලන සංවිධානවලටද වහ කදුරු මෙන් විය. එනිසාම මේ අපූර්වතම දේශපාලන නායකයාව දේශපාලන භූමියෙන් ඉවත් කිරීමට මේ ප්‍රතිගාමී බලවේග තීරණය කර තිබුණේ විජය දේශපාලනයට පැමිණි මුල් කාලයේදීමය. මහර අතුරු මැතිවරණය එයට හොඳම නිදසුනයි. විජය අද ජීවත්ව සිටියා නම් වසර 77 කි. ඒ කාල පරාසය තුළ මෙරට දේශපාලනයේ කුමන පෙරළි සිදු සිදුවුවාද? ඉක්ම ගිය තැන ද විජයගේ ජනප්‍රියතාව මෙන්ම ප්‍රතිරූපයද බිඳකුදු වෙනස් නො වී ඇත. එයයි මා දකින විජයගේ වෙනස...

**ගාමිණී ජයලත්**
දිනමිණ ප්‍රධාන කර්තෘ

## "ඇස" පුවත්පතට මගේ සුබ පැතුම්



මානව හිතවාදියෙකු මෙන්ම සදා ආදරණීය කලාකරුවෙකු වූ මෙන්ම මා හට රංගන ශිල්පියෙකු වීමේ උනන්දුව හා ඕනෑකම ජනිත කළ අද්‍යශමාන බලවේගය වූ ආදරණීය විජය කුමාරණතුංගයන්ගේ 77 වන ජන්ම දින වන ඔක්තෝබර් 9 වැනි දින ඔහුගේ නිර්මාතෘත්වයෙන් බිහිවුනු ශ්‍රී ලංකා මහජන පක්ෂයේ මුලිකත්වයෙන් එළිදැක්වීමට නියමිත "ඇස" පුවත් පතට මාගේ හදපිරි සුභ පැතුම් පිරිනමමි.

**බුද්ධික ජයරත්න**
ප්‍රවීන රංගන ශිල්පී

## උතුර දකුණ යා කළ පාලම විජයයි



මෙරට තිස් අවුරුද්දක් මුළුල්ලේ ඇවිළුනු යුද ගිනි දැල් නිවී ගොස් මේ වනවිට අවුරුදු 13 ක් පමණ ගෙවී ඇතත් අළු යට ගිනි මෙන් සිංහල දෙමළ සමාජයන් දෙක අතර ඇති අනවශ්‍ය විරසකය විටින් විට මතුවෙමින් යට යමින් පවතින බවක් පෙනෙන්නට ඇත.

යුද්ධයකින් සතුරාගේ භූමිය අත්පත් කරගත හැකි වුවත් සතුරාගේ හදවත් ජයග්‍රහණය කළ නොහැකිය. ඒ සඳහා දීර්ඝකාලීන වැඩපිළිවෙළක් අවශ්‍යවන අතර විරසකය ඇතිවීමට හේතුවූ කාරණා නැති කිරීම හෝ අවම කිරීම සිදුකළ යුතුය. ඒ සඳහා එදා විජය කුමාරතුංග කලාකරුවා, දේශපාලකයා ගත් උත්සාහය යම්කිසි සාර්ථකත්වයක් පෙන්වූ බව මෙහිදී පැවසිය යුතුය.

එදා විජය කුමාරතුංග මහතා නතර කළ තැනින් අද අප පටන්ගත යුතුව ඇත. මේ කුඩා දූපත බෙදා වෙන්විය යුතු භූමියක් නොවේ. ලොව ඉතා විචිත්‍රවත්ම සංස්කෘතීන් ද්විත්වයක් වන සිංහල හා දෙමළ සංස්කෘතීන්ගෙන් පෝෂණය වූ මේ රටේ සාමයෙන් සමගියෙන් ජීවත්වීමට හැකිනම් මෙවන් පුන්‍යවන්ත භූමියක නියම වාසනාව අප සැමට විඳිය හැක. එය කළ නොහැක්කක් නොවන බවට ඉදිරියේදී මා විසින් ඔප්පු කිරීමට කටයුතු කරමි.

**අරුන් සිද්ධාර්ථ්**
යාපනය සිවිල් සංවිධාන එකමුතුව

# මට හමු වූ පාරිශුද්ධම දේශපාලනඥයා විජයයි

**ජයන්ත චන්ද්‍රසිරි**
**ප්‍රවීණ සිනමාවේදී**



**විජය කුමාරණතුංග නම් උත්තම මිනිසාගේ 77 වන ජන්ම දින සැමරුම පවත්වන මේ අවස්ථාවේ ශ්‍රී ලාංකේය ජන සමාජය කෙරෙහි වූ ඔහුගේ සමාජ දේශපාලන මැදිහත්වීම හා එකී ජන සමාජය පිළිබඳ ඔහු තුළ තිබූ මානව දයාවීය භාවයෙහි රුව ගුණ විමසනු පිණිස අප, ජයන්ත චන්ද්‍රසිරි නම් කෘතහස්ත නිර්මාණකරුවා හමු වූයෙමු. අග්නිදාහය, ගරිල්ලා මාර්කටිං, සමනල සංධ්වනිය, ඍරසරප, මහරජ ගැමුණු හා මිදුණු විශ්වය ආදී දෙස් විදෙස්හි සම්මානයට පාත්‍ර වූ චිත්‍රපට නිර්මාණය කළ ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ වරයෙකු මෙන්ම ශ්‍රී ලාංකේය ටෙලි නාට්‍ය කලාවේ කඩඉම් කිහිපයක් සළකුණු කළ වෙද හාමිනේ, දඬුබස්නාමානය, වෙස් මුහුණ, අකාල සන්ධ්‍යා, රැජන, සතර දෙනෙක් සෙන්පතියෝ හා නන්නත්තාර ආදී වූ සම්මානනීය හා අතිශය ජනප්‍රිය වූ ටෙලි නාට්‍ය හා අත්, මෝරා, ඔත්තුකාරයා හා හංකිති දහතුන යන සම්මානනීය වේදිකා නාට්‍ය නිර්මාණය කළ ජයන්ත චන්ද්‍රසිරි, දිවයින පුවත්පතේ සිටි ප්‍රධාන කතෘ හා ප්‍රවීණ මාධ්‍යවේදියෙකු වෙයි. මේ ඔහු හා සංවාදයේ සංශිප්තයයි.**

විජය කුමාරතුංග මහතා පිළිබඳව මට අදහස් ගණනාවක් තිබෙනවා. දේශපාලකයකු, නළුවෙකු, ගායකයෙකු, හා කථිකයෙකු වශයෙන්. ඒ වුනාට ඒ සියල්ලටම වඩා අර බොහෝ දෙනා කියන පරිදිම මටත් තියෙන්නේ විජය පිළිබඳව අති මානුෂික සම්බන්ධයක්. ඔහු කොතරම් දුර්ලභ ගණයේ මනුෂ්‍යයෙක් ද කියන එක වටහා ගන්න මම දැන් මෙතනින් පටන් ගන්නම් මේ කතාව. ඒ මෙහෙමයි. එක්දහස් නවසිය අසූ ගණන්වල මුල භාගයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකට කැඩුණා. එතකොට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කරල තිබුණේ, ජේ ආර් ජයවර්ධන. නමුත් තවදුරටත් ඇයයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාව වශයෙන් භූමිකාව ඉෂ්ට කළේ. ඒ කාලයේ විශාල බෙදීමක් ආවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. මෛත්‍රීපාල සේනානායක, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජ්‍ය නායකයා හා මැතිනියගේ පුතා, අනුර බණ්ඩාරනායක. ඒ දෙන්නා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැරදා වෙනම පැත්තකට ගියා. ඒ අවස්ථාවේදී නීතිමය වශයෙන් මැතිනියගේ පැත්තට පක්ෂයේ නම හම්බ වුණොත් නැහැ. ඩාර්ලි පාරේ මූලස්ථානය හම්බ වුණොත් නැහැ. පක්ෂයේ පත්තරය වූ "දිනකර" පුවත්පත හම්බ වුණොත් නැහැ. සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ කණ්ඩායමේ හිටියේ ප්‍රධාන වශයෙන් එතුමියයි, විජයයි, චන්ද්‍රිකා මැතිනියයි, ඉලංගරත්න මහත්මයයි. මේ කාලේ මල්ටි ෆැක්ස් ආයතනයෙන් වමට බර පුවත්පතක් පටන් ගත්තා. එහි නම "ඉරිදා". එහි කර්තෘවරයා වුණේ අභාවප්‍රාප්ත කිත්සිරි නිමල් ශාන්ත මහතා. එතුමා පසුකලක දිවයින පුවත්පතේ විශේෂාංග කර්තෘවරයා විදියට හිටියා. දිනපතා ලක්බිම පුවත්පතේ කර්තෘවරයා වශයෙනුත් වැඩ කළා. ඒ අවස්ථාවේදී තමයි එතුමා අභාවප්‍රාප්ත වුණේ. මල්ටි ෆැක්ස් ආයතනයේ පටන්ගත්තෙ "ඉරිදා" කියන පුවත්පතේ කර්තෘ වුණේ කිත්සිරි. එහි උප කර්තෘවරු වූයේ මමයි, හිටපු දිවයින ප්‍රධාන කර්තෘ අනුර සොලමන්ස් මහතායි. මුළු කර්තෘ මණ්ඩලයම අපි තුන්දෙනා විතරයි. නිදහස් ලේඛකයෝ ගොඩක් අපිට හිටියා. වික්ටර් අයිවන්, සයිමන් නවගත්තේගම, සිරිලාල් කොඩිකාර, සුනන්ද දේශප්‍රිය, දයාන් ජයතිලක ආදී වශයෙන් ඒ කාලෙ හිටිය ප්‍රබුද්ධ ලේඛකයෝ ගණනාවක් සම්බන්ධ වුණා. හැරිස් හුළුගල්ල මහතා අපේ ආයතනයේ ප්‍රධානියා. එතුමා කිව්වෙ කවුරු විවේචනය කළත් ප්‍රශ්නයක් නැහැ, ජේ ආර් ජයවර්ධන ජනාධිපතිතුමා විවේචනය කරන්ඩ යන්ඩ එපා කියලා. ඒක අපිට අනිටු ඵල විපාක දෙන දෙයක් වෙන්න පුළුවන් ඒක කරන්ඩ එපා කියලා. මොකද, මේ ආයතනයේ පත්තර ගොඩක් තිබුණා. සිත්තර, සත්සිරි චිත්‍ර කතා පත්තරයක් වගේම කුමරි, සිත්සර ආදී වශයෙන්. ඒවට යම් කරදරයක් වෙන්න පුළුවන් මෙයාව තරහ කර ගත්තොත් කියලා. "ඉරිදා" පුවත්පත තමයි එකම දේශපාලන පුවත්පත. අනික මං කියන්නම ඕනේ, හුළුගල්ල මහතාගේ අරමුණ වුණේ, ඇත්ත වශයෙන්ම එයාගෙ යටි අරමුණ වුණේ, සිරිමා මැතිනියගේ කණ්ඩායමට උදව් කිරීමයි. සාමාන්‍යයෙන් ඔබ දන්නවා ලංකාවේ විතරක් නෙමෙයි ලෝකෙම වුණත්, පත්තර අයිතිකාරයන්ගේ අදහස් යම් ප්‍රමාණයක් පත්තර නියෝජනය කරනවා.

මහා ලොකු නිදහස් කියන පත්තර ඔක්කොම එහෙම තමයි. ඉතින් අපේ පත්තරෙත් සිරිමා බණ්ඩාරනායක, විජය, චන්ද්‍රිකා යන මේ කණ්ඩායමට යම් පක්ෂපාතිත්වයක් දැක්වුවා. මොකද ඒගොල්ලන්ට පත්තරයක් තිබුණෙත් නැහැනේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිල පුවත්පත "දිනකර" අර කණ්ඩායමට ගිය නිසා. නමුත් ඒකෙන් අදහස් කරන්නේ නැහැ, අපි ඒගොල්ලන්ගෙම මතය උඩ කටයුතු කළා කියලා. අපි මෛත්‍රීපාල සේනානායක මහත්තයා හා අනුර බණ්ඩාරනායක මහත්තයාවත් ඉන්ටවිව් කරලා තියෙනවා පත්තරය සඳහා. මං කියන්න යන්නේ අපි වැඩි සම්බන්ධකම් පැවැත්වූයේ මේ කණ්ඩායම එක්ක. ඒ අයගෙනුත් අපි වැඩිය ඇසුරු කළේ විජය. මොකද විජය තමයි අපිත් එක්ක ළඟ සම්බන්ධතාවකින් කටයුතු කළේ. නමුත් විජය අපිට කිසිම දවසක කියලා නැහැ, අර විදිහට කරන්ඩ, මේක දාන්ඩ ආදී ලෙසින් කිසිම දවසක කියලා නැහැ. මට මතකයි එයා අනුර බණ්ඩාරනායක ගැන පල වූ ඉන්ටවිව් එක දැකලා ඒක හුඟක් අගය කළා. ඒ කාලේ මේ අය තරහයි, දේශපාලන වශයෙන්. නමුත් විජය කවදාවත් හුළුගල්ල මහත්තයටවත් කිව්වේ නැහැ, ප්‍රතිවිරුද්ධ දේශපාලන අදහස් දාන්ඩ එපා කියලා. නමුත් මට මතකයක් තියෙනවා එකම එක අවස්ථාවක විජය මගෙන් ඉල්ලීමක් කළා. එක දේශපාලනඥයෙක් ඉන්නවා, එයා හිරෙන් නිදහස් වෙලා ඇවිල්ලා ඉන්නේ, එයාව පුළුවන්නං ඉන්ටර්වීව් කරන්න කියලා. ඒ මහින්ද විජේසේකර මහතා. වර්තමාන බලශක්ති ඇමති කාංචන විජේසේකරගේ පියා. විජයගේ ගෙදරදී තමයි මම ඒ ඉන්ටවීව් එක කරේ. එතකොට මට මතකයි, මම මහින්ද විජේසේකර මහතාව ඉන්ටවිව් කරනකොට තේ ගෙනත් දුන්නේ විජය. මම කියන්නේ මේ ඔහු ගැන මට මේ හැඟීම එන්නේ ඒකයි. එය ඔහු කළේ අව්‍යාජව. ඒ ඔහුගේ හැටි. විජයට මට හරි ආදරයක් තිබුනා, නළුවෙක් වශයෙන්. දෛවෝපගත සිද්ධියකුත් තියෙනවා. මගේ ආශාව සිනමාකරුවෙක් වෙන්ඩනෙ. ඒත් අපි දෙන්න කවදාවත් සිනමාව ගැන කතා කරලා නැහැ. අපිට එහෙම අවස්ථාවක් යෙදුනෙත් නැහැ. ඒ දවස්වල මම තමයි වාමාංශික පිලේ අය ඉන්ටවීව් කළේ. දක්ෂිණාංශික දේශපාලනඥයන්ව ඉන්ටවීව් කළේ අනුර සොලමන්ස්. පත්තරය සමබර වීම සඳහා, ඒ කාලේ රජයෙන් ඉන්ටවිව් එකක් සහ වාමාංශික එකක් යනවා.

ජී.අයි.ඩී. ධර්මසේකර, රෝහණ විජේවීර, ලොකු අතුල හෙවත් නිමලසිරි ජයසිංහ, චන්ද්‍රිකා කුමාරණතුංග, වාසුදේව නානායක්කාර, ටී බී ඉලංගරත්න ආදී අය මමයි ඉන්ටර්විව් කළේ. ඉතින් අපිට තිබුණනේ නීතියක් ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිව විවේචනය කරන්න එපා කියලා. දවසක් අපිට එතුමාව වැරදිලා විවේචනය කෙරුණා. (නාහෙට නාහන අපේ තරුණ කාලෙනේ* මොකක්ද සිද්ධියක් අළලා ඉතා තදබල ලෙස විවේචනය කෙරුනා. ඒක දැකලා විරුද්ධ පක්ෂ කට්ටියම කෝල් කර කර අපිව අගය කළා. ඉතින් අපි දන්නේ නැහැ ජයවර්ධන මහත්තයාගෙන් බලපෑමක් ආවද කියලා, හැබැයි හුළුගල්ල මහත්තයා අපේ පත්තරේ නැවැත්තුවා.

අපිව අස් කරලා වෙන කට්ටියක් ගත්තා නෙවෙයි, මුලු පත්තරේම නැවැත්තුවා. පස්සේ තමයි අපි දැනගත්තේ කුමරි, සිත්තර වගේ අනිත් පත්තරවල ආරක්ෂාවට තමයි අපේ පත්තරය නැවැත්තුවේ කියලා. කඩදාසි කෝටා එක කැපීමේ ප්‍රශ්නයක් තිබුණා. ඉතින් මේවා ආරක්ෂා කරගන්ඩ අපේ පත්තරේ නැවැත්තුවා. පත්තරේ වහපුවාම අපි නිකං පැන්ෂන් ගිය පොලිස්කාරයෝ වගේ වුණා. දැන් අපිට හිතාගන්න බෑ අපි මොකද කරන්නේ කියලා. අපිට එහෙම ලොකු අත්දැකීමකුත් තිබුණේ නැහැනේ පත්තර කලාවේ. අපි දැන් මොකද කරන්නේ කියන ගැටලුවට මුහුණ පාල ඉන්නවා. පත්තරේ නවත්තලා කියලා දැන් හැමතැනම ආරංචි පැතිරුණා. අපි පත්තරේ ඉන්න කාලේ අපි උදව් කරපු කිසි කෙනෙක් අපිට කතා කළේ නෑ. කිසි කෙනෙක් අපිට කතා කරල ඇහුවෙ නෑ මල්ලි මොකද වුණේ කියලා.

ඔහොම ඉන්නකොට අපේ ලෑන්ඩ් ෆෝන්එකට කෝල් එකක් ආවා. මං තමයි කෝල්එක ගත්තේ. කිත්සිරිවත්, අනුරවත් උනන්දු වුණේ නෑ ෆෝන්එක උස්සන්නවත්. එතරම් කළකිරිලා හිටියේ. මම ඉස්සුවා ෆෝන්එක. ඒ විජය. විජය ඒ වෙලාවෙයි දැනගෙන තියෙන්නෙ ආරංචිය. විජය තමයි අපිට කතා කරලා අහපු එකම කෙනා, මල්ලී උඹලට මොකද වුණේ කියලා. ඒ විතරක් නෙවෙයි, මගෙන් මොකක්ද කෙරෙන්න ඕන කියල අහපු එකම කෙනා. මං කිව්වා, විජය අයියා, දැන් කරන්න දෙයක් නෑ පත්තරේ වහල තියෙන්නේ. කවුරුවත් ෆෝන් එකටවත් ආන්සර් කරන්නෑ කියලා. ඒක අහපු ඔහු කාටවත් දොස් කීවේ නැහැ. ඔහු කිව්වා උඹලා වරෙල්ලා මාව හම්බෙන්න කියලා. එහෙම කියලා අපිට ඔහුව හම්බ වෙන්ඩ වෙලාවක් දුන්නා. ඒ කියපු දවස වෙනකොට කිත්සිරි අසනීප වෙලා හිටියේ, කහ උණ හැදිලා. ඔහු එතකොට ගමේ ගිහිල්ලා හිටියේ, මේ මාතර පැත්තේ. අනුර සිටියේත් නැහැ, මම තනියම ගියා ඔහු හමුවෙන්න, අර කියපු දවසේ. මට අද වගේ මතකයි, එදා මා ළඟ එක්තරා පින්තූරයක් තිබුණා, එදා යද්දි. මට මතක විධියට පින්තූරයේ හිටියේ ක්‍රිකට් ක්‍රීඩකයන් වන රෝයි ඩයස්, බන්දුල වර්ණපුර සහ විජයයි. මම කතා කර කර ඉද්දි ඔය පින්තූරය මම විජයට පෙන්නුවා. විජය එදා පුදුම ආසාවකින්, අනේ මල්ලි මේක මට දියන් කිව්ව. ඔහු ජනප්‍රිය නළුවෙක්නේ, නමුත් ඔහු පොඩි ළමයෙක් වගේ පින්තූරය මඟින් ඉල්ල ගත්තා.

ඔහු මට යෝජනා කළා අපි වෙන පත්තරයක් පටන් ගමු කියලා. ඒක අපේ පක්ෂයේ පත්තරය කියලා කියන්න අවශ්‍ය නැහැ, ඕගොල්ලෝ වාමාංශික පුවත්පතක් වශයෙන් කරගෙන යන්න කියලා ඔහු සූදානම් වුණා පුවත්පතක් පටන් ගන්න. ඉතින්, අපේ ප්‍රධාන කර්තෘවරයා වන කිත්සිරි ඒ වනවිට බලවත් ලෙස අසනීපෙන් හිටපු නිසා ඔහුට එන්ඩ බැරි වුණා. ඒක නිසා අපි ටිකක් බලාගෙන හිටියා ඔහු සනීප වෙලා එනකන්. ඔය අතරෙ තමයි, අපිට දිවයින පත්තරෙන් කතා කරන්නේ. අජිත් සමරනායක තමයි එය සම්බන්ධීකරණය කළේ. ඉතිං අපිට රැකියා ප්‍රශ්නය බලවත්ව තිබුණු නිසා අපි දිවයින පත්තරයට බැඳුණා. එතකොට දිවයින පත්තරය බොහෝ ජනප්‍රියව පැවතුණා. මට කියන්නට අවශ්‍ය වුණේ විජයගේ ගුණවත්කම ගැන මම අත්දැකපු අවස්ථාවක්. තව සිද්ධියක් මට මතක් වෙනවා මේ වෙලාවේ, දවසක් මම, කිත්සිරි සහ අනුර, පුවත්පතට චන්ද්‍රිකා මැතිනිය ඉන්ටවීව් කිරීම සඳහා ඇය අපට දුන් වෙලාවට විජයගේ ගෙදරට ගියා.

අපි කියපු වෙලාවට විජේගේ ගෙදරට යනකොට, ගෙදර සිට විජය එළියට යනවා අපිට මුණ ගැහුණා. ඊට පස්සේ අපි චන්ද්‍රිකා මැතිනිය එනකං පහළ සාලයට වෙලා සෑහෙන වෙලාවක් බලාගෙන හිටියා. මං හිතන්නේ පැයකටත් අධික වේලාවක්. සෑහෙන වෙලාවකට පස්සෙ විජය ආපසු නිවසට පැමිණියා. ඒ එනකොටත් අපි පහළ සාලෙ ඉඳගෙන ඉන්නවා. මට හොඳට මතකයි, ඒ වෙලාවේ විජය සමග දයා අල්විස් සහ යූ ආරියවිමල් යන රංගන ශිල්පීන් දෙදෙනාත් පැමිණියා. විජය අපිව දැකපු ගමන්, මල්ලි මොකද තවම ආවේ නැද්ද කියලා ඇහුවා. එහෙම අහලා චන්ද්‍රිකා කියලා මහ හයියෙන් කෑගැසුවා. මොකද කරන්නෙ මිනිස්සු රස්තියාදු වෙනව මෙතන කියලා දෙදරන්න කෑගැහුවා පහළ ඉදන්. මට මතකයි ඊට පස්සේ චන්ද්‍රිකා මැතිනියම අපට තේ තුනකුත් අරගෙන පහළට ආවා.

අපි දිවයින පත්තරේ රැකියාවට ගියාට පස්සේ විජය සමඟ ලොකු ඇසුරක් තිබුණෙ නැහැ. නමුත් ඔහු අපිව දැක්ක තැන ළඟට පැමිණ කතා කරන්න තරම් නිහතමානි වුණා. ඒක නම් මට අදහාගන්නත් බෑ. අපි කවුද ඒ කාලේ? මට මතකයි, මම "අත්" නාට්‍ය හදපු වෙලාවේ, 1985 විතර. චිත්‍රපට වශයෙන් සහ දේශපාලන වශයෙන් විජය බොහොම කාර්යය බහුලව සිටි, එක දිගට ජනප්‍රිය නළුවා සම්මානය ලබමින් බොහෝ චිත්‍රපටි ගණනක රඟ පෑ කාලේ. මගේ "අත්" නාට්‍යයේ මංගල දර්ශනය සඳහා ආරාධනා කරනන මමයි, කමල් අද්දරආරච්චියි ඔහුව හමුවෙන්න ගියා. එතකොට අපිට නාට්‍යකාරයෝ වශයෙන් ලොකු නමක් තිබ්බෙත් නෑ. නමුත් ඔහු ආරාධනාව සතුටින් බාර ගත්තා. මල්ලි මම එනවා කිව්වා. මම හිතුවේ නෑ, මෙච්චර කාර්යබහුලව සිටින ඔහු එයි කියලා. නමුත් ඔහු ආවා ලුම්බිණියට. ආවා විතරක් නොවෙයි, නාට්‍යය බලලා සමරු කලාපය සඳහා නාට්‍යය ගැන අදහසකුත් ප්‍රකාශ කළා. ඇත්ත

**ඉතිරිය ලබන කලාපයට...**

**සංවාදය - නිමල් ෆ්‍රැන්සිස්**


## විජයගේ ඇස දිනවමු

**2022-2032**

අපේ දශකය කරගමු



**සුදර්ශන ගමගේ**
කඩුවෙල සංවිධායක
කැඳවුම්කරු
මහජන කලා සංසදය

## අපේ සුබ පැතුම්

| **අශෝක කරුණාරත්න**<br>ගල්මෝල<br>කට්ටකඩුව | E.K. Dry Fish<br>අරම්පොලවත්ත<br>මාවතගම | **ජයන්ත ලී බඩු වෙළඳ සැල**<br>08 කණුව, මාවතගම |
|---|---|---|



**සමන් බණ්ඩාර කස්තුරි**
ගල්ගමුව
ප්‍රාදේශීය සභා මන්ත්‍රී



**සමන් අධිකාරි**
වාරියපොල
ප්‍රාදේශීය සභා මන්ත්‍රී



**තිස්ස තෙන්නකෝන්**
හිරියාල
ආසන සංවිධායක



**අජිත් සෝමකුමාර**
මාවතගම
ප්‍රාදේශීය සභා මන්ත්‍රී



**බර්ටි නිහාල් සුසිරිපාල**
ප්‍රවීණ රංගන ශිල්පී



**නිමල් සෝමබන්දු**
කුරුණෑගල
ප්‍රාදේශීය සභා මන්ත්‍රී

## නිකවැරටිය ආසනය වෙනුවෙන් අපේ සුබ පැතුම්

හිටපු ප්‍රා.ස.ම. පී.එච්.ආර්.ගුණරත්න
එච්.එම්.පී.එස්.කේ ජයකොඩි

## විජයග්‍රාහී ගමනක නියුතු ශ්‍රී ලංකා මහජන පක්ෂයට සහ "ඇස" පුවත්පතට ශ්‍රී ලංකා මහජන කාන්තා සම්මේලනය වෙනුවෙන් සුබ පැතුම්!



**සමන්තිකා ලක්මාලි**
ප්‍රධාන සංවිධායිකා
කලවාන ආසනය
කලවාන ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී



**සන්ධ්‍යා ද මෙල්**
සභාපති
ශ්‍රී ලංකා මහජන කාන්තා සම්මේලනය



**තිලක්ෂි නිමන්ති පීරිස්**
කළුතර දිස්ත්‍රික් කළමනාකරු



# පියකු දෙවියකු ලෙස නික්ම ගිය "මනුස්සකම"

වයඹ පළාතේ ඇතුගල් පුරය වෙත
පැමිණියෙ ගල්ගමුව වැව් බැදි පෙදෙසින්ය
අවිහිංසක සිනාවක් නිතරම මුව රැඳිය
දුප්පත් මිනිසාට දැසම දිගු කළෙය

නිවහනෙ දොරටු ඇරුනේ නැතිබැරි අයට
සවන් යොමුවුනේ නැති පොඩි මිනිසාට
විකසිත සිනාවෙන් මිනිසත් හද යසට
ඇඟද බැද තබාගති යහගුණ පිරි බසට

ඉගෙනුම සපල කරදුනි දරුවන් කැලට
අතහිත ලබා දුන්නා පෙරදා සැමට
ගම්බද පුංචි පාසල්වල සිටි අයට
දෙවියන් විසින් ආවා මනුසත් ලොවට


සෙනෙහෙන් වදන් මුමුනන්නට නොහැකි වුනා
පිරිපුන් සිනාවක් ගණදුරෙ මැකී ගියා
ලෝ හැම සතට බුදු දහමෙහි අගය කියා
මනුසත් ගුණෙන් පිරි විරුවෙක් නික්ම ගියා

පක්ෂය ගොඩ ගන්න දහදිය මුතු වපුරා
දිව රෑ දෙකේ හද පත්ලෙන් වෙහෙස වුනා
නැතිබැරි අයට නව ලෝකයෙ දොර ඇරලා
දෙනුවන් පියව ගියෙ කම්කරු දිනයෙ එදා

**ශ්‍රී ලංකා මහජන පක්ෂයේ**
**හිටපු නායක දිවංගත**
**ආචාර්ය රංජිත් නවරත්න**
**ශ්‍රීමතාණන් පිළිබඳව**
**මතකය ඉතාමත් ගෞරවයෙන්**

**සුනිලා රංජනී මල්කාන්ති**
ආචාර්ය රංජිත් නවරත්න සහෘද සංසදය වෙනුවෙන්

# ඇස බැබලේවා



රට රැක ගන්න හැඟුමෙන් දහවල ද රැයේ
නාඹුල් පුවත් ලිපි පළකොට නොසිට බියේ
**ඇස** පත්තරය මුර සෙබලෙකු වැනිව දැයේ
සිදු කළ මෙහෙය මට තවමත් මතක තියේ

**සිංහල මහාජන පක්සෙන්** එඩිය විදා
**රංජිත් නවරත්ත** මැති අවදියෙහි එදා
රට වෙනුවෙන් නැඟුව හඬ සවි බලය යොදා
අමතක නොවන්නකි හැම කෙනෙකුටම සදා

එතුමා නැවැත් වූ තැන සිට මෙහෙය එම
**ඔහු පුත් නවරත්න මැතිඳුන්** නොබිය වම
යළි ආරම්බ කරමින් එඩිතරව ළැම
**ඇස පත්තරය** බැබලෙනු ඇත සිහළ බිම

පත්තර කලා ලෝකයෙ පෙළහර පාන
හරබර පුවත් පළකොට සවි බල ගේන
මුසපත් කරන මිනිසුන් පර ගැති දීන
**ඇස පත්තරය යළි බැබලෙන්නට ඕන**

**ආචාර්ය ගොළුවාමුල්ලේ විමලසේන**
අස්පර්ශනීයඋරුම රාජ්‍ය සාහිත්‍ය කලා කීර්ති

**ඔබගේ නිර්මාණ අප වෙත එවන්න**
esaslmp@gmail.com

# විජය නම් ඔහු...



ජන - හද දිනූ නළුවෙකි හෙළ සින මාවේ
ගන - ඳුර මැදට පහනක් විලසිනි ආවේ
දන - මන සොරා ගත් ලබමින් ජය රාවේ
පින - මදිවිය අපට රැක ගැනුමට ජීවේ

නළු - වෙකු උනත් සිටි ඔහු ඉහළම තලයේ
මුළු - රට පෑ ගෙනවා දැක අදිරද බලයේ
සුළු - කොට තකනු නොහැකිව වියසන හෙළයේ
අළු - යට ගිනි පුපුරු මතුවිය හද මැලයේ

මහ - රින් ඇරඹි දෙස් පාලන ගමන් මග
දහ - දිය මුගුරු හෙලනා ධනවතුන් ළඟ
සහ - තික වෙලා අධිරද බල බිඳදාන රඟ
මහ - ජන පක්ෂයට අත්පොත් තැබුන වග

සින - මා අඹරෙ හිනි පෙත්තට නැගි තරුව
ජන - තා මෙහෙවරට විත් ඉන් අන තුරුව
දින - දින නැගුන ජය හඬ මැද පෙර දැරිව
පින - නැහැ අපිට ඔබ ඇසුරට හෙළ විරුව

මිනිසත් - බවින් පිරි ගති ඇති උදාරම
අපටත් - මතක්වෙයි යුගයක අසීරුම
ඔබගත් - පියවරට නොගියත් රටේ හැම
හදවත් - වල තිබේ මැරුවත් ඔබේ නම

**ඇල්ලේ පතිරණ**
කලාභූෂණ රාජ්‍ය සම්මානලාභී

# විජය ධජය

කාව්‍ය ප්‍රදීප, කාව්‍ය ශ්‍රී,
**පුෂ්පා පොන්නම්පෙරුම**


ඉටු කර කලාවට සිත ඇදී රන් සීන
කළ වැඩ මහ ගොඩකි සිරිලක දැන් පේන
මැරුණත් රසික හදවත් හැර වෙන් නූන
විජයට තවම හිමිවෙයි ජන සම්මාන

රඟපෑමට මෙන් ම ගීයට කලාවට
මඟ දැන ගියා මගෙ රට ගොඩ ගැනීමට
කට හැර කියන්නට හැකි නම් අගේ කොට
සිරිලක් මව ම පවසයි අප නොකීවට

හරි ඉහළයි රිදී තිරයේ රංගනය
පිරිපුන් පෙමකි එහි පෑ ආලිංගනය
ජන හදවත්හි රැඳී ඉහළ ම වින්දනය
දිරිමත් විජය කවදත් මන රංජනය

කළ වැඩ මහ ගොඩකි සිරිලක ඇතෙක් බර
බිම වැතිරුණා යන්නට පෙර හුඟක් දුර
සිහියට නැගෙයි අදටත් ඔහු නොයෙක් වර
විජයට ඇරේවා දොර'ගුලු නිවන්පුර

# ජාතික නායකත්ව අර්බුදයට විජය වැන්නෙක් අවශ්‍යයි



**ඩිව්. ගුණසේකර**
සභාපති
ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය

මින් වසර 34 කට පෙර, අපෙන් සමුගත් විජය කුමාරතුංගයන් සිහිපත් වන විට, අපට දැනෙන්නේ රට තුළ පවතින ජාතික නායකත්ව අර්බුදයයි. වත්මනයේ අප මුහුණ දෙන්නාවූ ගැඹුරු, ප්‍රබලම ආර්ථික අර්බුදය හමුවේ තුනෙන් දෙකක බලයක් තිබූ විධායක බලයක් තිබූ ජනාධිපතිවරයකු බලය අත්හැර දමා රටින් පිටවී ගිය සැටි අපි දුටුවෙමු. අමාත්‍ය මණ්ඩලයද ඉල්ලා අස්වී, ව්‍යවස්ථාදායක මෙන්ම විධායක බලයත් විපක්ෂයේ තනි මන්ත්‍රී ආසනයක් තිබූ ජාතික ලැයිස්තු මන්ත්‍රී රනිල් වික්‍රමසිංහ මහතාට, අගමැති ධුරයෙත්, ඉන් පසු විධායක ජනාධිපති බලයත් බන්දේසියක ලා පිරිනැමූ හැටි අපි දුටිමු. මින් ප්‍රත්‍යක්ෂ ලෙස ප්‍රදර්ශනය වූයේ පවතින්නා වූ ජාතික නායකත්ව අර්බුදයයි.

1983-1993 අතර දශකය තුළ උතුරේ හා දකුණේ පැවැති ත්‍රස්තවාදය සහ දකුණේ ඝාතන දේශපාලනය හේතුකොට ගෙන ජාතියට, දේශපාලන ක්ෂේත්‍රයේ විශිෂ්ටයන් සහ දක්ෂයන් රැසක් අහිමි විය. විජය කුමාරතුංගයන්, ඒ අතරින් ජනප්‍රියතම විශිෂ්ටයකි. අපේ මතකයට එන සෙසු අය අතර, සරත් මුත්තෙට්ටුවේගම, ගාමිණී දිසානායක, ලලිත් ඇතුලත් මුදලි, රන්ජන් විජේරත්න, රණසිංහ ප්‍රේමදාස, ඒ අමිර්ත ලිංගම්, නීලන් තිරුචෙල්වම් ද විය. ඉන් පසු කාලයේ එම්.එච්.එම්.අෂ්රොෆ්, අනුර බණ්ඩාරනායක ඔවුනට එක්විය. එම වකවානුව තුළ නාඳුනන තුවක්කුකරුවන් අතින් මිය ගිය තරුණයන් අතර, විශිෂ්ටයින් හා දක්ෂයින් එකතු විය.

අද අප මුහුණ දෙන්නාවූ ජාතික නායකත්ව අර්බුදයට හේතුව ඉකුත් කාලයේ පැවැති ම්ලේච්ඡ ඝාතන දේශපාලනයයි.

විජය කුමාරතුංග සෘජු හා ක්‍රියාකාරී දේශපාලනයට පිවිසියේ 1977 මහ මැතිවරණයේදීය. එහෙත් ඔහුගේ දේශපාලනය ඉන් ඈතට දිව යයි. සම සමාජ පක්ෂයේ තරුණ ව්‍යාපාරයෙන් පෝෂණය වී, තම මාමා වූ විශේෂඥ වෛද්‍ය කාලෝ ෆොන්සේකාගේ ඇසුරෙන්, සමාජ සාධාරණත්වය උදෙසා දේශපාලන සටන් බිමට පිවිසි බවද අප දනිමු. චිත්‍රපට තුළින් රංග ශිල්පියකු බවට පත්වූ ඔහු ජනප්‍රියතාවෙන් දෙවැනි තැන ගන්නේ ගාමිණී ෆොන්සේකාට පමණය.

1982 ජනාධිපතිවරණ සටන් බිම තුළ ඔහු ජාතික දේශපාලනයේ ජනප්‍රියතම දේශපාලනඥයා බවට පත්විය. හෙක්ටර් කොබ්බෑකඩුවගේ එම ජනාධිපතිවරණයේදී ඔහුගේ භූමිකාව හේතු කොට ගෙන උතුරේ සහ නැගෙනහිර ජනතාවගේ ඡන්දය කොබ්බෑකඩුවට ලබා ගැනීමට හැකිවිය.

විජය අකාලයේ කුරිරු ලෙස ඝාතනයට ලක්වීමට හේතු වූයේ, ඔහු ප්‍රදර්ශනය කළ දේශපාලන නායකත්වයයි. ජාතික සමගිය, ආගමික සහජීවනය, වමේ සමගිය, වෙනුවෙන් ඔහු කැප වූ මෙහෙවරක් ඉටු කළේ මූලිකත්ව සමාජ සාධාරණත්වය උදෙසාය. ඉන් ප්‍රදර්ශනය වූයේ ඔහුගේ මිනිස්කමයි, සහෝදරත්වයයි.

විජය ක්‍රියාකාරී දේශපාලනයේ නියැලී සිටියේ 1977-1988 දක්වා වූ වසර එකොළහක තරම් කෙටි කාලයකි. එතරම් කෙටි කාලයක් තුළ ජනතාවගේ හද දිනාගැනීමට සමත් වූ තවත් අයෙකු දේශපාලනයේ සිටියේ නැති බව මගේ පිළිගැනීමයි.

විජය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එක්වන්නේ, බොහෝ විට චන්ද්‍රිකා කුමාරතුංගගේ ඇසුරෙනි. දෙදෙනාගේ විවාහයෙන් පසු, විජය චන්ද්‍රිකා චරිත දෙක රටේ දේශපාලනය වෙනස් කරලීමට බලපෑහ. දේශපාලන මතභේද උඩ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉවත්ව, ශ්‍රී ලංකා මහජන පක්ෂය පිහිටුවාලීමත්, ඉන් පසුව මහජන පක්ෂය රටේ සෙසු ප්‍රධාන වමේ දේශපාලන පක්ෂ සමග සන්ධාන ගතවී, එක්සත් සමාජවාදී පෙරමුණේ පිහිටුවීම, ඔහුගේ අකල් මරණය ළංකර ගැනීමට හේතු වූ බව කිව හැකිය.

1988 පෙබරවාරි 16 දින උදේ 10.00ට නියමිතව තිබුණේ එම එක්සත් සමාජවාදී පෙරමුණ පිහිටුවීමටය. එය සමාජගත කිරීමට නියමිතව තිබුණේ 1988 පෙබරවාරි 21 දිනය. නායකයින් සිය අත්සන් තැබීමේ දින උදේ 10.00 වීමට පැය ගණනකට පෙර, විජය ඝාතනයට ලක් විය. නව සන්ධානය පිහිටුවීම වළක්වාලනු ලැබීය. එය වළක්වාලීමට තිබූ එකම ක්‍රමවේදය ඝාතනයයි. එය සිදුවිය.

විජය පසුපස නාඳුනන තුවක්කුකරුවන් ලුහුබඳින බව පොලිසියේ හෝ හමුදාවේ බුද්ධි අංශ ජාතික ආරක්ෂක අමාත්‍ය ලලිත් ඇතුලත්මුදලි මහතා වෙත දැනුවත් කළ විගස, එම තොරතුරු සැනෙන් මා වෙත ලබාදුන්නේ පෞද්ගලිකව පාර්ලිමේන්තු සභාගර්භයේදී ආරක්ෂක ඇමති විසින්මය.

වහාම ක්‍රියාත්මක වූ මා විජය කැඳවා අවශ්‍ය ආරක්ෂක පියවර ගනු ලැබීය. වහාම චන්ද්‍රිකා ද පෞද්ගලිකව දැනුවත් කිරීමට මා ප්‍රමාද නොවීය. ගතවූයේ සතියකි. විජය මට ඉන්පසු හමුවූයේ මළ ගෙදරක දීය. ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ පොළොන්නරුව දිසා ලේකම් නීතීඥ ගාමිණී මැදගෙදර නොහඳුනන තුවක්කුකරුවන් විසින් ඝාතනය කරන ලදුව දේහය සීදුව නිවසට ගෙනෙන ලදුව, විජය එහි ගොස් සිටියේය. එදින ද මා ඔහුට අවවාද කළේ ප්‍රවේසම් වන ලෙසය. ගතවූයේ පැය කීපයකි. ඔහු ඔහුගේ ගෙදර මිදුලේ දීම ඝාතනයට ලක් විය. අද විජය ශාරීරිකව අප සමඟ නොවූවද ඔහු සමාජය සහ දේශපාලනය තුළ සාමූහිකව සිදු කළ බලපෑම දහහත් වසරක සාපය වූ යූ.එන්.පී. පාලනය වෙනස් කරලීමට 1994 දී අපි සමත්වීමු.

ඉන් බිහිවූ පොදු පෙරමුණ සන්ධානය පසුව ව්‍යාප්ත වී විවිධ නම්වලින් හැඳින්වූවද දේශපාලන කරලියේ වැජඹුනේ එම සන්ධාන දේශපාලනයයි.

2019 දී තුනෙන් දෙකක බලය ලබා ගත්තේ, යථෝක්ත සන්ධාන දේශපාලනයයි. ඊට කණ කොකා හඬන්නට පටන් ගත්තේ 2019 සිට යළි බලයට පැමිණීමෙන් පසුවය. 2022 දී බලය අහිමිව යළි බලය ප්‍රතිගාමීන්ට පවරාදීමට සිදුවිය. එසේ වූයේ ජාතික නායකත්ව අර්බුදය හේතුකොට ගෙනය.

මෙහ දී අප උගත යුතු පාඩම (උගත් පාඩම) සන්ධාන දේශපාලනයේ හිතකර පැතිකඩයි. විජයගේ සන්ධාන දේශපාලනයෙන් ඉවත්වූ සැනින්, පොහොට්ටුවට කණ කොකා හැඬීමට පටන් ගත් බව, විජය සැමරුමේ දී මතක්කර දිය යුතුව ඇත.

ඝාතන දේශපාලනයත් සමඟම, එතෙක් පැවැති දේශපාලන සංස්කෘතිය ක්ෂයවී ගිය බව කිව හැකිය. වරදාන - ප්‍රතිලාභ දේශපාලනය ආදේශ කරනු ලැබීය.


විජය වැනි අවංකභාවයේ ප්‍රතිමූර්ති සමාජයෙන් ගිලිහී යෑම, වත්මන් අර්බුදයට බලපෑ තවත් හේතුවකි. විජය අපගෙන් සමුගෙන් වසර 34 ක් ගත වුවද අපට දැනෙන්නේ ඔහු අපත් සමඟ තවමත් ජීවත්වන බවයි.

**සටහන - නිහාල් අකුරුගොඩ**



**විජයග්‍රාහී ගමනක නියුතු ශ්‍රී ලංකා මහජන පක්ෂයට සහ "ඇස" පුවත්පතට මාගේ හෘදයාංගම සුභ පැතුම්**

**ඩබ්. ලසන්ත සම්පත්**
ප්‍රධාන සංවිධායක අක්මීමන ආසනය
සමග ගාල්ල දිස්ත්‍රික් ජනතාව
ශ්‍රී ලංකා මහජන පක්ෂය



**අපේ චින්තනය - විජය චින්තනය**
**අපේ පිළිවෙත් - විජය පිළිවෙත්**
**අපේ අරමුණ - විජයග්‍රහණයයි**

**හේමලාල් ජයසිරි**
නියෝජ්‍ය සභාපති
සංවිධායක - මහරගම ආසනය
ශ්‍රී ලංකා මහජන පක්ෂය

## දිවිසර සම්මානයෙන් කලාකරුවන් ඇගයේ

අගනුවර සමාජ සංවර්ධන පදනම විසින් සංවිධානය කරන ලද 36 වෙනි දිවිසර උත්තම සිත්තම් ප්‍රණාම ඇගයීමේ උලෙළ පසුගියදා හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ මහජන පුස්තකාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත්විනි.

මෙහිදී සිය ක්ෂේත්‍රයන්හි ඇගයීමට ලක්නොවුනු දක්ෂ හා කීර්තිමත් කලාකරුවන්, සමාජ සේවකයන්, රාජ්‍ය නිළධාරීන් හා ව්‍යාපාරික පිරිසක් ගෞරව සම්මානයට පාත්‍රවිය.

මෙම උත්සවය එම පදනමේ සභාපති නාට්‍ය ශිල්පි, මහජන පක්ෂ අවිස්සාවේල්ල සංවිධායක මහේෂ් කුමාරසිංහ මහතා විසින් සංවිධානය කරන ලද අතර, ඒ සඳහා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී තිලංග සුමතිපාල මහතා, හිටපු පළාත් සභා මන්ත්‍රී විජිත් විජයමුණි සොයිසා මහතා ඇතුළු සම්භාවනීය පිරිසක් සහභාගී වී සිටියහ.



# විජය එක්ක යාපනේ ගියපු ගමන

## ඓතිහාසික මතකයක්



විජයගේ පැමිණීම යාපනය බොහොම උණුසුම් සිනාවෙන් පුරවන සිදුවීමක් වෙලා තිබුණා. විජයගේ ජනප්‍රියත්වය සහ ඔහුගේ මිත්‍රශීලී සිනාව නිසා විශාල පිරිසක් විජය දකින්නට පැමිණ තිබුණා.



මගේ දේශපාලන ගමන පටන්ගන්නේ මගේ ළඟම හිතවතා විජය කුමාරතුංග එක්ක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්. ජේ.ආර් ජයවර්ධන ආණ්ඩුව විසින් සිරිමාවෝ මැතිනියගේ ප්‍රජා අයිතිය අහිමි කරලා තියන වෙලාවේ ජේ. ආර්. ප්‍රසිද්ධියේ ඇහුවේ ‘අශ්වයත් ඉන්නවා - ජොකියත් ඉන්නවා, කෝ අත?’ කියලා. ඒ වෙලාවේ විජය, මම, ඔසී මැදිහත් වෙලා තමයි හෙක්ටර් කොබ්බෑකඩුව මහත්තයා මැතිවරණයට ගෙනාවේ. ඔහුගේ පළවෙනි රැස්වීම පැවැත්වුණොත් මගේ ආසනයේ දී. පස්සේ අපි ලංකාව පුරාම එතුමා එක්ක මැතිවරණ ප්‍රචාරණයේ නිරතවුණා. ඒ දවස්වල අපි යාපනේ සුභාෂ් හෝටලයේ සාකච්ඡා පැවැත්වූ කෘෂිකර්මය සම්බන්ධයෙන් අපි දක්වපු ප්‍රතිපත්ති නිසා යාපනයේ ජනතාවගෙන් අපිට පුදුමාකාර ජනප්‍රසාදයක් ලැබුණා. විවෘත ආර්ථිකයත් එක්ක ඉන්දියාවෙන් බඩු ලංකාවට ඇවිත්, යාපනේ ගොවීන්ගේ සහ ව්‍යාපාරිකයන්ගේ ආර්ථිකය බිංදුවට වැටිලා තිබුණේ. ඒ නිසා ඒ වෙලාවේ කොබ්බෑකඩුව මහත්මයා වෙනුවෙන් උතුරේ හොඳ ජන බලයක් තිබුණා.

එදා කුමාර් පොන්නම්බලම් ප්‍රතික්ෂේප කරලා දකුණේ සිංහල අපේක්ෂකයාට උතුරේ මිනිස්සු ඡන්දය දෙන තැනට පත්වෙන්නත් විජය කුමාරංතුංගගේ මැදිහත්වීම ප්‍රධානම හේතුවක් වුණා. එදා පළාත් සභා ක්‍රමයට අපේ කොන්දේසි සහිත එකඟවීමක් එක්ක මැදිහත් වෙද්දි විජය එතන හිටියා. ඒත් ඒ පළාත් සභා ක්‍රමය සම්බන්ධයෙන් අපේ යෝජනා ඉක්මවලා කටයුතු කරපු නිසා අද වෙද්දි පළාත් සභා සුදු අලියෙක් බවට පත්වෙලා.



ෆීලික්ස් පෙරේරා
හිටපු අමාත්‍ය


එදා ජේ.ආර් ජයවර්ධන ආණ්ඩුව විජය සහ මම ඇතුළු පිරිසට නැක්සලයිට් චෝදනා එල්ල කරලා සිරිගත කරලා දැඩි දුක් වේදනා දුන්නා. පහු කාලීනවත් අපිට විවිධ හිරිහැර කරන්න කටයුතු කළත් අපේ බැඳියාව සහ දේශපාලන භාවිතය වෙනස් වෙන්නේ නෑ. මමත් විජයත් පොඩිකාලේ ඉඳලම යාළුවෝ. අපි දෙන්නා පැසැල් යන්නේ බයිසිකල්වලින් එකට, ඒ කාලේ අපි විනෝද ගමන් යනවා, සෙල්ලම් කරනවා. විජය කියන්නේ බොහොම සුන්දර මනුස්සයෙක්. මුලින්ම විජය වෙනුවෙන් මම පෙනී හිටියේ කටාන අතුරු මැතිවරණය අවස්ථාවේ. ඒ වෙලාවේ දැඩි රාජ්‍ය මර්දනයක් තියෙද්දි, ජීවිත අවදානමක් තියෙද්දි, අපි විජය වෙනුවෙන් පෙනී හිටියේ ඔහුගේ තිබුණු මානව හිතවාදිත්වය නිසා තමයි.

එදා උතුරේ ප්‍රශ්නය ඉතා දරුණු තැනට පත්වෙමින් තිබියදී හමුදා සෙබළුන් ගණනාවක්ම එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් ග්‍රහණයේ පසුවුණා. ඒ මව්පියන් එදා මාත් එක්ක සාකච්ඡා කරද්දි අපේ ඉල්ලීම යොමුවුණේ විජයගේ පැත්තට. එදා විජය ඉතා නිර්භීතව තීරණය කළා උතුරට ගිහින් එල්.ටී.ටී.ඊ ය සමඟ සාකච්ඡා කරන්න. දකුණේ කිසිම නායකයෙක් උතුරට යනවා තබා ඒ ගැන හිතන්නටත් බිය කාලයක විජය, මම, ඔසී උතුරට ගිහින් එල්.ටී.ටී.ඊය සමඟ සාකච්ඡා කරන්න කටයුතු කළා. එදා විජය ඇතුළු අපි කණ්ඩායම යන ගමන නවත්වන්න එ.ජා.ප ආණ්ඩුව විවිධ දේ කළා. ඒත් ඒ ගමන නතර වුණේ නෑ. අපිව පිළිගන්න එදා ආවේ එල්.ටී.ටී.ඊ දෙවැනි පෙළ නායකයන් වූ කිට්ටු, රහීම් සහ තමිල් සෙල්වම් ඇතුළු පිරිසයි. එදා විජය යාපනය පුස්තකාලය විනාශ කර ඇති අයුරු දැකලා බොහොම කම්පා වුණා.

එදා විජය එල්.ටී.ටී.ඊ බාරයේ හිටපු හමුදා සෙබළුන් දකින්නට යාම ඔවුන්ට මහත් ශක්තියක් වුණා. විජය එදා ඔවුන්ව ඉක්මණින් බේරාගන්න බවට පොරොන්දු වුණා. විජයගේ පැමිණීම යාපනය බොහොම උණුසුම් සිනාවෙන් පුරවන සිදුවීමක් වෙලා තිබුණා. විජයගේ ජනප්‍රියත්වය සහ ඔහුගේ මිත්‍රශීලී සිනාව නිසා විශාල පිරිසක් විජය දකින්නට පැමිණි තිබුණා. ඔවුන්ගේ ප්‍රතිචාර මැද විජය නල්ලූර් කෝවිල වැඳපුදාගත්තා. එදා විජය නල්ලූර් කෝවිල ඉදිරිපිට එල්.ටී.ටී.ඊ සන්නද්ධ රථයක් මතට නැග ප්‍රකාශ කළේත් ජාතිභේදයකින් තොරව ජනතාවගේ උන්නතිය වෙනුවෙන් නිබඳව කටයුතු කරන බවය. එසේම ඊළාම් සිහිනයෙන් මිදී එකම රටක් වෙනුවෙන් එකතුවිය යුතු බව ඔහු නොබියව ප්‍රකාශ කලේ එල්.ටී.ටී.ඊ ආයුධ සන්නද්ධ පිරිස් වටවී සිටියදී ය. ඒ තරම්ම විජයගේ ප්‍රතිපත්ති නිර්භීත විය. එදා පැය ගණනක් එල්.ටී.ටී.ඊ නියෝජිතයන් එක්ක කරපු සාකච්ඡාවල ප්‍රතිඵලයක් විධියට ඒ සෙබළුන් බේරාගන්නට අපිට හැකිවුණා. ඒ ඓතිහාසික කටයුත්තට දායකවන්නට ලැබීම මටත් මහත් සතුටට කාරණයක්.

අද වෙද්දි විජය අපි අතර නැතිවුණත්, විජයගේ ඝාතනයෙන් පස්සේ ඔහු නැති අඩුව කොයිතරම් තදින් මේ රටට දැනෙනවාද කියන එක පැහැදිලියි. ඒත් ඔහුගේ දර්ශනය අපි හැමදාම ආරක්ෂා කළ යුතුයි.

**සංවාදය**
**ජනරඟ විජඉඳු දේවසුරේන්ද්‍ර**






වෂී 2022ක් වූ ඔක්තෝබර් මස 09 වැනිදු ඉරිදු දින නුගේගොඩ උඩහමුල්ල, විජේරාමපාර අංක 92 හි පිහිටි සරලා අධ්‍යපන ග්‍රන්ථ ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.